# ප්‍රගති වාර්තාව 2024

# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යංශය

# වැවිලි අංශය

11 වන මහළ, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල
දුරකථනය : 011-2186160
ෆැක්ස් : 011-2186076
වෙබ් අඩවිය - http://www.plantationindustries.gov.lk

සැලසුම් අංශය
දුරකථනය : 011- 2187070 (අධ්‍යක්ෂ ජනරාල්)
ෆැක්ස් : 011 - 2187075
විද්‍යුත් තැපැල් ලිපිනය : mpiplanningdiv@gmail.com



ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමා
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය



ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මැතිතුමා
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍ය



බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා
ලේකම්
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශ

| පටුන | පිටු අංක |
|---|---|


- ❖ දැක්ම, මෙහෙවර, අරමුණු.......................................................... VII
- ❖ හැඳින්වීම.......................................................... 1
- ❖ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අනුබද්ධ ආයතන.............. 2
- ❖ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වැවිලි බෝග..................... 2
- ❖ තේ ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය .......................................................... 3-4
- ❖ රබර් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය .......................................................... 5 - 6
- ❖ පොල්, තල් හා කිතුල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය .......................................................... 7 - 10
- ❖ කුරුඳු ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය .......................................................... 10 - 11
- ❖ කජු ක්ෂෙත්‍රයේ සමස්ත ප්‍රගතිය ..........................................................12
- ❖ පැළ නිෂ්පාදන තොරතුරු .......................................................... 12 - 14
- ❖ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය.......................................................... 15 - 22
- ❖ 2024 වර්ෂයේ ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය .......................................................... 22 - 36
- ❖ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල ප්‍රගතිය
  - ▪ තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය ..........................................................37 - 38
  - ▪ ශ්‍රී ලංකා තේ මණ්ඩලය .......................................................... 39 - 41
  - ▪ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය .......................................................... 42 - 48
  - ▪ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය .......................................................... 49 - 51
  - ▪ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව .......................................................... 52 - 54
  - ▪ රබර් පර්යේෂණ ආයතනය .......................................................... 55 - 58
  - ▪ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව .......................................................... 59 - 61
  - ▪ ජාතික වැවිලි කළමනාකරණ ආයතනය .......................................................... 62 - 64
  - ▪ පොල් වගාකිරීමේ මණ්ඩලය .......................................................... 65 - 67
  - ▪ පොල් සංවර්ධන අධිකාරිය .......................................................... 68 - 72
  - ▪ පොල් පර්යේෂණ ආයතනය .......................................................... 73 - 76
  - ▪ තල් සංවර්ධන මණ්ඩලය .......................................................... 77 - 81
  - ▪ කිතුල් සංවර්ධන මණ්ඩලය .......................................................... 82 - 88
  - ▪ ශ්‍රී ලංකා කජු සංස්ථාව ..........................................................89 - 94
  - ▪ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂපාදන අලෙවි මණ්ඩලය .......................................................... 95 - 101
  - ▪ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව .......................................................... 102 - 103
  - ▪ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම .......................................................... 104 - 109
  - ▪ සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම ..........................................................110 - 113
  - ▪ සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම.......................................................... 114
  - ▪ ජනතා වතු සංවර්ධන මණ්ඩලය ..........................................................115 - 116
  - ▪ සීමාසහිත හලාවත වැවිලි සමාගම .......................................................... 117 - 118
- ❖ විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය
  - ▪ කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR) ..........................................................119
  - ▪ කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතිය (ASMP) ..........................................................120
- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශය
- ❖ 2024 වර්ෂයේ ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ..........................................................123-133
- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශයට අනුබද්ධ ආයතනවල ප්‍රගතිය
  - ▪ වැවිලි මානව සංවර්ධන භාරය .......................................................... 134
  - ▪ සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුසමරණ පදනම.......................................................... .135- 136
  - ▪ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය .......................................................... 137- 139
  - ▪ ඉන්දියානු ණය ආධාර නිවාස ව්‍යාපෘතිය .......................................................... 140

## දැක්ම

“ තිරසර වැවිලි ආර්ථිකයක් - පොහොසත් රටක් ”

## මෙහෙවර

“ වැවිලි කර්මාන්තයේ තිරසරභාවය, ප්‍රවර්ධනය හා නව්‍යකරණය තුළින් අපනයන ආර්ථිකය ඉහළ නැංවීම හා වැවිලි ප්‍රජාවගේ සමාජයීය හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම ”

## විෂය පථය

පර්යේෂණාත්මක විධි ක්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමි උපයෝජනය හරහා ගුණාත්මක නිෂ්පාදන, අගය එකතු කිරීම හා විවිධාංගීකරණය තුළින් දේශීය හා විදේශීය වෙළඳපොළ ආකර්ෂණය කරගැනීම, වැවිලි ප්‍රජාවගේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා ඔවුන්ගේ සමාජ - ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඉලක්ක කරගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනය උදෙසා අදාළ සියලු පාර්ශ්වකරුවන් සමඟ එක්ව ක්‍රියාකරමින් ඊට අවශ්‍ය වන ප්‍රතිපත්ති හඳුනාගැනීම, ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම සහ පසු විපරම් කිරීම.

## අරමුණු

- වැවිලි ක්ෂේත්‍රයේ සමස්ත ඵලදායීතාව ඉහළ නැංවීම
- වැවිලි නිෂ්පාදන පාදක කරගත් අපනයන ආදායම ඉහළ නැංවීම
- වැවිලි ප්‍රජාව ඇතුළු අගයදාමයේ සියලු පාර්ශ්වකරුවන්ගේ සමාජ - ආර්ථික තත්වය ඉහළ නැංවීම

# හැඳින්වීම

"තිරසර වැවිලි ආර්ථිකයක් - පොහොසත් රටක්" යන අමාත්‍යාංශයීය දැක්මට අනුගත වෙමින් පෙර වර්ෂවල මෙන්ම 2024 වර්ෂයේත් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මඟින් වැවිලි ක්ෂේත්‍රයට අභිවෘද්ධිය සලසමින් ක්ෂේත්‍රයෙන් ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් කාලීන අවශ්‍යතාවන් අනුව ප්‍රතිපත්තිමය තීරණයන් ලබාදෙමින් ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

එහිදී සීමිත මූල්‍ය ප්‍රතිපාදන සහ විවිධ සීමාකාරී සාධක මත වුවද රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුගතව අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන මඟින් තේ, පොල්, රබර්, තල්, කිතුල්, කුරුඳු හා කජු යන වැවිලි සහ සුළු බෝගවල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා මෙන්ම වැවිලි ප්‍රජාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් වැවිලි ප්‍රජාවගේ සුබ සාධනය සලසමින් පර්යේෂණ අවස්ථා ඉහළ නංවමින් අගය එකතු කළ නිෂ්පාදන සඳහා අවශ්‍ය තාක්ෂණයට මඟ පෙන්වමින් ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා පියවර ගනිමින් අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණයන් ද ලබා දෙමින් අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන ලදි.

ගම්මිරිස්, කරාබුනැටි, කරදමුංගු, කෝපි හා කොකෝවා ඇතුළු සුළු අපනයන බෝග පහළොවක කාර්ය සාධනය ඉහළ නැංවීමට විශාල කාර්ය භාරයක් ඉටු කරන ලද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2024.11.25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පැවරුණත්, එතෙක් සුළු අපනයන බෝගයන්හි කාර්ය සාධනය වෙනුවෙන් අමාත්‍යාංශ මඟ පෙන්වීම යටතේ එම ආයතන විශාල කාර්ය භාරයක් ඉටු කරන ලදි. ගෝලීයව පොල් හා ගම්මිරිස් කර්මාන්තයේ සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර වෙළඳපොළෙහි ශ්‍රී ලාංකේය දායකත්වය සාක්ෂාත් වීම තහවුරු වීම පිණිස 60 වන ජාත්‍යන්තර පොල් ප්‍රජාවගේ හා 52 වන ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජා සමුළුව යන ජාත්‍යන්තර සම්මේලන දෙකක් අමාත්‍යාංශයේ මඟ පෙන්වීමෙන් සාමාජික රටවල නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් මෙරට දී ඉතා සාර්ථකව පැවැත්වීමට කටයුතු කෙරිණි.

දළ දේශීය නිෂ්පාදිතයේ කොටස්කරුවෙකු වන වැවිලි ක්ෂේත්‍රය මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීමට දායකත්වයක් ලබාදෙනවා මෙන්ම සමස්ත ජනගහනයෙන් 10% කට ආසන්න ප්‍රමාණයකට සෘජු හා වක්‍ර රැකියා ලබා දේ. වැවිලි ප්‍රජාවගේ උන්නතිය වෙනුවෙන් කටයුතු කළ ප්‍රජා යටිතල පහසුකම් විෂය ද 2024.11.25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් වැවිලි අමාත්‍යාංශයීය විෂය පථයට ඇතුළත් වූ බැවින් වැවිලි ක්ෂේත්‍රය තවදුරටත් ශක්තිමත් කර, වැවිලි ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය වාසස්ථාන, යටිතල පහසුකම් හා ධාරිතා සංවර්ධනය ලබාදීම සිදු කරනු ඇත.

තේ, පොල්, රබර්, තල්, කිතුල්, කුරුඳු හා කජු යන වැවිලි සහ සුළු බෝගවල කාර්ය සාධනය වෙනුවෙන් මෙන්ම වැවිලි ප්‍රජාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණයන් සහ අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීමට තවදුරටත් අමාත්‍යාංශය මඟින් කටයුතු කරනු ඇත. එසේම තවදුරටත් පෙර පැවති රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයට පැවරී තිබූ රාජ්‍ය වැවිලි සමාගම්වල කාර්යයන් ද මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

කෙසේ නමුත් අනුමත ප්‍රතිපාදන සීමාව තුළ ප්‍රධාන වැවිලි බෝග සහ කුරුඳු හා කජු වැනි සුළු බෝග මෙන්ම වැවිලි ක්ෂේත්‍රය හා බැඳුණු මානව ප්‍රජාවගේ උන්නතිය වෙනුවෙන් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය අනුබද්ධ ආයතන සමඟින් සැලසුම්ගත වැඩපිළිවෙළකට අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කරමින් 2024 වර්ෂයේ අත්කරගත් ප්‍රගතිය මෙන්ම ප්‍රතිපත්තිමය තීරණයන් ද 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ සංවර්ධන ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ද මෙම ප්‍රගති වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

## අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

වර්ෂ 2024 නොවැම්බර් මස 25 දිනැති අංක 2412/08 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව
අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

1. ශ්‍රී ලංකා තේ මණ්ඩලය
2. තේ පර්යේෂණ ආයතනය
3. තේ රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය
4. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
5. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
6. තේ ශක්ති අරමුදල
7. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
8. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
9. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව
10. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
11. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
12. රබර් පර්යේෂණ ආයතනය
13. ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව
14. තුරුසවිය අරමුදල
15. ශ්‍රී ලංකා කජු සංස්ථාව
16. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය
17. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
18. සීමාසහිත හලාවත  වැවිලි සමාගම
19. පොල් වගාකිරීමේ මණ්ඩලය
20. පොල් සංවර්ධන අධිකාරිය
21. පොල් පර්යේෂණ ආයතනය
22. තල් සංවර්ධන මණ්ඩලය
23. කිතුල් සංවර්ධන මණ්ඩලය
24. කප්රුක අරමුදල
25. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
26. වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය
27. වැවිලි මානව සංවර්ධන භාරය
28. සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම
29. වතු අංශයේ ස්වයං රැකියා වක්‍රීය අරමුදල

## වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වැවිලි බෝග

තේ, පොල්, රබර්, තල්, කිතුල්, කජු හා කුරුඳු යන ප්‍රධාන වැවිලි බෝග සහ සුළු බෝග මෙම අමාත්‍යාංශයීය විෂය පථයට අයත් වන අතර, 2024.11.25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශයීය විෂය පථයට අයත්ව තිබූ කරාබු, කෝපි, කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් ආදී සුළු අපනයන බෝග 15 ක් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයීය විෂය පථයට අයත් වේ.

## තේ ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය





| විස්තරය | ඉලක්ක 2024 | ප්‍රගතිය 2023.12.31 දිනට | ප්‍රගතිය 2024.12.31 දිනට | ඉලක්ක 2025 |
|---|---|---|---|---|
| තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි.) | 268.75 | 256.088 | 262.15 | 275.00 |
| අපනයන ආදායම (රු.බිලි.) | 471.12 | 428.30 | 433.47 | 518.23 |
| අපනයන ආදායම (ඇ.ඩො. බිලි ) | 1.44 | 1.30 | 1.43 | 1.58 |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.) | 248.96 | 241.90 | 245.78 | 266.68 |
| කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අලෙවි මිල (රු./ කි.ග්‍රෑ) | - | 1,159.26 | 1,225.17 | - |

### තේ නිෂ්පාදනය

❖ උන්නතාංශ අනුව තේ නිෂ්පාදනය

| උන්නතාංශය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා (කි.ග්‍රෑ.මි.) | | වෙනස (%) |
|---|---|---|---|
| | 2023 | 2024 | |
| උඩරට තේ | 58.64 | 55.72 | (5.0) |
| මැදරට තේ | 42.34 | 47.62 | 12.5 |
| පහතරට තේ | 155.11 | 158.81 | 2.4 |
| **මුළු නිෂ්පාදනය** | **256.09** | **262.15** | **2.4** |

❖ ප්‍රධාන තේ නිෂ්පාදන ක්‍රමවේදයන් අනුව තේ නිෂ්පාදනය

| විස්තරය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා (කි.ග්‍රෑ. මි.) | | වෙනස (%) |
|---|---|---|---|
| | 2023 | 2024 | |
| පාරම්පරික තේ | 231.19 | 236.21 | 2.2 |
| සී.ටී.සී තේ | 22.62 | 23.68 | 4.7 |
| හරිත තේ | 2.28 | 2.26 | (1) |
| **එකතුව** | **256.09** | **262.15** | **2.4** |
| ක්ෂණික තේ * | 3.20 | 2.88 | (10) |

* මුළු තේ නිෂ්පාදනය තුළ ක්ෂණික තේ ඇතුළත් නැත.

❖ ලොව ප්‍රධාන තේ වෙන්දේසි මධ්‍යස්ථාන අලෙවි තොරතුරු

| වෙන්දේසි මධ්‍යස්ථානය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2023 | | 2024 | | වෙනස | |
| | ප්‍රමාණය (මෙ.ටො) | මුළු අපනයනයෙන් ප්‍රතිශතය (%) | ප්‍රමාණය (මෙ.ටො) | මුළු අපනයනයෙන් ප්‍රතිශතය (%) | ප්‍රමාණය (මෙ.ටො) | කි.ග්‍රෑ. මිල (ඇ.ඩො) |
| ඉරාකය | 30,378 | 12.56 | 34,260 | 13.94 | 3,882 | 12.78 |
| රුසියාව | 22,889 | 9.46 | 24,987 | 10.17 | 2,098 | 9.17 |
| එක්සත් අරාබි එමිර් රාජ්‍යය | 19,611 | 8.11 | 21,133 | 8.6 | 1,522 | 7.76 |
| තුර්කිය | 16,395 | 6.78 | 17,734 | 7.22 | 1,339 | 8.17 |
| චීනය | 10,672 | 4.41 | 11,565 | 4.71 | 893 | 8.37 |
| ඉරානය | 9,583 | 3.96 | 10,432 | 4.24 | 849 | 8.86 |
| අසර්බයිජාන් | 9,512 | 3.93 | 10,436 | 4.25 | 924 | 9.71 |
| සෞදි අරාබිය | 8,193 | 3.39 | 9,138 | 3.72 | 945 | 11.53 |
| චිලී | 7,849 | 3.24 | 8,638 | 3.51 | 789 | 10.05 |
| ලිබියාව | 8,525 | 3.52 | 10,292 | 4.19 | 1,767 | 20.73 |
| සිරියාව | 7,067 | 2.92 | 7,426 | 3.02 | 359 | 5.08 |
| ජර්මනිය | 5,902 | 2.44 | 6,352 | 2.58 | 450 | 7.62 |
| ඇමරිකා එක්සත් ජනපදය | 6,010 | 2.48 | 6,402 | 2.6 | 392 | 6.52 |
| ජපානය | 4,898 | 2.02 | 5,425 | 2.21 | 527 | 10.76 |
| ජෝර්දානය | 4,422 | 1.83 | 4,925 | 2 | 503 | 11.37 |
| තායිවානය | 4,051 | 1.67 | 4,434 | 1.8 | 383 | 9.45 |
| පෝලන්තය | 3,720 | 1.54 | 4,084 | 1.66 | 364 | 9.78 |
| හොං කොං | 3,018 | 1.25 | 3,455 | 1.41 | 437 | 14.48 |
| බෙල්ජියම | 2,431 | 1 | 2,691 | 1.09 | 260 | 10.70 |
| ඕස්ට්‍රේලියාව | 2,297 | 0.95 | 2,480 | 1.01 | 183 | 7.97 |
| **ප්‍රධාන 20 හි එකතුව** | 187,422 | 77.48 | 206,289 | 83.93 | 18,867 | 10.07 |
| **අනෙකුත් එකතුව** | 54,490 | | 39,499 | | -14,991 | - 27.51 |
| **මුළු එකතුව** | 241,913 | | 245,788 | | 3,875 | 1.60 |



❖ **කොළඹ තේ වෙන්දේසි දත්ත ( ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා)**

| වර්ෂය | උඩරට තේ | | මැදරට තේ | | පහතරට තේ | | සියලු උන්නතාංශ | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (කි.ග්‍රෑ.මි.) | කි.ග්‍රෑ/ මිල (රු.) | ප්‍රමාණය (කි.ග්‍රෑ.මි.) | කි.ග්‍රෑ/ මිල (රු.) | ප්‍රමාණය (කි.ග්‍රෑ.මි.) | කි.ග්‍රෑ/ මිල (රු.) | ප්‍රමාණය (කි.ග්‍රෑ.මි. | කි.ග්‍රෑ/ මිල (රු.) |
| 2023 | 57.54 | 1,058.30 | 44.37 | 998.57 | 152.94 | 1,243.93 | 254.87 | 1,159.26 |
| 2024 | 56.47 | 1,141.63 | 47.64 | 1,064.48 | 156.54 | 1,304.38 | 260.70 | 1,225.17 |

❖ තේ වෙළඳපොළ දත්ත

| විස්තරය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා | | වෙනස | |
|---|---|---|---|---|
| | **2023** | **2024** | ප්‍රමාණය | **(%)** |
| අලෙවි කරන ලද මුළු තේ ප්‍රමාණය (කි.ග්‍රෑ.මි.) | 255 | 261 | 6 | 2 |
| තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අලෙවි මිල (රු.) | 1,159.26 | 1,225.17 | 66 | 6 |

## රබර් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය


| විස්තරය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය | | ඉලක්ක 2024 | ඉලක්ක 2025 |
|---|---|---|---|---|
| | 2023 | 2024 | | |
| නිෂ්පාදන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.) (නොවැම්බර් 30 දක්වා) | 64 | 69 | 76 | 78 |
| ඵලදායිතාවය (හෙක්/කි.ග්‍රෑ) | *755 | *944 | 944 | 1,017 |
| අපනයන ආදායම (රු.බිලි.) | 305 | 303 | 320 | 340 |
| අපනයන ආදායම (ඇ.ඩො. බිලි ) | 0.93 | 1.001 | 0.99 | 1.07 |
| නැවත වගාව - කුඩා වතු (හෙක්.) | 324.59 | 247.79 | 295 | 345 |
| නව වගාව - කුඩා වතු (හෙක්.) | 416.87 | 489.09 | 540 | 655 |

(*වාර්ෂිකව සකස් කළ තොරතුරු වන අතර, 2024 වර්ෂයේ ඵලදායීතාවය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති තොරතුර වාර්ෂික ඉඩම් ප්‍රමාණය මත යාවත්කාලීන වීමට නියමිතය) (2023/2024 වර්ෂයන් පදනම් කර ගනිමින් ක්‍රියාත්මක රබර් ඉඩම් සමීක්ෂණයේ දත්ත මත ඉඩම් ප්‍රමාණය ගණනය සිදු කරන අතර, මේ වන විට සමීක්ෂණයේ අවසන් අදියර ක්‍රියාත්මක වේ.)

### රබර් නිෂ්පාදනයේ වර්ගීකරණය

| වර්ගය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා (මෙ.ටො.) | |
|---|---|---|
| | 2023 | 2024 |
| ෂීට් රබර් | 32,185 | 33,504 |
| සෝල් ක්‍රේප් | 1,214 | 600 |
| ස්ක්‍රැප් | 3,867 | 4,151 |
| ලේටෙක්ස් ක්‍රේප් | 6,051 | 5,599 |
| ලේටෙක්ස් සහ වෙනත් | 21,127 | 25,331 |
| **එකතුව** | **64,444** | **69,185** |

❖ කොළඹ රබර් වෙන්දේසි මිල

| රබර් වර්ගය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා | | |
|---|---|---|---|
| | **2023 (කි.ග්‍රෑ.රු.)** | **2024 (කි.ග්‍රෑ.රු.)** | වෙනස (%) |
| ආර්.එස්.එස් 1 | 559.41 | 714.03 | 28 |
| ආර්.එස්.එස් 2 | 557.88 | 653.50 | 17 |
| ආර්.එස්.එස් 3 | 503.10 | 650.67 | 29 |
| ආර්.එස්.එස් 4 | 513.40 | 629.83 | 23 |
| ආර්.එස්.එස් 5 | 444.38 | 625.63 | 41 |

❖ ස්වාභාවික රබර් අපනයනය

| වර්ගය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා (මෙ.ටො.) | |
|---|---|---|
| | **2023** | **2024** |
| ෂීට් රබර් | 4,354 | 2,478 |
| සෝල් ක්‍රේප් | 1,156 | 572 |
| ලේටෙක්ස් ක්‍රේප් | 5,042 | 4,666 |
| TSR | 1,005 | 541 |
| ලේටෙක්ස් සහ වෙනත් | 1,116 | 375 |
| **එකතුව** | **12,672** | **8,632** |

## පොල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය



### අස්වැන්න

| විස්තරය | 2024 ඉලක්ක | 2024 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය | 2025 වර්ෂයේ ඉලක්ක |
|---|---|---|---|
| පොල් අස්වැන්න (ගෙඩි මිලි.) | 3,250 | 2,791.80 | 2,875 |
| අපනයන ආදායම (රු.බි.) | 247.50 | 257.92 | 265.50 |
| අපනයන ප්‍රමාණය (ඇ.ඩො.මිලි.) | 825 | 854.93 | 900 |
| පොල් පැළ නිෂ්පාදනය (පැළ මිලි.) | 2.00 | 2.00 | 1.50 |
| නව වගාව (හෙක්.) | 3,654 | 3,177 | 2,741 |
| නැවත වගාව (හෙක්.) | 733 | 38 | 550 |
| යටි වගාව (හෙක්.) | 758 | 1,047 | 569 |
| ගෙවතු වගාව (පැළ) | 730,000 | 468,390 | 350,000 |

### අස්වැන්න

| විස්තරය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024.12.31 |
| පොල් අස්වැන්න (ගෙඩි මිලි.) | 2,818 | 3,383 | 3,391 | 3,170 | 2,791.80 |

### අපනයන ආදායම

| නිෂ්පාදන වර්ගය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා (රු.මි./ඇ.ඩො.මි.) | | | | |
|---|---|---|---|---|---|
| | 2023 | | 2024 | | 2023/2024 වෙනස |
| | රු.මි. | ඇ.ඩො.මි. | රු.මි. | ඇ.ඩො.මි. | (ඇ.ඩො.) |
| පොල් මද ආශ්‍රිත | 119,546.22 | 365.90 | 138,561.37 | 459.63 | 26 |
| කෙඳි | 5,588.40 | 17.05 | 5,011.07 | 16.50 | -3 |
| කෙඳි ආශ්‍රිත නිෂ්පාදන | 59,766.69 | 183.38 | 65,439.14 | 216.84 | 18 |
| කටු ආශ්‍රිත නිෂ්පාදන | 42,188.85 | 129.13 | 47,656.69 | 157.81 | 22 |
| වෙනත් | 1,629.90 | 5.02 | 1,252.87 | 4.16 | -17 |
| **එකතුව** | **228,720.07** | **700.47** | **257,921.14** | **854.93** | **22** |

### ප්‍රධාන නිෂ්පාදන කිහිපයක අපනයනය උච්ඡාවචනය වීම

| නිෂ්පාදන වර්ගය | ප්‍රමාණය (මෙ.ටො.) | | ආදායම | | | |
|---|---|---|---|---|---|---|
| | 2023 ජන.- දෙසැ.31 | 2024 ජන.- දෙසැ.31 | 2023 ජන.- දෙසැ. 31 | | 2023 ජන.- දෙසැ. 31 | |
| | | | රු.මි. | ඇ.ඩො.මි. | රු.මි. | ඇ.ඩො.මි. |
| පොල් තෙල් (මෙ.ටො.) | 5,518 | 7,391 | 3,878 | 11.83 | 5,516 | 18.30 |
| නැවුම් පොල්තෙල් (මෙ.ටො.) | 14,728 | 16,214 | 17,974 | 55.06 | 19,514 | 64.75 |
| පොල් වතුර (මෙ.ටො.) | 29,220 | 36,348 | 8,302 | 25.41 | 9,318 | 30.92 |
| තැඹිලි (ගෙඩි) 1000 | 12,909 | 8,007 | 3,325 | 10.19 | 2,042 | 6.75 |
| නැවුම් පොල් (ගෙඩි) 1000 | 14,127 | 17,246 | 2,165 | 6.62 | 2,327 | 7.70 |
| බ්‍රිස්ටල් කෙදි (මෙ.ටො.) | 1,853 | 1,750 | 677 | 2.05 | 571 | 1.89 |

### තල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය



| නිෂ්පාදන වර්ගය | 2023 වාර්ෂික නිෂ්පාදනය | 2024 ඉලක්ක | 2024 ප්‍රගතිය ජන. - දෙසැ. 31 | 2025 ඉලක්ක |
|---|---|---|---|---|
| හකුරු (මෙ.ටො.) | 61 | 78 | 58.00 | 70 |
| තල් රා (ලීටර්) | 10,584,534 | 11,000,000 | 10,592,000 | 11,000,000 |
| පල්ප (මෙ.ටො.) | 27,394 | 65,000 | 46,834 | 50,000 |
| තල් අල (මෙ.ටො.) | 403 | 420 | 336 | 400 |
| තල් කෙඳි (මෙ.ටො.) | 60 | 55 | 45.00 | 50 |
| අත්කම් (රු.මි) | 51 | 55 | 49.50 | 60 |
| පනාටු (මෙ.ටො) | 7 | 11 | 6.80 | 10 |
| තල් අරක්කු | 281,894 | 450,000 | 26,000 | 100,000 |
| දැව (නො) | 8,064 | 10,000 | 5,748 | 5,000 |

❖ තල් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලුණු සංඛ්‍යාව

| විස්තර | | | වාර්ෂික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | 2023 | 2024.12.31 |
| තල් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රතිලාභීන් සංඛ්‍යාව | රා/ මී රා ආශ්‍රිත නිෂ්පාදන | මදින්නන් | 2,912 | 2,920 |
| | | කාර්මිකයන් | 22 | 23 |
| | කොළ ආශ්‍රිත නිෂ්පාදන (අත්කම්) | නිෂ්පාදකයන් | 1,770 | 2,208 |
| | | කණ්ඩායම් | 47 | 50 |
| | අල ආශ්‍රිත නිෂ්පාදන | නිෂ්පාදකයන් | 1,904 | 2,435 |
| | | කණ්ඩායම් | 25 | - |
| | යුෂ ආශ්‍රිත නිෂ්පාදන | නිෂ්පාදකයන් | 700 | 475 |
| | | කණ්ඩායම් | 25 | 27 |
| | කෙඳි ආශ්‍රිත නිෂ්පාදන | | 23 | 18 |
| | ආහාරමය නිෂ්පාදන (බීම වර්ග හා රස කැවිලි) | | 35 | 40 |

❖ තල් ක්ෂේත්‍රයේ අපනයන ආදායම

| විස්තර | | වාර්ෂික ප්‍රගතිය (රු.මි.) | |
|---|---|---|---|
| | | 2023 | 2024.12.31 |
| දේශීය ආදායම් | රා/ මී රා ආශ්‍රිත නිෂ්පාදන | 1,428 | 1,635.60 |
| | කොළ ආශ්‍රිත නිෂ්පාදන (අත්කම්) | 51 | 49.50 |
| | අල ආශ්‍රිත නිෂ්පාදන | 153 | 117.60 |
| | යුෂ ආශ්‍රිත නිෂ්පාදන | 6.03 | 11.79 |
| | කෙඳි ආශ්‍රිත නිෂ්පාදන | 19.2 | 11.25 |
| | දැව ආශ්‍රිත නිෂ්පාදන | 72.57 | 68.97 |
| | ආහාරමය නිෂ්පාදන (බීම වර්ග හා රස කැවිලි) | 5 | 127.60 |
| අපනයන ආදායම් | රා/ මී රා ආශ්‍රිත නිෂ්පාදන<br>කොළ ආශ්‍රිත නිෂ්පාදන (අත්කම්)<br>අල ආශ්‍රිත නිෂ්පාදන<br>යුෂ ආශ්‍රිත නිෂ්පාදන<br>කෙඳි ආශ්‍රිත නිෂ්පාදන<br>ආහාරමය නිෂ්පාදන (බීම වර්ග හා රස කැවිලි) | 57 | 228.69 |

## කිතුල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය



| විස්තර | | වාර්ෂික ප්‍රගතිය (රු.මි.) | |
|---|---|---|---|
| | | 2023 | 2024.12.31 |
| අපනයන ආදායම් | කිතුල් හකුරු | 197.00 | 255.38 |
| | කිතුල් පැණි | 114.94 | 124.35 |

## කුරුඳු ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය



| විස්තරය | ඉලක්ක 2024 | ප්‍රගතිය 2023.10.31 දිනට | ප්‍රගතිය 2024.10.31 දිනට | ඉලක්ක 2025 |
|---|---|---|---|---|
| කුරුඳු නිෂ්පාදනය (මෙ.ටො.) | 25,000 | 19,000 | 19,500 | 26,500 |
| අපනයන ආදායම (රු.මිලි.) | 73,800 | 55,769 | 52,865.78 | 80,000 |
| අපනයන ආදායම (ඇ.ඩො.මිලි.) | 225 | 170 | 176 | 260 |
| අපනයන ප්‍රමාණය (මෙ.ටො.) | 20,500 | 15,749 | 15,982 | 22,000 |
| කුරුඳුවල සාමාන්‍ය අලෙවි මිල (රු./ කි.ග්‍රෑ.) | රු.3,400 | රු.3,000 | රු.3,500 | රු.4,000 |

**කුරුඳු නිෂ්පාදනයේ වර්ගීකරණය**

| නිෂ්පාදන වර්ගය | ජනවාරි සිට ඔක්තොම්බර් 31 දක්වා (මෙ.ටො.) | |
|---|---|---|
| | **2023** | **2024** |
| කුරුඳු පොතු ආශ්‍රිත නිෂ්පාදන | 15,350 | 15,661 |
| කුරුඳු වියලි කොළ | 240 | 106 |
| කුරුඳු කොළ තෙල් | 154 | 197 |
| කුරුඳු පොතු තෙල් | 5.43 | 18 |
| එකතුව | **15,749.43** | **15,982** |

**කුරුඳු අපනයනය කරනු ලබන රටවල් හා ඊට අදාල තොරතුරු**

| රට | ජනවාරි සිට ඔක්තොම්බර් 31 දක්වා | | | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | **2023** | | **2024** | | | |
| | ප්‍රමාණය (මෙ.ටො) | මුළු අපනයනයෙන් ප්‍රතිශතය (%) | ප්‍රමාණය (මෙ.ටො) | මුළු අපනයනයෙන් ප්‍රතිශතය (%) | ප්‍රමාණය (මෙ.ටො) | කි.ග්‍රෑ. මිල (ඇ.ඩො) |
| මෙක්සිකෝ | 3973.63 | 39.4% | 3570.62 | 36.6% | -403.01 | -11.67 |
| පේරු | 1259.39 | 12.5% | 1031.27 | 10.5% | -228.12 | -4.79 |
| ඇ.එ.ජනපදය | 1082.67 | 10.7% | 1040.03 | 10.7% | -42.64 | -1.30 |
| ඉන්දියාව | 544.92 | 5.4% | 472.29 | 4.8% | -72.63 | -0.99 |
| බොලීවියා | 355.88 | 3.5% | 254.49 | 2.6% | -101.39 | -1.56 |
| ඉක්වදෝරය | 353.12 | 3.5% | 366.78 | 3.8% | +13.66 | -0.26 |
| කොලොම්බියාව | 327.11 | 3.2% | 536.70 | 5.5% | +209.59 | +1.85 |
| ගෝතමාලාව | 304.61 | 3.02% | 382.28 | 3.9% | +77.67 | +0.09 |

* මේ සඳහා රේගු දෙපාර්තමේන්තුවේ දත්ත තවමත් ලැබී නොමැත.

## කජු ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය



### කජු ක්ෂේත්‍රයේ අපනයන තොරතුරු

| විස්තරය | ඉලක්ක 2024 | ප්‍රගතිය (ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා) | | වෙනස (%) |
|---|---|---|---|---|
| | | වර්ෂය 2023 | වර්ෂය 2024 | |
| කජු නිෂ්පාදනය (මෙ. ටො.) | 14,315 | 13,014 | - | - |
| කජු අපනයනය (මෙ. ටො.) | 75.17 | 68.34 | 96.71 | 28.37 (41.51%) |
| කජු අපනයන ආදායම (රු. මි.) | 342.19 | 311.08 | 287.98 | 23.10 (7.43%) |

මූලාශ්‍ර : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව / අපනයන සංවර්ධන මණ්ඩලය.

### <u>පැළ නිෂ්පාදන තොරතුරු</u>

| ශ්‍රී ලංකා තේ මණ්ඩලය | | | |
|---|---|---|---|
| ප්‍රදේශය | **2024 ඉලක්කය (පැළ)** | **2024.12.31 දිනට ප්‍රගතිය (පැළ)** | **2025 ඉලක්කය (පැළ)** |
| ගම්පොළ | 584,300 | 250,182 | 313,213 |
| නුවර එළිය | 530,000 | 568,904 | 642,340 |
| රත්නපුර | 1,786,000 | 706,043 | 1,750,000 |
| බණ්ඩාරවෙල | 211,778 | 65,000 | 220,000 |
| මාතර | 2,200,000 | 106,805 | 1,006,805 |
| බදුරලිය | 1,600,000 | 935,909 | 1,100,000 |
| ගාල්ල | 1,500,000 | 1,853,387 | 1,500,000 |
| **එකතුව** | **8,412,078** | **5,386,230** | **6,532,358** |

| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | | | |
|---|---|---|---|
| තවාන් වර්ගය | **2024 ඉලක්කය (පැළ) මිලි.** | **2024.12.31 දිනට ප්‍රගතිය (පැළ) මිලි.** | **2025 ඉලක්කය (පැළ) මිලි.** |
| ආයතනික තවාන් | 1.07 | 1.07 | 1.70 |
| ලියාපදිංචි වාණිජ තවාන් | 45.00 | 42.60 | 60.00 |
| එකතුව | **46.07** | **43.67** | **61.70** |

| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| පැළ තවාන (ස්ථානය) | **2024 ඉලක්කය (පැළ)** | **2024.12.31 දිනට ප්‍රගතිය (පැළ)** | **2025 ඉලක්කය (පැළ)** |
| වැලිකඩමුල්ල | 70,000 | 22,372 | 62,000 |
| මීරිගම | 67,500 | 30,119 | 53,300 |
| ඇගල්ඔය | 39,500 | 19,661 | 50,200 |
| ගුරුගොඩ | 45,500 | 31,510 | 33,000 |
| කරපිංච | 47,500 | 32,375 | 55,500 |
| කුඹුක්කන | 189,500 | 218,443 | 180,800 |
| පදියතලාව | 99,500 | 57,385 | 111,100 |
| මිද්දෙණිය | 49,000 | 24,375 | 35,100 |
| එකතුව | **608,000** | **436,240** | **581,000** |

| පොල් පර්යේෂණ ආයතනය | | | |
|---|---|---|---|
| පැළ තවාන (ස්ථානය) | **2024 ඉලක්කය (පැළ)** | **2024.12.31 දිනට ප්‍රගතිය (පැළ)** | **2025 ඉලක්කය (පැළ)** |
| බණ්ඩිරිප්පුව ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානය | 30,000 | 24,256 | 24,000 |
| රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානය | 25,000 | 26,550 | 28,000 |
| පොත්තුකුලම පර්යේෂණ මධ්‍යස්ථානය | 20,000 | 11,825 | 15,000 |
| මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානය | 15,000 | 13,720 | 15,000 |
| වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානය | 30,000 | 17,380 | 25,000 |
| තබ්බෝව පර්යේෂණ මධ්‍යස්ථානය | 20,000 | 19,235 | 22,000 |
| මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානය | 15,000 | 24,382 | 25,000 |
| අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානය | 40,000 | 26,480 | 30,000 |
| පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානය | 50,000 | 37,612 | 50,000 |
| මාදුරුඔය ජාන සම්පත් මධ්‍යස්ථානය | 3,000 | 4,459 | 6,000 |
| එකතුව | **248,000** | **205,899** | **240,000** |

| පොල් වගා කිරීමේ මණ්ඩලය | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | 2024 ඉලක්කය (පැළ) | 2024.12.31 දිනට නිෂ්පාදනය කර ඇති පැළ ප්‍රමාණය<br>2024 වසරේ දී නිෂ්පාදනය කර නිකුත් කිරීම. | 2025 ඉලක්කය (පැළ) |
| මොණරාගල | 44,435 | 43,610 | 39,670 |
| බදුල්ල | 29,620 | 29,073 | 26,450 |
| මාතර | 15,830 | 8,564 | 22,450 |
| කුරුණෑගල | 397,600 | 358,875 | 319,350 |
| කෑගල්ල | 91,725 | 24,895 | 95,484 |
| ගම්පහ | 83,100 | 62,154 | 72,900 |
| කලුතර | 109,100 | 92,361 | 92,400 |
| කොළඹ | 22,315 | 17,514 | 20,970 |
| පුත්තලම | 33,470 | 26,270 | 31,450 |
| රත්නපුරය | 140,010 | 164,538 | 109,200 |
| හම්බන්තොට | 58,860 | 53,830 | 54,720 |
| අනුරාධපුරය | 200,000 | 143,300 | 182,700 |
| ත්‍රිකුණාමලය | 87,300 | 96,558 | 76,050 |
| පොලොන්නරුව | 42,200 | 28,027 | 42,230 |
| අම්පාර | 40,200 | 34,079 | 40,730 |
| මාතලේ | 47,120 | 39,177 | 45,920 |
| ගාල්ල | 50,100 | 46,834 | 48,150 |
| මඩකලපුව | 45,000 | 40,150 | 49,760 |
| යාපනය | 25,000 | 21,108 | 37,270 |
| කිලිනොච්චිය | 67,000 | 71,073 | 49,330 |
| මුලතිව් | 35,000 | 38,767 | 26,910 |
| වව්නියාව | 20,000 | 19,383 | 13,450 |
| මන්නාරම | 40,500 | 36,734 | 36,720 |
| මහනුවර | 27,000 | 24,490 | 24,480 |
| නුවරඑළිය | 45,000 | 58,338 | 25,720 |
| **එකතුව** | **1,718,000** | **1,579,809** | **1,500,000** |

| ශ්‍රී ලංකා කජු සංස්ථාව | | | | | | |
|---|---|---|---|---|---|---|
| පැළ තවාන | 2024 ඉලක්කය (පැළ) | | 2024.12.31 දිනට ප්‍රගතිය (පැළ) | | 2025 ඉලක්කය (පැළ) | |
| | බද්ධ පැළ | බීජ පැළ | බද්ධ පැළ | බීජ පැළ | බද්ධ පැළ | බීජ පැළ |
| කමන්දළුව තවාන | 85,040 | 1,000 | 55,666 | 1,000 | 75,450 | 800 |
| මිහින්තලය තවාන | 84,520 | - | 83,478 | - | 78,200 | 2,400 |
| මංගලගම තවාන | 8,025 | 3,000 | 6,274 | 3,000 | 11,100 | 1,200 |
| මහියංගනය තවාන | 9,875 | - | 4,405 | - | 12,600 | - |
| චන්ද්‍රිකාවැව තවාන | 13,155 | - | 13,672 | - | 21,200 | 400 |
| දඹුල්ල තවාන | 9,525 | - | 10,140 | - | 11,800 | - |
| කුඹුක්කන තවාන | 12,550 | - | 10,872 | - | 13,900 | - |
| හාඩි තවාන | 26,025 | - | 23,560 | - | 33,850 | 800 |
| **එකතුව** | **248,715** | **4,000** | **208,067** | **4,000** | **258,100** | **5,600** |

## වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘතිවල 2024.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | | |
|---|---|---|
| **ව්‍යාපෘතියේ නම : රබර් මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම** | | |
| **ක්‍රියාත්මක අංශය : රබර් සහ කුරුඳු සංවර්ධන අංශය** | | **වැය ශීර්ෂය : 118-2-29-008-2507**<br>**අනුමත ප්‍රතිපාදන (රු.මි.) : 25.00** |
| **ව්‍යාපෘතියේ නම** | **මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | **භෞතික ප්‍රගතිය** |
| මොණරාගල, අම්පාර හා බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි නව බෝග වගාව ව්‍යාප්ත කිරීම. | 15.13 | ▪ රබර් පැළ 60,000 ක් බෙදා හැර හෙක්ටයාර 115 ක රබර් වගා කර ඇත. |
| රත්නපුරය හා කෑගල්ල යන දිස්ත්‍රික්කයන්හි ශ්‍රම හිගය මත කිරි කැපීම අතහැර දැමූ රබර් ඉඩම්වල කිරි කැපීම නැවත ආරම්භ කිරීම. | 1.46 | ▪ ඉඩම් හිමිකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 05 ක් පවත්වා ඇත.<br>▪ කිරි කැපුම්කරුවන් 195 ක් සඳහා පුහුණු වැඩසටහන් අවසන් කර ඇත. |
| අම්පාර දකුණු පන්නල්ගම ග්‍රාමයේ නව රබර් වගාව තුළ සත්ව හානි අවම කරමින් අතුරු බෝග වගාව ඉහළ නැංවීම. | 1.40 | ▪ නව රබර් වගාව තුළ අතුරු බෝග ආරම්භ කිරීමට මූලික දැනුවත් කිරීම් සිදු කර ඇත.<br>▪ රබර් වගා භූමිය වටා අලි වැට ඉදි කිරීමට අදාලව අනුමැතීන් ලබාගෙන ඉදි කිරීම් කටයුතු සිදු කරමින් පවතී. |
| සාම්ප්‍රදායික නොවන රබර් වගා කරන ප්‍රදේශවල රබර් කිරි අලෙවිකරුවන් සහ ගැනුම්කරුවන්ට උෂ්ණත්ව විචලන හමුවේ නිවැරදි පාඨාංක ලබා ගත හැකි නව නිතැති ගුණන වගුව හඳුන්වා දීම (Ready Reckoner chart) | 0.50 | ▪ පුහුණු වැඩසටහන් 8 ක් පවත්වා ඇත. |
| වලයාකාර පත්‍ර පුල්ලි රෝගයේ බලපෑම අවම කර ගැනීම සඳහා ජාතික සැළැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳව දැනුවත් කිරීම. | 0.50 | ▪ කෑගල්ල, කළුතර, රත්නපුර හා මොනරාගල පුහුණු වැඩසටහන් 8 ක් පවත්වා ඇත. |
| ආන්තික ප්‍රදේශවල තිරසාර රබර් වගාව සඳහා නියඟය/ආතතියට ඔරොත්තු දෙන *Hevea* Clones පරීක්ෂා කිරීම. | 1.30 | ▪ වියළි ආතතියටය ඔරොත්තුදෙන ක්ලෝන සහිත අක්කර 05 ක ක්ෂේත්‍ර පිහිටුවීම අවසන් කර ඇත. |
| දිගු කල් පවතින තොප්පි ආකාරයේ වැසි ආවරණයක් සංවර්ධනය කිරීම. | 0.50 | ▪ තොප්පි ආකාර වැසි ආවරණයක් නිපදවා ක්ෂේත්‍රයේ ගස් 80 කට සවි කිරීම. |

| ව්‍යාපෘතියේ නම : කප්රුක අරමුදල | | |
|---|---|---|
| **ක්‍රියාත්මක අංශය : කප්රුක අරමුදල කළමනාකරණ මණ්ඩලය** | | **වැය ශීර්ෂය : 118-2-29-006-2202**<br>**අනුමත ප්‍රතිපාදන (රු.මි.) : 20.00** |
| **ව්‍යාපෘතියේ නම** | **මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | **භෞතික ප්‍රගතිය** |
| පොල් ආශ්‍රිත කුඩා හා ක්ෂුද්‍ර පරිමාණ කර්මාන්තවල ව්‍යවසායකයින්ට සහනදායී කොන්දේසි යටතේ ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබාදීම. | 7.080 | ▪ මූල්‍යකරණය කරන ලද කර්මාන්ත ව්‍යාපෘති 34 ක් වැඩ අවසන් කර මූල්‍යායතන වෙත යොමු කර ඇත.<br>▪ ප්‍රතිලාභීන් සහ මූල්‍ය ආයතන දැනුවත් කිරීම සහ ව්‍යාපෘති සැකසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සහ අධීක්ෂණ චාරිකා 172 ක් සිදු කරන ලදී. |
| පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ වෙළඳපොළ තොරතුරු දත්ත පද්ධතියක් සකස් කිරීම සහ නඩත්තු කිරීම. | 0.108 | ▪ කර්මාන්ත සමීක්ෂණයේ පූර්ව ඇගයීම් සහ ද්විතියික දත්ත එකතු කිරීම අනුව අවශ්‍ය ප්‍රශ්නාවලි පත්‍රිකා 6,000ක් මුද්‍රණය කර ඇත. |
| කුඩා හා ක්ෂුද්‍ර ව්‍යවසායක නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථා සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම. | 0.298 | ▪ කුඩා හා ක්ෂුද්‍ර කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රදර්ශන 05 ක් සංවිධානය කර පවත්වන ලදී. (ගම්පහ, ගාල්ල,මාතර, මාතලේ සහ මාරවිල) |
| කුඩා පරිමාණ පොල් ඉඩම් හිමියන්ගේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබාදීම. | 4.040 | ▪ මූල්‍යකරණය කරන ලද ඉඩම් සංවර්ධන ව්‍යාපෘති 22 ක වැඩ අවසන් කර මූල්‍යායතන වෙත යොමුකර ඇත.<br>▪ ප්‍රතිලාභීන් සහ මූල්‍ය ආයතන දැනුවත් කිරීම සහ ව්‍යාපෘති සැකසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සහ අධීක්ෂණ චාරිකා 162 ක් සිදු කරන ලදී. |
| කප්රුක සමිතිවල කාර්ය සාධනය ශක්තිමත් කිරීම සහ වැඩි දියුණු කිරීම. | 1.799 | ▪ අධීක්ෂණය හා බල ගැන්වීම සිදු කරන ලද කප්රුක සමිති ගණන 132 කි.<br>▪ පිහිටුවන ලක නව කප්රුක සමිති ගණන 25 කි.<br>▪ කප්රුක සමිති නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන 24 කි. |
| කප්රුක අරමුදලේ නිලධාරීන්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා වැඩි දියුණු කිරීම. | 0.971 | ▪ නායකත්ව පුහුණු වැඩසටහන් 02 ක් පවත්වන ලද අතර ප්‍රතිලාභීන් ගණන 280 කි. |
| කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය. | 1.599 | ▪ ප්‍රාදේශීය කාර්යාල සඳහා පරිගණක පද්ධති 06 හා අනෙකුත් පර්යන්ත උපාංග ලබාදෙන ලදී. |
| සංවර්ධන ක්‍රියාකාරකම් නියාමනය, අධීක්ෂණය සහ ඇගයීම’ | 2.350 | ▪ සංවර්ධන වැඩසටහන් අධීක්ෂණ හා නියාමන කටයුතු 39 ක් සිදුකර ඇත. |

| | | |
|---|---|---|
| **ව්‍යාපෘතියේ නම : වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණු වීමේ රෝග පාලන වැඩසටහන** | | |
| **ක්‍රියාත්මක අංශය : පොල් වගා කිරීමේ මණ්ඩලය**<br>**පොල් පර්යේෂණ ආයතනය**<br>**මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** | | **වැය ශීර්ෂය : 118-2-29-004-2507**<br>**අනුමත ප්‍රති පාද්න (රු.මි .) : 100** |
| **ව්‍යාපෘතියේ නම** | **මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | **භෞතික ප්‍රගතිය** |
| **පොල් වගා කි රීමේ මණ් ලය - රු.මි ලි . 63.621** | | |
| රෝගී ගස් 5,500 ක් හඳුනා ගැනීම, සලකුණු කිරීම හා ඉවත් කිරීමට අදාල කටයුතු | 61.834 | ▪ රෝගී ගස් 6,986 ක් සලකුණු කර ඇති අතර, ගස් 8,506 ක් ඉවත් කර ඇත.<br>▪ ඉවත් නොකළ ගස් 5,279 ක් එන්නත් කර ඇත. |
| **පොල් පර්යේෂණ ආයතනය - රු.මි ලි . 23.5** | | |
| රෝගී ගස් 2000 ක් හඳුනා ගැනීම, සලකුණු කිරීම හා ඉවත් කිරීමට අදාල කටයුතු කිරීම. | 20.10 | ▪ ගස් 2,060 ක් සලකුණු කර ඇති අතර ගස් 1,424 ක් ඉවත් කර ඇත.<br>▪ ඉවත් නොකළ ගස් 644 ක් එන්නත් කර ඇත. |
| **මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රු.මිලි. 12.379** | | |
| ඉවත් කරන ගස් 4,078 ක් සඳහා වන්දි ගෙවීම | 12.337 | ▪ ගස් 4,078 ක් සඳහා වන්දි ගෙවා ඇත. |

| **ව්‍යාපෘතිය** | **2024 අනුමත ප්‍රතිපාදන (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය (රු. මි.)** | **භෞතික ප්‍රගතිය** |
|---|---|---|---|
| **වැවිලි අංශයේ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති (රු.මි. – 60.00)** | | | |
| **තේ ක්ෂේත්‍රය** | | | |
| **ක්‍රියාත්මක ආයතනය - තේ පර්යේෂණ ආයතනය** | | | |
| දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තු දෙන වැඩි දියුණු කළ බීජ නිපදවීමට බීජ උද්‍යාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය | 0.90 | 0.90 | ▪ **ස්ථාපන කටයුතු අවසන් උද්‍යාන**<br>කළුතර දිස්ත්‍රික්කය - 02<br>ගාල්ල දිස්ත්‍රික්කය - 03<br>මාතර දිස්ත්‍රික්කය - 02<br>මහනුවර දිස්ත්‍රික්කය - 01<br>බදුල්ල දිස්ත්‍රික්කය - 03<br>රත්නපුර දිස්ත්‍රික්කය - 01<br>▪ **දැනට ප්‍රතිස්ථාපන කටයුතු කරමින් පවතින වතු**<br>හන්තාන, රත්නපුර, සපුමල්කන්ද වතුයාය, දැරණියගල යන වතුවල නැවත ප්‍රතිස්ථාපන නඩත්තු කටයුතු 95% කින් අවසන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| තේ වගාවේ මව් වගාවන්හි වපසරිය (Mother Bush Area) වැඩි කිරීම. | 13.10 | 13.10 | ▪ හෙක්ටයාර 3.7 ක නව මව් ශාඛ වගාවන් ස්ථාපනය කර ඇත.<br>▪ හෙක්ටයාර 11.5 ක පුනරුත්ථාපන තෘණ වගා කොට ඇත. ඉතිරි හෙක්ටයාර 2.5 ක පුනරුත්ථාපන තෘණ වගා කිරීම ආරම්භ කර ඇත. |
| **ක්‍රියාත්මක ආයතනය - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය** | | | |
| ඉඩම් නිවැරදිව සිතියම්ගත කිරීම සහතික කිරීම සඳහා GPS තාක්ෂණය යොදාගැනීමේ ව්‍යාපෘතිය | 7.50 | 7.50 | ▪ GPS තාක්ෂණික උපකරණ 15 ක් මිලදී ගෙන ඇත. |
| **ක්‍රියාත්මක ආයතනය - තේ සංවර්ධන හා වැවිලි ප්‍රතිපත්ති අංශය** | | | |
| වැවිලි ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම. | 0.120 | 0.036 | ▪ සකස් කළ ප්‍රතිපත්ති ලේඛනයේ කෙටුම්පතට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ද සලකා අවශ්‍ය සංශෝධන සිදු කර යවා ඇත. තවද එම දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාල කෙටුම්පත ද සකස් කර, එම දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු අදාල දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතය. |
| ඒකාබද්ධ නාගරික සංවර්ධන සහ දේශගුණික ඔරොත්තු දීමේ ව්‍යාපෘතියට අදාලව වැඩමුළුවක් පැවැත්වීම. | 0.139250 | 0.133650 | ▪ ඒකාබද්ධ නාගරික සංවර්ධන සහ දේශගුණික ඔරොත්තු දීමේ ව්‍යාපෘතියට අදාලව වැඩමුළුව පවත්වා ඇත. |
| **වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සමඟ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ නාගරික සංවර්ධන අධිකාරිය** | | | |
| හෝලුවාගොඩ උද්‍යාන පරිශ්‍රය හා ගොඩනැගිල්ලට ජල සැපයුම ලබා ගැනීම වෙනුවෙන් වැට් බදු ගාස්තු සංශෝධනයෙන් අනතුරුව වැඩි වූ අමතර මුදල ගෙවීම. | 0.02358365 | 0.02358365 | ▪ හෝලුවාගොඩ උද්‍යාන පරිශ්‍රය හා ගොඩනැගිල්ලට ජල සැපයුම ලබා දී ඇත. |
| හෝලුවාගොඩ වැවිලි කර්මාන්ත පාරිසරික සංචාරක උද්‍යානය ඉදි කිරීමේ සමාරම්භක වැඩ සටහනේ කටයුතු සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම. | 0.999950 | 0.999950 | ▪ හෝලුවාගොඩ වැවිලි කර්මාන්ත පාරිසරික සංචාරක උද්‍යානය ඉදි කිරීමේ සමාරම්භක වැඩ සටහනේ කටයුතු අවසන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| **රබර් ක්ෂේත්‍රය** | | | |
| **ක්‍රියාත්මක ආයතනය - රබර් පර්යේෂණ ආයතනය** | | | |
| ආන්තික ප්‍රදේශවල තිරසාර රබර් වගාවක් සඳහා වියළි තත්ත්වවලට ඔරොත්තු දෙන ක්ලෝන පරීක්ෂා කිරීම. | 1.51 | 1.51 | ▪ රබර් ක්ලෝනවල RNA සංස්ලේෂණය සිදුකර අවසන් කර ඇත. RTPCR සිදු කරමින් පවතී. |
| නව පත්‍ර පතන රෝගයට අදාල වසංගත විද්‍යාත්මක අධ්‍යයන සහ ව්‍යාධිජනකයන්ගේ ජීව විද්‍යාත්මක අධ්‍යයන සිදු කිරීම සහ කාර්යක්ෂම රෝග කළමණාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම. | 10.74 | 10.74 | ▪ ජානමය විශ්ලේෂණය සඳහා ව්‍යාධිජනක රෝපිත 55 ක් පිළියෙළ කරන ලදි. රෝග කාරකයා විසින් සාදනු ලබන ධූලක සොයාගැනීම සඳහා පර්යේෂණ සිදු කරමින් පවතී.<br>▪ වලයාකාර පත්‍ර පුල්ලි රෝගය පිළිබඳව සිංහල පත්‍රිකාවක් පුවත්පතක එළි දක්වා ඇත. පර්යේෂණ පත්‍රිකා 02 ක් එලවී ඇති අතර, තවත් පර්යේෂණ පත්‍රිකා 02 ක් එල කිරීම සඳහා අනුමත වී ඇත.<br>▪ 2024 වර්ෂය සඳහා දිලීර නාශක සහ කොක්ටේල් මිශ්‍රණ අත්හදා බැලීමේ ක්ෂේත්‍ර පර්යේෂණ 15 ක් ස්ථාපනය කර ඇත. ඒ අතරින් පර්යේෂණ 02 ක් වඩාත් කාර්යක්ෂමබව සනාථ වී ඇත. මෙම රසායනික මිශ්‍රණය 2025 වසරේ වැඩි ඉඩම් ප්‍රමාණයක අත්හදා බැලීමට ප්‍රාදේශීය වතු සමාගම් කිහිපයක් කැමැත්ත පළ කර ඇත.<br>▪ සමෝධායන රෝග මර්දන වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම සඳහා ජාතික සැලැස්මක් ආරම්භ කර ඇත. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ වලයාකාර පත්‍ර පුල්ලි රෝගය මර්දනය කිරීම සඳහා කලාපීය මට්ටමින් පුහුණු කිරීමේ වැඩසටහන් 04 ක් සිදු කර ඇත.<br>▪ රෝගයට ඔරොත්තු දෙන ක්ලෝන හඳුනා ගැනීමේ පර්යේෂණ පර්යේෂණාගාර මට්ටමින්, තවාන් මට්ටමින් සහ ස්වාභාවික ක්ෂේත්‍ර මට්ටමින් ක්ලෝන 50 ක් පර්යේෂණයට ලක් කරන ලදි.<br>▪ රබර් වගාවන් සඳහා ඉන්දියාවෙන් ගෙන්වන ලද තෙල් මාධ්‍යයේ කොපර් ඔක්සික්ලෝරයිඩ් දිලීර නාශක අත්හදා බැලීම ක්ෂේත්‍ර 03 ක සිදු කරන ලදි. එයින් ක්ෂේත්‍ර 02 ක යම් සාර්ථකත්වයක් පෙන්වා ඇත. අනෙක් ස්ථානයේ |

| | | | |
|---|---|---|---|
| | | | නිගමනයන් ලබාගැනීම තවදුරටත් සිදු කරමින් පවතී.<br>▪ වලයාකාර පත්‍ර පුල්ලි රෝගය කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.<br>▪ දැනුම බෙදා හැරීමේ වැඩසටහන් 20 ක් පවත්වා ඇත. |
| **ක්‍රියාත්මක ආයතනය - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව** | | | |
| මහනුවර දිස්ත්‍රික්කයේ පවතින රබර් වගාව දියුණු කිරීම. | 0.5742 | 0.5730 | ▪ බූට්ස් 100 ක් හා පිහි 100 ක් මිළදී ගෙන ඇත.<br>▪ පුහුණු වැඩසටහන් 104 ක් හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වා ඇත. |
| මොණරාගල උප මධ්‍යස්ථානයේ රබර් කිරි නිෂ්පාදනාගාරයට ජල ආසවන යන්ත්‍රයක් මිලදී ගැනීම. | 0.30 | 0.30 | ▪ ජල ආසවන යන්ත්‍රය මිලදී ගෙන ඇත.<br>▪ යන්ත්‍රය ස්ථාපිත කර ඇත. |
| **පොල් ක්ෂේත්‍රය** | | | |
| **ක්‍රියාත්මක ආයතනය - පොල් පර්යේෂණායතනය** | | | |
| අත්‍යාවශ්‍ය රසායනාගාර උපකරණ අළුත්වැඩියා කිරීම තුළින් පොල් පර්යේෂණ ආයතනයේ විශ්ලේෂණ සේවා පවත්වාගෙන යාම. | 3.59999992 | 3.59999992 | ▪ අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇති අතර ගෙවීම් කටයුතු අවසන් කර ඇත. |
| පොල් පර්යේෂණ ආයතනයේ පොල් තොරතුරු මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම. | 5.00 | 3.93215460 | ▪ පොල් තොරතුරු මධ්‍යස්ථානයේ සිවිලිම අළුත්වැඩියා කිරීමේ හා පැරණි කාපට් ඉවත් කර ටයිල් ඇතිරීමේ කටයුතු අවසන් කොට මුදල් ගෙවා වැඩ අවසන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| **ක්‍රියාත්මක ආයතනය - වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ පොල් හා කුඩා වැවිලි බෝග සංවර්ධන අංශය** | | | |
| පොල් වතු ආශ්‍රිත නිෂ්පාදනවලින් නවෝත්පාදන බිහි කිරීම සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම. | 0.1978 | - | ▪ මාර්ග සිතියම සකස් කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය විය. |
| පොල් ක්ෂේත්‍රය සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම. | 1.30370643 | 0.265191 | ▪ අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතන සමඟ සාකච්ඡා පවත්වා Unido හා IPS ආයතනය මඟින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදි. |
| **කුඩා වැවිලි භෝග ක්ෂේත්‍රය** | | | |
| **ක්‍රියාත්මක ආයතනය - වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ පොල් හා කුඩා වැවිලි බෝග සංවර්ධන අංශය** | | | |
| අපනයන කෘෂි බෝග හා කජු බෝගයේ අගයදාම සංවර්ධනය | 1.80 | 0.750942 | ▪ සුළු අපනයන බෝග අගයදාම සංවර්ධනයේ යෙදී සිටින පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා වට 04 ක් පවත්වා ඇත.<br>▪ කජු හා ආනයනික කෘෂි භෝග සඳහා මාර්ගගත සිතියමක් සකස් කිරීම අවසන් කර ඇත. ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව (IPC) ගේ 52 වන සමුළුව පවත්වා ඇත.<br>▪ කජු සංස්ථාවේ නිලධාරින් සඳහා යහපත් කෘෂිකාර්මික පුරුදු (GAP) සහතිකකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.<br>▪ කෑගල්ල දිස්ත්‍රික්කයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා "රන් අන්නාසි" (Golden Pineapple) සඳහා භූගෝලීය තත්ව සහතිකය (GI) ලබාගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා ඇත. |
| අපනයන කෘෂි කලාප ව්‍යාපෘතියේ අතැති බිල්පත් පියවීම. | 1.550510 | 1.550510 | ▪ අපනයන කෘෂි කලාප ව්‍යාපෘතියේ අතැති බිල් පියවීම සිදු කරන ලදි. |
| **ක්‍රියාත්මක ආයතනය - ශ්‍රී ලංකා කජු සංස්ථාව** | | | |
| ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පර්යේෂණ අංශයේ විද්‍යාගාර | 3.473 | 3.44753846 | ▪ විද්‍යාගාර උපකරණ 11 ක් හා කාලගුණ විද්‍යාගාර උපකරණ 12 ක් මිල දී ගැනීම අවසන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| පහසුකම් පුළුල් කිරීම. | | | ▪ විදුලි සැපයුම ලබාගැනීම හා ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපනය කිරීම අවසන් කර ඇත. |
| ශ්‍රී ලංකා කජු සංස්ථාවේ පිරිසැකසුම්කරණය සම්බන්ධයෙන් සිදුකරන පර්යේෂණ කටයුතු සඳහා විද්‍යාගාර පහසුකම් පුළුල් කිරීම. | 3.528 | 2.398966 | ▪ විද්‍යාගාර උපකරණ 15 ක් මිල දී ගැනීමට ඇණවුම බාර දී ඇත. |
| **ක්‍රියාත්මක ආයතනය - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** | | | |
| පොල් වතු ආශ්‍රිතව ඉහළ ගුණාත්මක තත්වයේ, රෝගවලින් තොර අපනයන ප්‍රමුඛ කරගත් බුලත් වගාවක් ස්ථාපිත කිරීම. | 3.16 | 1.603594 | ▪ පොලිතීන් ගෘහය සකස් කිරීම 2025 වසරේ දී අවසන් කිරීමට සැලසුම් කර ඇත.<br>▪ කපන යන්ත්‍රය මිලදී ගෙන ඇත.<br>▪ ගොවිපල උපකරණ අළුත් වැඩියා කර ඇත.<br>▪ තවාන් බඳුන් 15 ක් හා තවාන් මිශ්‍රණ ලෙස කොහුබත් කියුබ් 1/2 මිලදී ගෙන ඇත.<br>▪ ලැප්ටොප් යන්ත්‍රය මිල දී ගෙන ඇත.<br>▪ රසායනික පොහොර හා ගොම පොහොර ලබාගෙන ඇත.<br>▪ බුලත් ඉනි 1000 ක් හා මව් ශාක ක්ෂේත්‍රයේ ස්ථාපිත කර ඇත. |

## 2024 වර්ෂයේ වැවිලි අංශය ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

**තේ සංවර්ධන හා වැවිලි ප්‍රතිපත්ති අංශය**

- තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා වැවිලි අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ විද්වත් කණ්ඩායමක් විසින් සකස් කළ 2021 - 2025 වර්ෂය දක්වා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම අනුව 2024 වර්ෂයේ ද අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. 2025 – 2029 වර්ෂ සඳහා තේ ක්ෂේත්‍රයෙහි උපාය මාර්ගික සැලැස්ම තේ ක්ෂේත්‍රයේ ආයතන හා පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් සකස් කරන ලදි. අදාළ කෙටුම්පත අදහස් හා යෝජනා ඇතුළත් කර නැවත සංශෝධනය කරන ලද අතර, නැවතත් අදහස් ලබා ගැනීම සඳහා විද්‍යුත් තැපැල මඟින් සියළු පාර්ශ්වකරුවන් වෙත යොමු කර ඇත.

- “සිලෝන් ටී” සඳහා භූගෝලීය තත්ත්ව දර්ශකය (GI) ලබා ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය,

  ✓ ප්‍රංශ තාක්ෂණික ආධාර යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් කටයුතු ආරම්භ කර ඇති "සිලෝන් ටී" සඳහා භූගෝලීය තත්ත්ව දර්ශකය ලබා ගැනීමට අදාළ කටයුතු නිරන්තරයෙන් අධීක්ෂණය, සම්බන්ධීකරණය හා නියාමනය කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව, මේ වනවිට යුරෝපය තුළ ශ්‍රී ලංකා තේ සඳහා භූගෝලීය තත්ත්ව දර්ශකය අයදුම් කිරීමට අදාළ මූලික කටයුතු අවසන් කර, ඒ සඳහා ඉල්ලුම් පත්‍රය යුරෝපීය කලාපයට ඉදිරිපත් කර ඇත. සිලෝන් ටී සඳහා භූගෝලීය තත්ත්ව දර්ශක (GI)

පද්ධතියේ පාලන ලේඛනය (Control Document) සකස් කිරීම අවසන් කර ඇති අතර, ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රධාන ප්‍රාදේශීය කලාප හත (seven regions) මූලික කර ගනිමින් " පුහුණුකරුවන් සඳහා පුහුණු වැඩසටහන් " හතක් පවත්වා ඇත.

- ✓ මීට අමතරව ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය මඟින් මීට අදාළවම සිදු කරනු ලබන, ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාපවල නිපදවන තේවල භෞතික හා රසායනික පරාමිතීන් පිළිබඳ දත්ත පදනමක් සකස් කිරීමට (Geographic Indication) අදාළ කටයුතු සම්බන්ධීකරණ ද, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය (SLAEB) සමඟ එක්ව සිදුකරන සුපිරිසිදු සිලෝන් තේ සන්නාමය සඳහා ආරම්භය තහවුරු කරන **භූ පාරිසරික රසායනික සමස්ථානික සංකේතයක් සකස් කිරීමට අදාළ දත්ත එකතු කිරීමේ කටයුතු** හා ශ්‍රී ලංකාව තුළ විශේෂිත තේ නිෂ්පාදනයට සුදුසු ප්‍රභේද හඳුනාගැනීම සහ කුඩා ප්‍රමාණයේ සැකසුම් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය ද මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

- වැවිලි ක්ෂේත්‍රයට අදාළව, නෙදර්ලන්ත රජයේ ආධාර යටතේ කැළණිවැලි වතුයායේ හල්ගොල්ල වත්ත (තේ වගාව) සහ කුරුණෑගල වැවිලි සමාගමේ මුරුතැන්ගේ වත්ත (පොල් වගාව) වතු දෙකෙහි කෘෂි වන වගා වැඩසටහනක් ආරම්භ කර ඇත. සොබාදහම සංරක්ෂණ අන්තර්ජාතික සංගමය (IUCN) ආයතනය විසින් ව්‍යාපෘතියට අදාල කටයුතු සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ. ඒ අනුව මේ වනවිට අවසන් අදියරේ පවතින මෙම ව්‍යාපෘතිය 2025 වසරේ අවසන් කිරීමට නියමිත බැවින් අවසන් ව්‍යාපෘති උපදේශක කමිටුව ජනවාරි මස අවසන් සතියේදී පැවැත්වීමට සැලසුම් කර ඇත. එහිදී කෘෂි වන වගාව පිළිබඳ මාර්ගෝපදේශ අත්පොතක් නිකුත් කිරීමට අපේක්ෂිතය.

- තේ කර්මාන්තය සඳහා " ජාතික තිරසාර ජෛව ස්කන්ධ වර්ධනය සහ මූලාශ්‍ර වැඩසටහන" සම්බන්ධිකරණය කරමින්, එහි නියමු ව්‍යාපෘතිය සිදුකිරිමට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, බලංගොඩ - නිව් හෝප් වේලි, නිල්වලා, අරුණ, එවර්ග්‍රීන්, හරංගල සහ අවිස්සාවේල්ල තේ කර්මාන්තශාලා ඉදිරිපත්වී ඇති අතර, ඒවායේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වැඩමුළුවක් අතුරුගිරිය පිහිටි ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී පවත්වන ලදි. තවද මේ සම්බන්ධව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන්හට පුහුණු වැඩසටහන් පවත්වා, මාර්ගගත ක්‍රමය ඔස්සේ ද සාකච්ඡා පවත්වන ලදි. එමෙන්ම ජාතික තිරසාර ජෛව ස්කන්ධ වර්ධනය සහ මූලාශ්‍ර වැඩසටහන සඳහා වන මාර්ගෝපදේශය සමාලෝචනය සඳහා 2024 දෙසැම්බර් මස 20 වන දින අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විය. මේ වන විට නියමු ව්‍යාපෘතිය සඳහා සහභාගී වී ඇති බලංගොඩ නිව් හෝප් වේලි තේ කර්මාන්තශාලා විසින් දැව කැබලි කිරීමේ (Wood Chip) යන්ත්‍රයක් ස්ථාපනය කරමින් පවතියි.

- 2024 අප්‍රේල් මාසයේදී වැවිලි ක්ෂේත්‍රයේ පුනර්ජනනීය කෘෂිකර්මාන්තය සහ ජාතික තිරසාර ප්‍රමිති හඳුන්වා දීම සඳහා වැවිලි අමාත්‍යාංශය සහ යුනිලීවර් ශ්‍රී ලංකා (ලිමිටඩ්) ආයතනය අවබෝධතා ගිවිසුමක් අත්සන් කර, පුනර්ජනනීය කෘෂිකර්මය / කාබන් විමෝචන අගය ශූන්‍ය කිරීම, ගෝලීය වශයෙන් පිළිගත් දේශීය තිරසාර ප්‍රමිතිය සහ වන විනාශයෙන් තොර තේ සැපයීම යන ඉලක්කවලට අදාළව පහත කාර්යන් මෙම අංශයේ සම්බන්ධීකරණයෙන් ඉටුකර ඇත. ඒ අනුව ගෝලීය වශයෙන් පිළිගත් දේශීය තිරසාර ප්‍රමිතීන් හඳුන්වාදීම යටතේ තේ ක්ෂේත්‍රය සඳහාවන ප්‍රමිතීන් සකස් කිරීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හා මහජන හවුල්කාරීත්ව (PPP) ප්‍රවේශයට අනුකූලව වන වැඩසටහන මෙහෙයවීම හා අධීක්ෂණය කිරීමේ කටයුතු මෙම අංශය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, මෙම ක්‍රියාවලියට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024 දෙසැම්බර් මස 19 වනදා බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී අමාත්‍යාංශයීය ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශයීය ලේකම්, ඇතුළු අමාත්‍යාංශයීය නිලධාරීන්ගේ ද, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිලධාරීන්ගේ ද, යුනිලීවර් ශ්‍රී ලංකා ආයතනය

නියෝජනය කරමින් නියෝජිතයින්ගේ ද, තේ ක්ෂේත්‍රයේ දෙස්- විදෙස් විශේෂඥයින් ද, ඇතුළු තේ අගයදාමය නියෝජනය කරනු ලබන්නාවූ පාර්ශ්වකරුවන්ගේ ද සහභාගීත්වයෙන් පැවැත්විණි.
ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනය ( SLSI ) විසින් තේ ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් කෙටුම්පත් කර මහජන අදහස් / යෝජනා ලබා ගැනීම සඳහා යොමුකර තිබූ තේ ක්ෂේත්‍රය සඳහා වන GAP ප්‍රමිතිකරණයන් සඳහා තවදුරටත් යෝජනා හා අදහස් ලබා ගැනීම සඳහා ජනවාරි 05 වන දා දක්වා කාලය ලබාදී ඇත.

- ආසියානු සංවර්ධන බැංකුව (ADB) ණය යෝජනා ක්‍රමය සහ JFPR ප්‍රදානය (Japan Fund for prosperous and Resilient Asia and the Pacific) යටතේ වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම (SMELoC) ව්‍යාපෘතිය
  - ✓ ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයෙන් 75% ක දායකත්වය ලබා දෙන්නා වූ කුඩා හා මධ්‍ය පරිමාණ වතු හිමියන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම තුළින් තේ කර්මාන්තය දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය මඟින් පාළු සිටුවීම, නැවත තේ වගාව, නව වගාව, ජල සම්පාදනය, පැළ තවාන් සංවර්ධන සහ යාන්ත්‍රීකරණය යන සංරචකයන් සඳහා වන කෙටිකාලීන හා දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් අමාත්‍යාංශය, වැවිලි අමාත්‍යාංශය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ සුදුසුකම්ලත් මූල්‍ය ආයතන 13 ක සහයෝගීතාවයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

  - ✓ ආසියානු සංවර්ධන බැංකුව මඟින් ජපන් රජයෙන් ලැබුනු ප්‍රදානය උපයෝගී කරගෙන තේ අගයදාමය ශක්තිමත් කිරිම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින්, තාක්ෂණ තොරතුරු ලබාදෙන ජංගම යෙදවුම සහ තේ ව්‍යවසායකයින්ට වෙළඳපොළ හා විවිධ සේවා සඳහා සම්බන්ධවීමට පහසුකම් සලසාදෙන ජංගම යෙදවුම හඳුන්වාදීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

❖ **ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය**

- ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදලින් රු. බිලියන 02 ක මුදලක් රජයේ පොහොර සමාගම වන රාජ්‍ය පොහොර සමාගම වෙත ලබා දී එමඟින් 50Kg ක රසායනික පොහොර මිටියක් සඳහා රු. 4,000.00 ක සහනාධාරයක් සමස්ත තේ වගාකරුවන්ට ලබාදීමට ප්‍රතිපත්තිමය එකඟතාවයකට ගිවිසුම්ගත වීම සඳහා කැබිනට් අනුමැතිය හිමිව ඇත. මේ වන විට තේ ගොවීන්ට එම සහනදායී ක්‍රමය යටතේ පොහොර බෙදාහැරීමේ කටයුතු සිදු කරමින් පවතී.

- වැවිලි අංශයේ අවසන් කරන ලද වැවිලි ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩල සංදේශය කෙටුම්පත් කර ඉදිරිපත් කරන ලද අතර, එම වැවිලි ප්‍රතිපත්තිය අභිනව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතය.

- **2025 වර්ෂයේ දී තේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති**

❖ තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීමට ඉදිරි පස් වසර සඳහා සකස් කරන උපායමාර්ගික සැලැස්මට අනුව කටයුතු කිරීම.
  - කුඩා තේ වතු සහ මධ්‍ය පරිමාණ වතු පිහිටීම අනුව සංවිධානය කර තේ ඉඩම් හිමියන්ගේ සාමාජිකත්වය සහිත පොදු ව්‍යුහයක් ස්ථාපනය කිරීම හා ඒ යටතේ එක් එක් කර්මාන්ත ශාලාවට අදාලව දළු සපයන තේ වගාකරුවන් ඒකරාශී කොටගෙන සමාගම් පිහිටුවීම.

- නිෂ්පාදනයෙහි අඛණ්ඩ ගුණාත්මකභාවය සහ යහපත් පිළිවෙත් ආරක්ෂා කරගනිමින් ක්ෂේත්‍රයෙහි නියැළී සිටින වගාකරුවන්, නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් ඇතුළු පාර්ශ්වකරුවන්හට දිරිදීමනා ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- යුනිඩෝ ආයතනය සමඟ එක්ව සමස්ත වැවිලි ක්ෂේත්‍රය සඳහා දස අවුරුදු මාර්ග සිතියමක් සකස් කිරීම.

- බලංගොඩ ප්‍රදේශය ආශ්‍රිතව තේ වගාව සිදුකරන ප්‍රදේශයන්හි පැතිරෙන වටපණු රෝගය (නෙමටෝඩා පලිබෝධය) පැතිරීමේ ප්‍රවණතාවය හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම.

- තේ පැළවල රෝපණ ද්‍රව්‍ය සහතිකකරණ සඳහා වන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

**රබර් හා කුරුඳු ක්ෂේත්‍රය**

❖ නව කුරුඳු සංවර්ධන පනත සකස් කිරීම - නීති කෙටුම්පත් සම්පාදකගේ සංශෝධන සඳහා මෙම අමාත්‍යාංශය සහ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අදාළ නිරීක්ෂණ ලබා දීමට කටයුතු කිරීම.

❖ යුරෝපා සංගමයේ වන හානි රෙගුලාසි (The EU Deforestation – Free Regulation - EUDR) අනුව අපනයනකරුවන් සඳහා අමාත්‍යාංශ මට්ටමින් දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ග සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ කටයුතු සිදු කිරීම.

❖ වැවිලි අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව රබර් ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතුවලට අවශ්‍ය රබර් ඉඩම් ඩිජිටල්කරණය කිරීම සඳහා ආරම්භ කර ඇති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

❖ ස්වාභාවික රබර් නිපදවන රටවල සංගමය (ANRPC) විසින් සංවිධානය කරන ලබන වැඩසටහන් සඳහා සහභාගී වීම සහ එහි කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

❖ අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ලියාපදිංචි රබර් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරනු ලබන සමාගම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය දේශීය වශයෙන් සපයා ගැනීමට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

❖ රබර් කර්මාන්ත මහ සැලැස්ම සමාලෝචනය කර ප්‍රමුඛතාව මත හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. ඒ අනුව, 2024 වර්ෂය තුළ පහත දක්වා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

  - මොණරාගල,අම්පාර සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි රබර් නව වගාව ස්ථාපනය කිරීම.

  - කිරි කැපීම අත්හැර දමා ඇති රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල පරිණත වගා ඉඩම් නැවත කිරි කැපීමට යොමු කිරීම.

  - අම්පාර දිස්ත්‍රික්කයේ පන්නලගම (දකුණ) ප්‍රදේශයේ නව රබර් වගාව සඳහා වන සතුන්ගෙන් සිදු වන හානි වලක්වා ගැනීමට උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම.

❖ මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර සහ මැදගම රබර් සංවර්ධන නිලධාරි කොට්ඨාසවල කුඩා රබර් වතු හිමියන් 6,000 ක් සඳහා ධාරිතා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (RIVER) ක්‍රියාත්මක කිරීම. ප්‍රංශයේ KSAPA සමාගම සහ Micheling Lanka (Pvt) Ltd ඒකාබද්ධ වී ප්‍රංශ රජයේ ප්‍රදානයක් ලෙස ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය මේ වන විට ක්‍රියාත්මක අදියර යටතේ කුඩා රබර් වතු හිමියන් සඳහා පුහුණු සැසි ආරම්භ කර ඇත.

**පොල් ක්ෂේත්‍රය**

- ❖ පොල් ක්ෂේත්‍රයේ උපරිම වාසි ලබා ගත හැකි වන පරිදි වගාකරුවාගේ සිට අපනයනකරුවා දක්වා සමස්ත අගයදාමයම (Value Chain) ඇතුළත් වන පරිදි ඔවුන්ගේ කාර්යභාරය හා වගකීම නිශ්චිතව දැක්වෙන පරිදි වසර 10 ක මාර්ග සිතියමක් සකස් කිරීම.

- ❖ වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය පාලනය කිරීමට අදාළව පොල් පර්යේෂණායතයේ හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ කාර්යභාරය නියාමනය කිරීම.

- ❖ පොල් වගාවෙහි රෝග හා පළිබෝධ හානි සහ වන සත්ව හානි අවම කිරීමට ඊට අදාළ සියළු පාර්ශ්ව සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙළක් සකස් කිරීම.

- ❖ ජාත්‍යන්තර පොල් ප්‍රජාව (ICC) සමඟ කටයුතු සිදු කිරීම හා 2024 වර්ෂයේදී ජාත්‍යන්තර පොල් ප්‍රජාවෙහි 60 වෙනි සංවත්සරය පැවැත්වීම සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- ❖ තල් හා කිතුල් කර්මාන්ත සංවර්ධනයට අදාළව එම ආයතන සමඟ ඒකාබද්ධව වැඩපිළිවෙළක් සකස් කිරීම.

- ❖ තැඹිලි සඳහා භූගෝලීය දර්ශක පද්ධති සහතිකය (GI) ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

- ❖ දේශීය පොල්තෙල් කර්මාන්ත ආරක්ෂා කිරීමට පියවර ගැනීම යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. එහි අනුමැතිය පරිදි,
  - දේශීය පොල්තෙල් නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය පොල් සංවර්ධන අධිකාරියේ පරීක්ෂණාගාර මඟින් පරීක්ෂාවට ලක් කිරීම. එමෙන්ම උක්ත පොල්තෙල් කර්මාන්තය සඳහා පොල් සංවර්ධන අධිකාරිය නිර්දේශ කරන තත්ත්ව සහතික ලබාගත් පසු පොල් සංවර්ධන අධිකාරියේ සහතිකලත් දේශීය පොල්තෙල් ලෙස ලාංඡනයක් සහිතව වෙළඳපොළට හඳුන්වාදීමට (Coconut Development Authority (CDA) Approved) කටයුතු කරමින් පවතී.
  - පොල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සම්බන්ධයෙන් නියාමනයන් සිදුකිරීම යන මැයෙන් කෙටුම්පත් කරන ලද ගැසට් පත්‍රයක් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. මීට අමතරව පහත සඳහන් කෙටුම්පත් හතර ද සම්පාදනය කර අනුමැතියට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.
    - I. පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන, නව නිෂ්පාදකයන් සහ නව මොල්කරුවන් ලියාපදිංචි කිරීම.
    - II. පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන: නිෂ්පාදකයන් හා මොල්කරුවන් වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සහ ලියාපදිංචි සහතිකය අහෝසි කිරීම.
    - III. පොල් හා පොල් ආශ්‍රිත නිස්පාදන අපනයනකරුවන්ට බලපත්‍ර ලබාදීම හා බලපත්‍රය අවලංගු කිරීම හා අත්හිටුවීම.
    - IV. පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මක ප්‍රමිතීන් නිර්ණය

**සැලසුම් අංශය**

- ❖ අමාත්‍යාංශයීය ප්‍රකාශන සැකසීම.
  - අමාත්‍යාංශයීය කාර්ය සාධන වාර්තාව - 2023 සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.
  - වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ දත්ත ඇතුළත් සංඛ්‍යා ලේඛන අත්පොත - 2022 නිකුත් කිරීම.

- ❖ ක්‍රියාත්මක සැලසුම් සැකසීම
  - අමාත්‍යාංශයීය ක්‍රියාත්මක සැලැස්ම 2024 හා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්ම සැකසීම.

- අමාත්‍යාංශය සඳහා සෘජුව ප්‍රතිපාදන ලැබෙන සංවර්ධන ව්‍යාපෘතීන්හි ක්‍රියාත්මක සැලසුම් හා සංශෝධිත ක්‍රියාත්මක සැලසුම් සැකසීම.
- අනුබද්ධ ආයතනයන්හි ක්‍රියාත්මක සැලසුම් සමාලෝචනය හා ප්‍රගතිය පිළිබඳ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

❖ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

- වැවිලි ක්ෂේත්‍රයට ප්‍රතිපාදන වෙන් වූ ව්‍යාපෘතීන් හි ප්‍රගතිය ඇතුළත් මාසික වාර්තා බාහිර අමාත්‍යාංශ හා ආයතන වෙත යොමු කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වැවිලි ක්ෂේත්‍රයේ කාර්යසාධනය සහ වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ අර්ධ වාර්ෂිකව තොරතුරු හා දත්ත වාර්තා කිරීම.
- වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රගතිය ඇතුළත් මාසික වාර්තා මහා භාණ්ඩාගාරය වෙත හා වෙනත් අදාළ ආයතන වෙත යොමු කිරීම.

❖ වෙන්දේසි මිල ගණන් පිළිබඳ සමාලෝචන සතිපතා වාර්තා සැකසීම

- තේ, පොල්, රබර්, කුරුඳු හා ගම්මිරිස් හි වෙන්දේසි මිල ගණන් ඇතුළත් වාර්තාවක් සතිපතා සකසා ඉදිරිපත් කිරීම.

පාලන අංශය

❖ 2023 ඔක්තෝබර් මස රාජ්‍ය වැවිලි ව්‍යවසාය හා ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය පිහිටුවීමත් සමඟ ඔවුන් සඳහා කාර්යාලයීය ඉඩ පහසුකම් සැපයීම සඳහා සෙත්සිරිපාය II අදියරේ 3C පර්යන්තයේ පිහිටුවා තිබූ කුඩා වැවිලි භෝග සංවර්ධන අංශය එම පර්යන්තයෙන් ඉවත් කර රාජ්‍ය වැවිලි ව්‍යවසාය හා ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශය වෙත ලබාදීමට කටයුතු කිරීම සහ කුඩා වැවිලි භෝග සංවර්ධන අංශය 2C පර්යන්තයේ ස්ථානගත කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර සැලසුම ප්‍රතිසංවිධානය කර කාර්යාල අවකාශයන් ලබා දී කාර්යාල කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කිරීම.

❖ වැවිලි කර්මාන්ත අංශයට අනුමත රියදුරු හා කාර්යාල කාර්ය සහායක, කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු සඳහා බහුකාර්ය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී රියදුරන් 09 ක් හා කාර්යාල කාර්ය සහායකවරුන් 12 ක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා රියදුරන් 07 ක් හා කාර්යාල කාර්ය සහායකවරුන් 06 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම.

❖ ක්‍රියාවලි නැවත සැකසීමේ (Process Re -Engineering ) වැඩසටහන අඛන්ඩව ක්‍රියාත්මක කරමින් අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන මඟින් ලබාදෙන සේවාවන් කඩිනමින් හා වඩා කාර්යක්ෂමව ලබාදීමට කටයුතු සිදු කරමින් පවතී.

❖ ඉඩම් පවරා ගැනීම හා ඉඩම් බැහැර කිරීම සම්බන්ධව ඉඩම් ආශ්‍රිත කටයුතු සඳහා පාලන අංශය තුළ පිහිටුවා ඇති ඉඩම් ඒකකය නිසි පරිදි පවත්වාගෙන යමින් ඉඩම් ගැටලු විසඳීමට කටයුතු කිරීම.

- ❖ අමාත්‍යාංශය තුළ තොරතුරු තාක්ෂණය පදනම් වු සේවා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා 2024 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂවරයෙකුගේ සේවය ලැබී ඇති බැවින් වඩා පුළුල් අන්දමින් තොරතුරු තාක්ෂණය සම්බන්ධ ක්‍රියාවන් සිදුකරගෙන යාම.

**වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය**

- ❖ වැවිලි සමාගම්හි බදු කුලී අය කිරීමේ ප්‍රගතිය (2024.12.31 දිනට)

| අනු අංකය | විස්තරය | මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | 2024 මූල්‍ය වර්ෂය සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් එකතු කිරීමට ඇස්තමේන්තු කරන ලද බදු කුලිය | 2,257.51 |
| 02 | 2024 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අය කරන ලද පසුගිය වර්ෂවලට අදාල හිඟ බදු කුලිය | 260.64 |
| 03 | 2024 වර්ෂයට අදාලව 2024.12.31 දක්වා අය කරන ලද මෙම වර්ෂය සඳහා බදු කුලිය | 1,772.60 |
| | 2024.12.31 දක්වා එකතු කරන ලද සමස්ත බදු කුලිය | **2,033.24** |

**විගණන අංශය**

- ❖ 2024 වර්ෂය සඳහා කළමනාකරණ විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.
- ❖ අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධයෙන් සිදුකර ඇති විගණන වාර්තා සංඛ්‍යාව 12 කි.
- ❖ අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල කටයුතු සම්බන්ධයෙන් නිකුත් කර ඇති විමර්ශන හා විගණන වාර්තා සංඛ්‍යාව පහත පරිදි වේ.

| අනුබද්ධ ආයතනයන්හි විගණන කටයුතු සංඛ්‍යාව | | |
|---|---|---|
| ආයතනය | විගණන/විමර්ශන වාර්තා ගණන | |
| | විගණන වාර්තා | විමර්ශන වාර්තා |
| කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය | 01 | - |
| ශ්‍රී ලංකා කජු සංස්ථාව | 02 | - |
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 01 | - |
| තල් සංවර්ධන මණ්ඩලය | 02 | - |
| පොල් සංවර්ධන අධිකාරිය | 01 | - |
| පොල් වගාකිරීමේ මණ්ඩලය | 02 | - |
| කප්රුක අරමුදල | 02 | - |
| **එකතුව** | **11** | - |

**මූල්‍ය අංශය**

**මූල්‍ය ප්‍රගතිය 2024.12.31 දිනට**

| විස්තරය | කාණ්ඩය | අනුමත ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | අතැති බිල් (රු.මි.) |
|---|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | ප්‍රාග්ධන | 6.00 | 3.91 | - |
| | පුනරාවර්තන | 36.62 | 23.25 | - |
| අමාත්‍යාංශය (පරිපාලන) | ප්‍රාග්ධන | 41.00 | 22.79 | - |
| | පුනරාවර්තන | 1,016.99 | 832.24 | - |

| විස්තරය | කාණ්ඩය | අනුමත ප්‍රතිපාදන (රු.මි.) | අක් මුදල් ලැබීම් (රු.මි.) | වියදම (රු.මි.) | අතැති බිල්පත් (රු.මි.) |
|---|---|---|---|---|---|
| විශේෂ ව්‍යාපෘති (විදේශ ආධාර ලබන ව්‍යාපෘති ඇතුළත්ව) | ප්‍රාග්ධන | 2,185.26 | 1,498.87 | 1,498.87 | - |
| | පුනරාවර්තන | 13.00 | 9.62 | 9.62 | - |
| අනුබද්ධ ආයතන (දෙපාර්තමේන්තු ද, ඇතුළත්ව) | ප්‍රාග්ධන | 1310.00 | 1,258.59 | 1,258.59 | - |
| | පුනරාවර්තන | 2,748.26 | 2,710.67 | 2,710.67 | 23.31 |

**වැවිලි ක්ෂේත්‍රයේ කාර්ය සාධනය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම 2024.12.31 දිනට ප්‍රගතිය**

| අංකය | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ නම | තීරණය | ප්‍රගතිය |
|---|---|---|---|
| තේ සංවර්ධන හා වැවිලි ප්‍රතිපත්ති සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ | | | |
| 27/2024 | තේ වගාව පුනරුත්ථාපනය උදෙසා තේ වගාකරුවන්ට පොහොර සහනාධාරයක් ලබාදීම. | සංදේශයේ 3 ඡේදයේ සඳහන් (3.1) සිට (3.4) දක්වා වන යෝජනා ක්‍රියාත්මක කිරීම පිණිස අනුමැතිය ලබා දී ඇත. තවද මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණවල අවසන් ඡේදයේ දක්වා ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් යොමු කර ඒ අනුව පියවර ගැනීමට ලේකම්තුමා වෙත | තේ වගාකරුවන්ට පොහොර සහනාධාර ලබාදීම සඳහා රාජ්‍ය පොහොර සමාගම වෙත 2024.09.27 වන විට රු.මි.360.78ක මුදලක් ගෙවා ඇත. (2024.10.08 දින වන විට ගෙවා ඇති මුළු මුදල රු.මි. 538.78 ක් වේ.) |

| | | | |
|---|---|---|---|
| | | නියම කිරීමට අනුමැතිය ලැබී ඇත. | |
| 29/2024 | ශ්‍රී ලංකාවේ තේ අස්වැන්න සහ එහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම. | මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමා විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණවල අවසන් ඡේදයේ දක්වා ඇති පරිදි සංදේශයේ 3 ඡේදයේ සඳහන් යෝජනාවලට අදාළ විෂය පථය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය මූල්‍ය අවශ්‍යතාව සහ අධීක්ෂණය හා මෙහෙයවීම පිළිබඳ තොරතුරු ඇතුළත් සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් ඇගයීම පිණිස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සහ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් සලකා බැලීම පිණිස ඇමතිතුමා මඟින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලැබී ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අදාල විෂය පථය, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය, මූල්‍ය අවශ්‍යතාව සහ අධීක්ෂණය හා මෙහෙයවීම පිළිබඳ තොරතුරු ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ ආකෘතියට අනුව ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දැනුම් දී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය වාර්තාව ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් සකස් කරමින් පවතී. |
| 22/2024 | වෘත්තීය තේ රස පරීක්ෂකයන්ගේ සාමාජිකත්වය හඳුන්වාදීම. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලා ඇති අතර, මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකී නිරීක්ෂණවල දක්වා ඇති කරුණු කෙරෙහි සැලකිල්ලක් යොමු කරමින් ඒ අනුව පියවර ගන්නා ලෙස ලේකම්තුමාට නියම කර ඇත. | මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය 2024.09.06 වන දින අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කර ඇති අතර සිදු වූ අමාත්‍ය මණ්ඩල වෙනස හේතුවෙන් මේ සඳහා නව අමාත්‍යවරයාගේ අත්සනින් සංශෝධිත අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. |
| 32/2024 | දීර්ඝකාලීන බදු ඔප්පුවක් ලබාගැනීම. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උතුරු පළාත් උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, කොට්ටව | අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් යෝජනා සම්බන්ධයෙන් මුදල් ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදන සැලසුම් සහ සංචාරක ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලා ඇත. අදාළ නෛතික විධිවිධාන අනුගමනය කිරීමට යටත්ව සහ දෙපාර්ශ්වය විසින් එකඟවනු ලබන කාල සීමාවක් සඳහා සංදේශයේ සඳහන් ඉඩම් කොටස් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ දකුණු පළාත් උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම | අමාත්‍ය මණ්ඩල තීරණය පිළිබඳව තේ පර්යේෂණ ආයතනය වෙත දන්වා යවා ඇත. |

| | | | |
|---|---|---|---|
| | | පිණිස රජයේ ඉඩම් නියෝග 199 හි දක්වා ඇති පරිදි අනුග්‍රාහික (වරණීය) පදනමින් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය වෙත දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීම පිණිස අනුමැතිය ලබාදීමට සහ මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක ඇමතිතුමා විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණවල දක්වා ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් යොමු කර, ඒ අනුව අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට නියම කිරීමට අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත. | |
| 37/2024 | පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් තේ ශක්ති අරමුදලෙහි කර්මාන්තශාලා බදුගත පාර්ශ්වයන් සහ කළමනාකරණය භාරගත් පාර්ශ්වයන්ට සහන සැලසීම. | සංදේශයේ යෝජිත පරිදි කටයුතු කිරීම වෙනුවට මුදල් ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදන සැලසුම් සහ සංචාරක ඇමතිතුමාගේ නිරීක්ෂණවල ඇති විධිවිධාන ඇතුළත් කරමින් තේ ශක්ති අරමුදලේ කර්මාන්තශාලා 12 ක් මාවරල වත්ත සහ පොහොර ගබඩාව පවරා ඇති බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති බදු ගිවිසුම්වල වගන්ති සංශෝධනය කිරීම පිණිස අනුමැතිය ලබා දී ඇත.<br><br>තවද සංදේශයේ දැක්වෙන යෝජනා සම්බන්ධයෙන් මුදල් ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදන සැලසුම් හා සංචාරක ඇමතිතුමාගේ නිරීක්ෂණවල කරුණු සැලකිල්ලට ගෙන ඒ අනුව පියවර ගන්නා ලෙසත් ලේකම් වෙත නියම කර ඇති අතර, සංදේශයේ යෝජිත පරිදි කටයුතු කිරීම පිණිස ලේකම්තුමා වෙත බලය පවරා ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය පිළිබඳ තේ සංවර්ධන සහ ප්‍රතිපත්ති අංශය දැනුවත් කර ඇත. |
| 05/2024 | 2015 වාර්ෂික වාර්තාව -තේ ශක්ති අරමුදල | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලැබී ඇත. | වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 19/2024 | ජාත්‍යන්තර පොල් ප්‍රජාවගේ 60 වැනි සැසිවාරය හා අමාත්‍ය හමුව 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පැවැත්වීම. | මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ සහ විදේශ කටයුතු ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලා මහා භාණ්ඩාගාරයට කිසිඳු වැය බරක් නොවන අයුරින් සංදේශයේ යෝජිත පරිදි ජාත්‍යන්තර පොල් ප්‍රජාවගේ (ICC) 60 වැනි සැසිවාරය සහ අමාත්‍ය හමුව 2024 වර්ෂයේ නොවැම්බර් මස කොළඹදී පැවැත්වීම සඳහා අනුමැතිය ලබාදීමට තීරණය කර ඇත. | මෙම සමුළුව 2024 නොවැම්බර් මස 25 සිට 28 දක්වා සාර්ථක ලෙස පවත්වා අවසන් කර ඇත. |
| 23/2024 | කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අතර උපකරණ පැවරීම පිළිබඳ ගිවිසුමක් අත්සන් කිරිමට අනුමැතිය ලබාගැනීම. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ සහ විදේශ කටයුතු ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලා උපකරණ පැවරීම සම්බන්ධයෙන් වන ගිවිසුම කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අතර අත්සන් තැබීමට අනුමැතිය ලබා දී ඇත. තවද මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමා විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණවල ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින් ඒ අනුව පියවර ගන්නා ලෙස අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට නියම කරන මෙන් ලේකම්තුමා වෙත උපදෙස් දී ඇත. | උපකරණ පැවරීම පිළිබඳ වන ගිවිසුම 2024 සැප්තැම්බර් මස 04 වන දින අත්සන් කරන ලදී. |
| 01/2024 | වාර්ෂික වාර්තාව 2022 - ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලැබී ඇත. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. |
| රබර් හා කුරුඳු සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ | | | |
| 06/2024 | 1956 අංක 11 දරන රබර් පාලන පනත සංශෝධනය | සංදේශයට යා කොට තිබූ රබර් පාලන පනත (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා සහ එහි සඳහන් පරිදි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන එකී පනත් කෙටුම්පත ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. | වර්තමාන අමාත්‍ය ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමාගේ අත්සනින් නැවත එම ලේඛන සභානායක කාර්යාලයට යොමු කිරීමට සිදු වන බැවින් ඒ සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| 21/2024 | ශ්‍රී ලංකාවේ තාක්ෂණික පිරිවිතර රබර් කර්මාන්තශාලා සඳහා අපනයන සැකසුම් සිදු කිරීමට තාවකාලික ආනයනය (TIEP) යෝජනා ක්‍රමය යටතේ මුදවන ලද රබර් (Cup lumps) කිරීම ආනයනය කිරීම සඳහා අවසර ලබාදීම. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/1378/612/059 වූ 2024.06.11 දින ඉදිරිපත් කරන ලද මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදි. මේ පිළිබඳව සාකච්ඡා කර බලා එකී නිරීක්ෂණවල දක්වා ඇති පරිදි පියවර ගැනීමට යටත්ව, සංදේශයේ යෝජනා සඳහා අනුමැතිය ලබාදීමට තීරණය කර ඇත. | අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ලබාදී ඇති නිරීක්ෂණ අනුව වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය හා තාක්ෂණික පිරිවිතර කර්මාන්තකරුවන් හා ගිවිසුම්ගත වීමට අදාලව කටයුතු සිදු කරමින් පවතියි. |
| 40/2024 | සී/ස රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව සඳහා නිසි බලධරයෙකු පත් කිරීම. | මේ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මුදල් ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදන සැලසුම් හා සංචාරක ඇමතිතුමාගේ නිරීක්ෂණ කෙරෙහි නිසි සැලකිල්ලක් යොමු කරමින් ඒ අනුව නොපමාව අවශ්‍ය පියවර ගන්නා ලෙස ලේකම්තුමා වෙත නියම කිරීමට තීරණය කර ඇත. | අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් යෝජනා සඳහා අනුමැතිය ලැබී ඇත. |
| පොල් ක්ෂේත්‍රය සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ | | | |
| 31/2024 | දේශීය පොල්තෙල් කර්මාන්තය ආරක්ෂා කිරීමට පියවර ගැනීම. | මේ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව සංදේශයේ 3 ඡේදයේ 3.1 සහ 3.2 අනු ඡේදයන්හි යෝජිත පරිදි කටයුතු කිරීමටත්, සංදේශයේ 3 ඡේදයේ 3.3 සහ 3.5 අනු ඡේදයන්හි සඳහන් යෝජනා සම්බන්ධයෙන් වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා ඇමතිතමා විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණවල 3.3 හා 3.5 ඡේදයන්හි දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන ඒ අනුව කටයුතු කිරීමටත් 3.4 අනු ඡේදයේ සඳහන් යෝජනාව සම්බන්ධයෙන් මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීක්ෂණවල දක්වා ඇති පරිදි පියවර ගැනීමටත් අනුමැතිය ලබා දී ඇත. | දේශීය පොල්තෙල් නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය පොල් සංවර්ධන අධිකාරියේ පරීක්ෂණාගාර මඟින් පරීක්ෂාවට ලක් කිරීමට සහ පොල්තෙල් කර්මාන්තායතන සඳහා පොල් සංවර්ධන අධිකාරිය නිර්දේශ කරන තත්ත්ව සහතික ලබාගත් පසු පොල් සංවර්ධන අධිකාරියේ සහතිකලත් දේශීය පොල්තෙල් ලෙස ලාංඡනයක් සහිතව වෙළඳපොළට හඳුන්වා දීමට (Coconut Development Authority - CDA Approved) වැඩපිළිවෙළක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. |
| 08/2024 | වාර්ෂික වාර්තාව 2022 - පොල් පර්යේෂණ ආයතනය | වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලැබී ඇත. | 2022 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. |

| සුළු අපනයන භෝග සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ | | | |
|---|---|---|---|
| 07/2024 | දේශීය පරිභෝජනය සඳහා ලෙලි කජු ආනයනය කිරීම. | | 2023 දෙසැම්බර් සිට 2024 ජුනි මස 30 දක්වා කාලය තුළ දී ලෙලි කජු මෙ.ටො 545.69 ක් ආනයනය කිරීමට අනුමැතිය ලබා දී ඇත. |
| 09/2024 | ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව (IPC) මඟින් වාර්ෂිකව පවත්වන අන්තර්ජාතික සමුළුව 2024 දී ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමට අනුමැතිය ලබා ගැනීම. | ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාවේ 52 වන අන්තර්ජාතික සමුළුව 2024 වසරේ දී ශ්‍රී ලංකාවේ පැවැත්වීම සඳහා සහ සංදේශයේ යෝජනා සඳහා අනුමැතිය ලැබී ඇත. | මෙම සමුළුව 2024 නොවැම්බර් මස 25 සිට 28 දක්වා සාර්ථක ලෙස පවත්වා අවසන් කර ඇත. |
| 18/2024 | දේශීය පරිභෝජනය සඳහා ලෙලි කජු ආනයනයට අනුමැතිය ලද ආනයනකරුවන් සඳහා 2024.04.30 දින සිට 2024.06.30 දින දක්වා ලෙලි කජු රට තුළට ගෙන ඒම සඳහා සහන කාලයක් ලබා දීම. | 2024.05.16 දිනැති සංදේශය-(අමප 24/0189/612/015 පිළිබඳව වූ 2024.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලා එකී නිරීක්ෂණවල දක්වා ඇති පරිදි කටයුතු කිරීමට යටත්ව සංදේශයේ 3 ඡේදයේ 3.1 අනු ඡේදයේ සඳහන් පරිදි පියවර ගැනීම සඳහා අනුමැතිය ලබා දීමට තීරණය කර ඇත. | 2023 දෙසැම්බර් සිට 2024 ජුනි දක්වා කාලය තුළ ලෙලි කජු මෙ.ටො 459.69 ක් ආනයනය කිරීමට අනුමැතිය ලබා දී ඇත. |
| 25/2024 | දේශීය කර්මාන්ත අවශ්‍යතාවය වෙනුවෙන් අමු ඉඟුරු ආනයනය සඳහා අනුමැතිය ලබා ගැනීම. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමාගේ නිරීක්ෂණ සලකා බලා 24/1335/610/051 පිළිබඳ වූ 2024.07.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ පරිදි අදාල වාර්තාව සිය අමාත්‍යවරුන් මඟින් ඒකාබද්ධ සංදේශයක් වශයෙන් නොපමාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අමාත්‍යාංශයේ ලේකම්ට සහ වෙළෙඳ වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්ට නියම කර ඇත. | මෙම ආනයනික ක්‍රියාවලිය සිදු කිරීම සඳහා අවශ්‍ය මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| 33/2024 | දේශීය ඉඟුරු නිෂ්පාදනය සහ මිල නියාමනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම. | සංදේශයේ යෝජනා සඳහා සහ ඉදිරිපත් කළ වාර්තාවේ නිර්දේශයේ දැක්වෙන පරිදි කටයුතු කිරීම සඳහා අනුමැතිය දී ඇත. 2024.08.12 දින මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණවල අවසන් ඡේදයේ දක්වා ඇති පරිදි 2025 - 2030 කාලය තුළ තිරසර අයුරින් දේශීය ඉඟුරු නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා පුළුල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ලේකම්තුමා වෙත නියම කිරීමට අනුමැතිය ලබා දී ඇත. | මෙම ආනයනික ක්‍රියාවලිය සිදු කිරීම සඳහා අවශ්‍ය දත්ත මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. |
| 14/2024 | ශ්‍රී ලංකා කජු සංස්ථාව 2019 - වාර්ෂික වාර්තාව | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලැබී ඇත. | 2019 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. |
| 15/2024 | ශ්‍රී ලංකා කජු සංස්ථාව 2020 - වාර්ෂික වාර්තාව | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලැබී ඇත. | වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. |
| ආයතනික කටයුතු සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ | | | |
| 04/2024 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ චන්දිම මුහන්දිරම්ගේ මහතා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම. | මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (රබර් සහ කුරුඳු සංවර්ධන) ලෙස සේවය කරන සී.සී මුහන්දිරම් මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීමට තීරණය කර ඇත. | 2021.01.31 දින සිට සී.සී මුහන්දිරම් මහතා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කර ඇත. |
| 16/2024 | පොල් පර්යේෂණ ආයතනයේ පටක රෝපණ අංශයේ අංශ ප්‍රධානී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත ආචාර්ය වී. ආර්. එම්. විදානආරච්චි මහත්මිය පත් කිරීම. | වහාම ක්‍රියාත්මක වන පරිදි එක් අවුරුද්දක් සඳහා කොන්ත්‍රාත් පදනම මත එකී තනතුරේ නැවත සේවයේ යෙදීම සඳහාත්, එතුමිය විශ්‍රාම ලද අවස්ථාවේ මාසික වැටුපට සමාන මාසික දීමනාවක් ගෙවීම සහ තනතුරට අදාල අනෙකුත් පහසුකම් සලසා දීම සඳහා අනුමැතිය ලබා දී ඇත. | 2024.06.13 සිට වසරක කාලයක් (කොන්ත්‍රාත් පදනම මත) ඒ මහත්මිය පොල් පර්යේෂණ ආයතනයේ පටක රෝපණ අංශයේ අංශ ප්‍රධානී ලෙස බඳවාගෙන ඇත. |
| 26/2024 | තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත ආචාර්ය මොහොට්ටි මහතා පත් කිරීම. | 2022.10.06 දිනැති ව්‍යාපාර චක්‍රලේඛ අංක 06/2022 අනුව රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 ලෙස නියම කර ඇති බැවින් එම අමාත්‍ය මණ්ඩල | අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි කටයුතු කරමින් අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත් කිරීම සඳහා |

| | | | |
|---|---|---|---|
| | | සංදේශයේ සඳහන් පරිදි විශ්‍රාම ගැන්වීම පිළිබඳ රජයේ පොදු ප්‍රතිපත්තියෙන් බැහැරව එක් එක් නිලධාරියෙක් සම්බන්ධයෙන් පමණක් සලකා බලා කටයුතු කිරීම රාජ්‍ය සේවයට වැරදි පූර්වාදර්ශයක් වනු ඇති බවත් අධ්‍යක්ෂ තනතුර සඳහා එම බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසු නිලධාරියෙක් කඩිනමින් බඳවා ගැනීමටත්, එතෙක් එම තනතුරේ වැඩ බැලීම සඳහා තේ පර්යේෂණ ආයතනයේ රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වැඩබැලීමේ පදනමින් පත් කිරීම තුළින් කළමනාකරණය කර ගැනීමටත් මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව කටයුතු කිරීමට අනුමැතිය දී ඇත. | පුවත්පත් දැන්වීමක් පළ කිරීමෙන් පසු අයදුම්පත් කැඳවා 2024.09.06 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඇත. එහෙත් ස්ථිර පදනමින් නිලධාරියෙකු බඳවාගෙන නොමැති අතර, රාජකාරී ආවරණය කිරීම නිලධාරියෙකු මඟින් සිදු කරයි. |
| 30/2024 | තුරුසවිය අරමුදල සඳහා නිසි බලධාරිවරයෙක් පත් කිරීම. | | මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලයේ සාකච්ඡාවට ගෙන නොමැති බව අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් දන්වා ඇත. |

# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල
# 2024.12.31 දිනට ප්‍රගතිය
## වැවිලි අංශය
## තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය

**දැක්ම**

තේ, රබර් සහ පොල් වගාවන් සුරක්ෂිත කිරීම මඟින් සෞභාග්‍යමත් ආර්ථිකයක්

**මෙහෙවර**

තේ, රබර් සහ පොල් වතු ආරක්ෂා කිරීම මගින් වැවිලි කර්මාන්තයේ ඵලදායීතාවය, ලාභදායීතාව සහ තිරසාරත්වය ඉහළ නැංවීමට සහය ලබාදීම.

- **2024.12.31 දිනට අයදුම්පත් ලැබීම**

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ලැබුණු අයදුම්පත් ගණන | 845 |
| පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන | 12 |
| පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත් | 642 |
| පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල මඟින් අනුමත කරන ලද අයදුම්පත් | 590 |
| ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් | 5 |
| ක්ෂේත්‍ර පරීක්ෂණ/ නීති උපදෙස් / වාර්තා ලබා ගැනීමට තීරණය වූ අයදුම්පත් ගණන | 31 |
| පනතට අදාල නොවන අයදුම්පත් | 16 |

- **දිස්ත්‍රික්ක අනුව ලැබී ඇති අයදුම්පත් පිළිබඳ විස්තරය (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 294 |
| පුත්තලම දිස්ත්‍රික්කය | 238 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 129 |
| ඉහත දිස්ත්‍රික්ක හැර අනෙකුත් දිස්ත්‍රික්ක | 184 |
| ලැබුණු මුලු අයදුම්පත් සංඛ්‍යාව | 845 |
| වාර්තා ලබා ගැනීමට යොමුකර ඇති සහ අසම්පූර්ණ අයදුම්පත් | 207 |
| පැවරීම අනවශ්‍ය බව දන්වන ලද අයදුම්පත් ගණන | 7 |
| ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව | **845** |

- **ඉඩම් ඒකක අනුව අයදුම්පත් ලැබීම (2024.01.01 සිට 2024.12.31 දක්වා)**

| ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව | පවරනු ලබන ආකාරය | ඉල්ලුම් කළ ප්‍රමාණය | | | අනුමැතිය ලබාදුන් ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|
| | | අක්. | රූඩ්. | පර්. | අක්. | රූඩ්. | පර්. |
| 115 | තනි ඒකක | 1,492 | 03 | 35.55 | 1,051 | 01 | 4.30 |
| 146 | බැංකු උකස් | 2,705 | 00 | 12.40 | 2,318 | 00 | 30.51 |
| 584 | අනෙකුත් පැවරීම් | 8,440 | 03 | 32.75 | 5,461 | 00 | 33.07 |
| **845** | **එකතුව** | **12,639** | **00** | **0.7** | **8,830** | **02** | **27.88** |

- **භෝග වර්ගයන්ට අනුව අයදුම්පත් ලැබීම**

| අයදුම්පත් ලැබීම (2024.01.01 සිට 2024.12.31 දක්වා) | | | | |
|---|---|---|---|---|
| භෝග වර්ගය | අයදුම්පත් ගණන | ඉල්ලුම් කරන ලද භූමි ප්‍රමාණය | | |
| | | අක්. | රූඩ්. | පර්. |
| පොල් | 640 | 9,345 | 00 | 7.97 |
| රබර් | 38 | 529 | 00 | 16.12 |
| තේ | 39 | 953 | 01 | 11.82 |
| වෙනත් | 128 | 1,811 | 02 | 4.79 |
| **එකතුව** | **845** | **12,639** | **00** | **0.7** |

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**දැක්ම**

ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලාංකේය තේ (සිලෝන් ටී) "වඩාත් ප්‍රියතම පානය " බවට පත් කිරීම.

**මෙහෙවර**

කර්මාන්තයේ තිරසාර සංවර්ධනය මගින් රටට ලැබෙන විදේශ විනිමය ඉපැයීම වර්ධනය කිරීම හා එමඟින් වැවිලි කර්මාන්තයේ නියැළි ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සුරක්ෂිත කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

**ස්වයං උත්පාදන**

| අනු අංකය | වැඩසටහන | ඇස්මේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධනය වියදම් | 1,204.24 |
| 02 | පුනරාවර්තන වියදම් | 670.02 |

- **ප්‍රවාරණ හා වෙළෙඳ බද්ද**

| | | |
|---|---|---|
| 03 | සංවර්ධන වියදම් (පොහොර සහනාධාරය හා තේ පර්යේෂණයේ ව්‍යාපෘතිය | 1,807.33 |
| 04 | තේ ප්‍රවාරණ පුවර්ධන වැඩසටහන | 1,710.00 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | තේ කර්මාන්තශාලා හා බලයලත් අමු තේ දළු වෙළෙඳුන් සඳහා ප්ලාස්ටික් පෙට්ටි හා ඉන්දියන් මළු මිලදී ගැනීම සඳහා සහනාධාරය | ප්ලාස්ටික් කූඩ | 7,000 | 35.00 |
| | | ඉන්දියන් බෑග් | 43,750 | |
| 02 | අධි ඝනත්ව ඍජු තේ වගාව සඳහා මූල්‍ය සහනාධාර ලබාදීමේ ව්‍යාපෘතිය | තේ පැළ | 1,000,000 | 60.00 |
| 03 | සුහුරු දළු නෙලන්නන්ගේ කණ්ඩායම් ඇති කිරීම හා කුලි පදනම මත යන්ත්‍රෝපකරණ ලබාදීම. | කණ්ඩායම් | 35 | 35.00 |
| 04 | නව තේ පැළ තවාන් ව්‍යාපෘතිය (පැළ 50,000 තවාන්) අදියර - 03 | පැළ තවාන් සංඛ්‍යාව | 70 | 17.50 |
| 05 | අතින් සාදන ලද තේ කර්මාන්තශාලා සඳහා තේ වියලුම් යන්ත්‍ර ලබාදීමේ ව්‍යාපෘතිය | යන්ත්‍ර සංඛ්‍යාව | 25 | 5.00 |
| 06 | වෙළෙඳ ප්‍රදර්ශන සහභාගීත්වය සඳහා වූ 50% සහනාධාරය | වෙළෙඳ ප්‍රදර්ශන | 10 | 100.00 |
| 07 | අගය එකතු කළ තේ අපනයනය සඳහා 5% ක දිරි දීමනා ලබාදීමේ ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් | 50 | 1,000.00 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩ සටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධනය වියදම්** | 2,378.34 | 1,132.70 | 47.63% |
| 02 | පුනරාවර්තන වියදම් | 654.77 | 531.80 | 81.22% |

(** මේ යටතේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට ගෙවීමට සැලසුම් කළ රු.මි. 600.00 මෙන්ම පොහොර සහනාධාරය සඳහා වෙන් කළ රු.මි.1,200.00 ක් ද වේ.)

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| අනු අංකය | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | * භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | තේ පැළ තවාන් ව්‍යාපෘතිය | 35.00 | 7.50 | සැලසුම් කළ තවාන් 70 න් 30 ක් සඳහා පළමු අදියර අවසන් කිරීම වෙනුවෙන් ගෙවීම් කර ඇත. |
| 02 | සෘජු තේ වගා ව්‍යාපෘතිය | 80.00 | 50.13 | හෙක්ටයාර් 78.01 ක් වෙනුවෙන් ගෙවීම් කර ඇත. |
| 03 | තේ වගාවේ පාලු සිටුවීමේ සහනාධාරය (පැරණි) | 30.00 | 18.52 | අක්කර 46.64 ක් වෙනුවෙන් ගෙවීම් කර ඇත. |
| 04 | 4.1 තේ ඉඩම් යාන්ත්‍රීකරණ සහනාධාර ව්‍යාපෘතිය (පැරණි) | 10.00 | 15.17 | අක්කර 81.77 ක් වෙනුවෙන් ගෙවීම් කර ඇත. |
| | 4.2 තේ ඉඩම් යාන්ත්‍රීකරණ සහනාධාර ව්‍යාපෘතිය (නව) | 20.00 | 14.53 | අක්කර 67.25 ක් වෙනුවෙන් ගෙවීම් කර ඇත. |
| 05 | තේ කම්හල් නවීකරණ සහනාධාර ක්‍රමය (පැරණි) | 25.00 | 5.36 | තේ කම්හල් 13 ක් සඳහා ගෙවීම් කටයුතු සිදු කර ඇත. |

- **2025 වර්ෂයේ දී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්**

❖ සුහුරු දළු නෙලන්නන්ගේ කණ්ඩායම් ඇති කිරීම හා කුලී පදනම මත යන්ත්‍රෝපකරණ ලබාදීම.

තේ කර්මාන්තයේ ප්‍රධානතම ගැටළු වන පුහුණු ශ්‍රමිකයන් හිඟ වීම හා නව ශ්‍රම බලකාය කර්මාන්තයෙන් ඉවත්ව යාම නිසා කර්මාන්තයට ඇති වන බලපෑම අවම කිරීම සඳහා කර්මාන්තශාලා පාදක කොටගත් සුහුරු දළු නෙලන්නන්ගේ කණ්ඩායම් ඇති කිරීම මෙහි අරමුණු වේ. තේ වගාවට යාන්ත්‍රීකරණය ව්‍යාප්ත කිරීම මෙහි තවත් අරමුණකි. ආරම්භයේ දි පුහුණු කණ්ඩායම් 35 ක් ඇති කිරීමට බලාපොරොත්තු වේ.

❖ සන්නාමය ප්‍රවර්ධන සහනාධාරය (2025 – 2026)

සිංහ ලාංඡනය සන්නාමය සහිත තේ ප්‍රවර්ධනය කිරීම සඳහා තේ අපනයනකරුවන්ට 50% ක මූල්‍ය සහනාධාරයක් ලබාදීමේ ව්‍යාපෘතිය 2025 /2026 ද්වි වාර්ෂික ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන අතර, ව්‍යාපෘතිය සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීමට නියමිතය.

- ❖ අගය එකතු කළ තේ සඳහා 5% ක දිරි දීමනා යෝජනා ක්‍රමය

  අගය එකතු කළ තේ අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා යෝජිත මෙම දිරි දීමනා ක්‍රමය අගය එකතු කළ තේ අපනයන ආදායමේ ඉහළ යාම මත පදනම් කරගෙන ගෙවීම් සිදු කරනු ලැබේ. 2025 වර්ෂයේදී ද මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.1,000 ක් වෙන් කර ඇති අතර, අදාල වර්ෂය සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීමට බලාපොරොත්තු වේ.

- ❖ නව තේ ව්‍යවසායකයින් ඇති කිරීම සඳහා වූ Next Gen Tea Leaders ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

  තරුණ පරපුර වැවිලි කර්මාන්තය කෙරෙහි ආකර්ෂණය කරගැනීම හා ඔවුන්ට තේ කර්මාන්තය පිළිබඳ වෘත්තීමය මාර්ගෝපදේශනය ලබාදීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය, වැවිලිකරුවන් සහ තේ කර්මාන්තශාලා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරේ.

- ❖ තේ අංශයේ නව නිපැයුම් දිරි ගැන්වීම උදෙසා සිදු කිරීමට අපේක්ෂිත "තේ නවෝත්පාදන ඇගයීමේ" වැඩසටහන

  සාම්ප්‍රදායික තේ අපනයනයෙන් ඔබ්බට තේ සඳහා නව නිෂ්පාදන මාවත් විවර කිරීම හා ඒවා මනා ව්‍යාපාරික උපයෝජන අවස්ථා ලෙස හඳුන්වාදීම උදෙසා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. ක්ෂේත්‍ර මට්ටමින් තේ කර්මාන්තශාලා, තේ ඇසුරුම්, තේ නිෂ්පාදන ඇතුළු විවිධ අංශ ඔස්සේ මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට සැලසුම් කර ඇත.

## ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

**දැක්ම**

තේ පර්යේෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ඨතමයා වෙමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නංවාලීම සඳහා අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම ලබාදෙමින් ලොව ප්‍රමුඛතම තේ නිෂ්පාදකයා බවට පත්වීම.

**මෙහෙවර**

තේ නිෂ්පාදනයේ ඵලදායීතාවය සහ ගුණාත්මක බව වඩාත් ලාභදායී ලෙස ඉහළ නැංවීම සඳහා යෝග්‍ය විද්‍යාත්මක දැනුම හා තාක්ෂණය වැඩි දියුණු කිරීම, හඳුන්වාදීම සහ ව්‍යාප්ත කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්මේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධනය වියදම් | 22.70 |
| 02 | පුනරාවර්තන වියදම් | 202.00 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|
| 01 | නැනෝ අංශුවලින් සමන්විත ජෛව අඟුරු මඟින් තේ පැළ වර්ධනයට සහ පසෙහි ගුණාත්මකභාවයට සිදු කරන බලපෑම පිළිබඳව අධ්‍යයනය සිදු කිරීම. | 20% | 17.20 |
| 02 | පාංශු ගුණාත්මය සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා පාංශු සංශෝධනයක් ලෙස ජෛව අඟුරු භාවිතය සහ තේ වගාවට දේශගුණික විපර්යාස වලින් ඇති කරන බලපෑම් අවම කරගැනීමට ස්වභාව විද්‍යාත්මක උපාය මාර්ග හඳුනාගැනීම සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම. | 20% | 26.60 |
| 03 | තේ පැළවල කෙටි කාලීන නියඟ තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඇති ශාක මත පදනම් වූ නිෂ්පාදන සංවර්ධනය කිරීම. | 25% | 18.00 |
| 04 | ශ්‍රී ලංකාවේ තේ ව්‍යවසායකත්වය සහ නවෝත්පාදන මධ්‍යස්ථානය: වෙළෙඳපොළ මත පදනම් වූ නිෂ්පාදන සංවර්ධනය සහ වාණිජකරණය | KOIKA සංවිධානයේ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කර ඇත. | |
| 05 | පළිබෝධනාශක අපද්‍රව්‍ය ඇස්තමේන්තුගත කිරීම, හඳුනාගැනීමේ ක්‍රමවේද සංවර්ධනය සම්බන්ධව විමර්ශන රසායනාගාරයක් පිහිටුවීම. | ලෝක බැංකු මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කර ඇත. | |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | | අනුමත ප්‍රතිපාදන (රු.මි.) | 2024.12.31 දිනට වියදම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | පුනරාවර්තන වියදම් | 449.43 | 448.72 | 99.84% |
| | ප්‍රාග්ධන වියදම් | 40.00 | 35.94 | 89.85% |
| උත්පාදන ආදායම් | පුනරාවර්තන වියදම් | 42.00 | 55.94 | 133% |
| | ප්‍රාග්ධන වියදම් | | | |

සටහන

* අක් මුදල් අනුමත ප්‍රමාණයම වර්ෂය අවසානය වන විට ලැබී නැත.

- **2024.12.31 දිනට ආයතනයේ විශේෂ ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය**

❖ **වැඩි දියුණු කළ ප්‍රවේණි /ප්‍රභේද (cultivar) සහ බීජ ක්ෂේත්‍ර පරීක්ෂාව සහ ව්‍යාප්ත කිරීම.**

- වැඩි ඵලදායීතාවයක් සහ ගුණාත්මක බවින් යුතු ලෙඩ රෝගවලට හා පළිබෝධකයන්ට ප්‍රතිරෝධී, දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන සහ වසරකට හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 3500 ක පමණ අස්වැන්නක් ලබාගත හැකි TRI 5000 කාණ්ඩයේ නව ප්‍රභේද 3 ක් (TRI 5002, TRI 5005 සහ TRI 5006) ඌව කලාපයට නිර්දේශ කර ඇත. මෙම TRI 5000 කාණ්ඩයේ පැළ වගාකරුවන්ට ලබාදීමට අවශ්‍ය මව් ශාක වගාවන් ව්‍යාප්ත කිරීම සඳහා හෙක්ටයාර 22 ක මව් ශාක වගාවන් ස්ථාපනය කිරීමට තේ පර්යේෂණ ආයතනය කටයුතු කර ඇති අතර, තවත් හෙක්ටයාර 14 ක මව් ශාක වගා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මේවායින් රිකිලි නිකුත් කිරීම 2025/2026 වසරවල දී සිදු කිරීමට අපේක්ෂිතය.
- නවීන කෘෂිකාර්මික පිළිවෙත් සහ ඉහළ යෙදවුම් සඳහා වැඩි වශයෙන් යොමු නොවන කුඩා තේ වතු හිමියන්ට දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන තේ ප්‍රභේද නිපදවීම අරමුණු කර මූලික පර්යේෂණ සහ ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා බීජ උද්‍යාන 15 ක් හෙක්ටයාර 7.5 ක ප්‍රමාණයක ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම සිදු කර ඇත. මෙම උද්‍යානවලින් වසරකට හෙක්ටයාර 10 ක වගා බිමකට අවශ්‍ය බීජ ප්‍රමාණය නිකුත් කිරීමට අපේක්ෂිතය.

❖ **භූමි ඵලදායීතාව ඉහළ නැංවීම සහ බෝග කළමනාකරණය සඳහා පර්යේෂණ**

- කෘෂි දේශගුණික කලාප මට්ටමින් තේ වගා බිම් සඳහා යොදන ස්ථානීය / විශේෂිත පොහොර භාවිතය සහ නිර්දේශ පිළිබඳව අවධානය යොමු කරමින් මේරූ තේ වගාවන්ට තේ කර්මාන්තයේ දර, කසල තේ, කොම්පෝස්ට් පෝෂක ප්‍රභවයන් ලෙස භාවිත කිරීමට ඇති හැකියාවන් අධ්‍යයනය පිළිබඳ අනුවර්තී පර්යේෂණ සිදු කෙරෙමින් පවතී. පුනරුත්ථාපන තෘණ වගාව සඳහා කර්මාන්තශාලා දර අළු පෝෂක ප්‍රභවයක් ලෙස සහ පසේ ආම්ලිකතාවය නිවැරදි කිරීමට ප්‍රතිකාරකයක් ලෙස භාවිත කිරීමට අදාල අනුවර්තී පර්යේෂණ ද අවසන් කර තාක්ෂණික නිර්දේශ නිකුත් කිරීමේ කමිටුවේ (TRC) අනුමැතියට යොමු කර ඇත.
- තේ වගාවට අවශ්‍ය ජෛව, කාබනික සහ ඛණිජ හෝ සංයුක්ත පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම. මැදරට සහ පහතරට වැඩුණු තේ ශාක වර්ධනය කිරීමට සුදුසු රයිසොබැක්ටීරියා (PGPR) මිශ්‍ර මුහුන් භාවිත කිරීම සඳහා පර්යේෂණ කටයුතු කර ඇති අතර, පරිණත තේ වගාවන් සඳහා මෙම මුහුන් භාවිතය ඇගයීමට පර්යේෂණයන් සිදු කරමින් පවතී.

- තේ වගා කලාපයන්හි ඇති විවිධ පාංශු ශ්‍රේණිවල පරිණත තේවල වඩා හොඳ වර්ධනයක් සඳහා ඩොලමිතික හුණුගල් අවශ්‍යතාවය, භාවිත විධික්‍රම සැසඳීම, පසේ pH අගයට ඇති කරන බලපෑම ඇගයීම සහ නිමි තේ අස්වැන්නට සිදු වන බලපෑම ආදී අංග ආවරණය කරමින් සිදු කරන පර්යේෂණ සිදු කෙරෙමින් පවතී.

- ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) විසින් නිෂ්පාදිත සෙමින් පෝෂක නිකුත් කරන පොහොර භාවිතයෙන් තේ වගාවේ පොහොර භාවිතය සහ එහි අස්වැන්නට ඇති කළ හැකි බලපෑම පිළිබඳ ඇගයීම සහ එමඟින් ආර්ථිකව ඇති ඵලදායීතාවය පිළිබඳ අධ්‍යයනයන් අවසන් කර එම නිර්දේශයන් තාක්ෂණික නිර්දේශ නිකුත් කිරීමේ කමිටුවේ (TRC) අනුමැතියට යොමු කිරීම.

- පසෙහි අඩංගු ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණය මත පදනම් වූ ක්ෂුද්‍ර පෝෂක පත්‍ර මතට යොදන පොහොර මිශ්‍රණයක් හඳුන්වාදීමට අදාල අනුවර්තී පර්යේෂණ, තේ මුල්වල ව්‍යුහය පෝෂක අවශෝෂණය සහ ශාක වර්ධනයට ඇති කරන බලපෑම අධ්‍යයන යන පර්යේෂණයන් ද සිදු කරමින් පවතී.

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් තේ නැවත වගා කිරීම දිරිමත් කිරීම, ඵලදායීතාවය සහ ආදායම ඉහළ නංවාලීමේ අරමුණෙන් පාංශු පුනරුත්ථාපන කාලය අඩු කිරීම හෝ පුනරුත්ථාපනයකින් තොරව නැවත වගාව ප්‍රචලිත කිරීම සඳහා පාංශු තත්ත්ව දර්ශකය (SQI) හඳුන්වා දෙන ලද අතර අවශ්‍ය පර්යේෂණ පහසුකම් පුළුල් කිරීම සිදුකරමින් පවතී.

- විවිධ තේ වගා කලාප සඳහා උචිත සෙවන කළමනාකරණ උපාය මාර්ග සංවර්ධනය වෙනුවෙන් සෙවන ශාක විශේෂ හඳුනාගැනීම, ඇගයීම, සෙවන ගස් ආශ්‍රිත පළිබෝධ සහ රෝග කළමනාකරණ ආදී කටයුතු ඔස්සේ ගොවීන්ට අවශ්‍ය වගා බිම් කළමනාකරණ දැනුම ලබාදීම.

❖ **දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් අවම කිරීම සඳහා නිර්දේශ ලබාදීම**

- තේ වගාවේ දේශගුණික විපර්යාසවල බලපෑම අවම කිරීමේ ශක්‍ය ප්‍රවේශයන් නිර්දේශ කිරීම සඳහා අවශ්‍ය පුරෝකථනයන් සිදු කිරීමට අවශ්‍ය නිරවද්‍ය කාලගුණික දත්ත රැස්කිරීම සඳහා දිවයිනේ සියලු තේ වගා කලාපයන් ආවරණය වන පරිදි ස්වයංක්‍රීයව ක්‍රියාකරන කාළගුණික දත්ත රැස්කිරීමේ ඒකක 21 ක් ස්ථාපිත කරන ලදි.

- තේ වගාවට නියඟයෙන් ඇතිවන බලපෑම් තක්සේරු කිරීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදයන් හා සුදුසු ප්‍රභේද හඳුනාගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ එක්සත් රාජධානියේ බ්‍රිස්ටල් විශ්වවිද්‍යාලය සහ කිව් රාජකීය උද්භිද උද්‍යානය සමඟ ඒකාබද්ධව පර්යේෂණ තවදුරටත් සිදු කරමින් පවතී.

❖ **තේ ක්ෂේත්‍රයේ කටයුතු යාන්ත්‍රීකරණය සඳහා පර්යේෂණ සිදු කිරීම.**

- ශ්‍රී ලංකාවේ තේ වගා බිම්වල භාවිතයට උචිත යාන්ත්‍රිකව තෝරා, තේ දළු නෙළන යන්ත්‍රයක් නිර්මාණය කිරීම, වෙළඳපොළට අලුතින් හඳුන්වා දෙන යන්ත්‍ර හා ඒවායින් වගාවට ඇතිවන බලපෑම පිළිබඳව අධ්‍යයනය සඳහා වූ විශේෂ ව්‍යාපෘතිය යටතේ අනුරූ නිර්මාණය සහ අත්හදා බැලීමේ කටයුතු රත්නපුර සහ තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයන්හි දී සිදු කර ඇති අතර, එහි වැඩි දියුණු කිරීමේ කටයුතු තවදුරටත් සිදු කරමින් පවතී. මෙම නවෝත්පාදනයේ බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට අයදුම්පත බුද්ධිමය දේපළ කාර්යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

- යාන්ත්‍රික දලු නෙලීමේ දී සිදු වන අස්වනු හානිය අවම කිරීම, තේ පත්‍ර මතට ඉසින ක්ෂුද්‍ර පෝෂක මිශ්‍රණ පරික්ෂා කිරීම සහ යන්ත්‍රානුසාරයෙන් දලු නෙලීම සඳහා සුදුසු තේ ප්‍රභේද පිළිබඳ අධ්‍යයනය කිරිම පහතරට සහ ඌව මධ්‍යස්ථානවල දී සිදු කරමින් පවතී.

- **බෝග කළමනාකරණය සඳහා ජෛව ක්‍රමවේදයන් යොදා ගැනීම**
  - රෝග සහ වල් පාලන පිළිවෙත් පරිශීලක හිතකාමී තිරසාර ජීව විද්‍යාත්මක සහ ස්වාභාවික පළිබෝධ, රෝග සහ වල් පාලන ක්‍රම සංවර්ධනය යටතේ තේ සඳහා තිරසාර, කාබනික සහ අවම යෙදවුම් සහිත කෘෂිකාර්මික පද්ධති ඇගයීමේ පර්යේෂණ සිදු කරමින් පවතී.
  - තේ වගාවේ රෝග සහ පළිබෝධ හානි පාලනයට ඒකාබද්ධ පාලන ක්‍රමෝපායන් සංවර්ධනය සහ කෘත්‍රිම දිලීර නාශක භාවිතය, නැනෝ කොපර් භාවිතයේ දී අවශේෂ පරීක්ෂාව සහ හෙක්සකොනසෝල්හි කාර්යක්ෂමතාවය හඳුනාගැනීම සහ අගයන් නිර්ණය කිරීමේ අධ්‍යයනයන් සිදු කර ඇත.
  - ජෛව පළිබෝධ නාශක නිෂ්පාදනය උදෙසා ක්ෂුද්‍ර ජීවී සැකසුම් විද්‍යාගාරය තලවාකැලේ ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කළ අතර, එමඟින් ක්ෂුද්‍ර ජීවී ජෛව පළිබෝධනාශක ප්‍රවර්ධනය සහ වාණිජකරණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
- **තේ කර්මාන්තශාලා සහ ඒවායේ තේ නිෂ්පාදනයට භාවිත යන්ත්‍ර සූත්‍රවල තත්වය වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය**
  - තේ නිෂ්පාදනයේ දී අධික පිරිවැයක් දැරීමට සිදු වන බල ශක්තිය, ප්‍රශස්ත ලෙස භාවිතයට සුදුසු ක්‍රමවේද හඳුනාගැනීම සහ ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ ක්‍රියාවලීන් සංවර්ධනයට අවශ්‍ය පර්යේෂණ කටයුතු ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සතු කර්මාන්තශාලා ආශ්‍රිතව සිදු කරන ලදි.
  - තරල පත්‍ල වියලනයේ වැඩි දියුණු කිරීම් කටයුතු සහ ඕතොඩොක්ස් රෝලර් යන්ත්‍රයේ වැඩි දියුණු කිරීම් කටයුතු සඳහා සුදුසු ඉංජිනේරු ආයතනයක් සමඟ සහයෝගී පර්යේෂණ කටයුතු ඇරඹීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
- **තේ නිෂ්පාදනයට අවශ්‍ය වන විකල්ප බල ශක්ති ප්‍රභවයන් ඇගයීම**
  - තේ නිෂ්පාදන බල ශක්ති පිරිවැය අඩු කිරීමට අවශ්‍ය වන තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා දැනට කර්මාන්තශාලාවල භාවිත වන වායු උඳුන් පද්ධති සඳහා වෙනස්කම් සිදු කිරීමට අදාලව සිදු කරන ලද ව්‍යාපෘතියේ සහ තේ වියලීමේ දී තේවල ගුණාත්මක බවට සහ යොදාගන්නා ක්‍රමවේදයන්හි පිරිවැය සංසන්දනය ආදී පර්යේෂණ සිදු කෙරෙමින් පවතී.
- **අගය එකතු කළ තේ ආශ්‍රිත නිෂ්පාදන හඳුන්වාදීම සහ වැඩි දියුණු කිරීම**
  - ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් තාක්ෂණ හුවමාරු කාර්යාලයක් ස්ථාපිත කරන ලද අතර, ආයතනික මට්ටමින් නවෝත්පාදන සඳහා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම, නවෝත්පාදන විද්‍යාඥයින් දිරිගැන්වීම සහ එම නිෂ්පාදන වාණිජ මට්ටමේ නිෂ්පාදනය දක්වා යොමු කිරීමේ ක්‍රියාවලියට මඟ පෙන්වීම මේ ඔස්සේ සිදු කර ඇත. ඒ අනුව දැනට ආයතනික බුද්ධිමය දේපළ තහවුරු කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කර ඇත.
  - ආයතනික නවෝත්පාදන සඳහා පේටන්ට් බලපත්‍ර 02 ක් ලබා ගෙන ඇති අතර දැනට “තේ වයින්” වාණිජකරණය කිරීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගතවීම මෙම කාලය තුළ සිදු කර ඇත. මීට අමතරව තේ ප්‍රෝටීන් සහ තේ සෝස් යන නිෂ්පාදනයන් ද විශේෂිත තේ නිෂ්පාදනය සඳහා අවශ්‍ය තේ වියළීමේ උඳුනක් ද යන නවෝත්පාදනයන් වාණිජකරණයට අවශ්‍ය කටයුතු ද ආරම්භ කර ඇත.
  - සහයෝගීතා ව්‍යාපෘති ලෙස සැකසුම් යන්ත්‍රෝපකරණ / පද්ධති වැඩි දියුණු කිරීම / වෙනස් කිරීම / ස්ථාපනය සහ වාණිජකරණය යටතේ ව්‍යාපෘති 05 ක් වාණිජකරණය කිරීමේ කටයුතු සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලදි.

- නිම් තේවල රසයට සහ සුවඳට හේතුවන වාෂ්පශීලී සංයෝග එකතු කර රඳවාගැනීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම. (A process for enhancing encapsulation of aroma compounds) යන මැයෙන් සහයෝගී පේටන්ට් බලපත්‍රයක් සඳහා නැවත අයදුම්පත බුද්ධිමය දේපළ කාර්යාංශය වෙත යොමු කර ඇත.
- ශෂ්‍ය විද්‍යා අංශය විසින් නිර්මාණය කරන ලද තෝරා දළු නෙළන යන්ත්‍රය (Selective Tea Harvester) සඳහා පේටන්ට් අයදුම්පත්‍රය බුද්ධිමය දේපළ කාර්යාංශය වෙත යොමු කර ඇත.

- **තේ වගාවෙහි සම්පත් සැලසුම්කරණය සඳහා පර්යේෂණ සිදු කිරීම.**
  - තේ වගා කරන විවිධ කලාපවල ඉඩම් පරිහරණය, ඉඩම් ආවරණයේ ගතික වෙනස්කම් ආදර්ශනය කිරීම මඟින් තේ පාදක ඉඩම් වර්ගීකරණය, යෝග්‍ය විකල්ප සේවක යෙදවීමේ ආකෘති හඳුනා ගැනීම, නවෝත්පාදන ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීමෙන් ඇති වන බලපෑම ආදී වශයෙන් ශ්‍රී ලංකාවේ තේ වගාව හා බැඳුණු සමාජ ආර්ථික පසුබිම හා සම්බන්ධ පර්යේෂණයන් සිදු කෙරෙමින් පවතී.
  - ජපානයේ භාවිතයන් සමඟින් සසඳා බලමින් ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ ස්ථිර කාර්ය සාධනය කෙරෙහි නිෂ්පාදන නවෝත්පාදනයේ බලපෑම හඳුනාගැනීම සඳහා ශිල්පීය තේ/ අතින් සැකසූ තේ සම්බන්ධ අධ්‍යයනයන් සිදු කරන ලද අතර, ශ්‍රී ලංකාවේ විශේෂිත/නව්‍ය තේ පිළිබඳ පළමු විස්තරාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදි.

- **නව විද්‍යාත්මක සොයා ගැනීම් හා පර්යේෂණාත්මක දැනුම සහ තාක්ෂණය සහ විවිධ සේවාවන් නවමු ව්‍යාප්ති ක්‍රම යොදා ගැනීමෙන් තේ ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට ලබාදීම.**
  - ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් සහ ව්‍යාප්ති අංශය සහ ප්‍රාදේශීය උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථාන ඔස්සේ වගාකරුවන්ට පුහුණු වැඩසටහන් 260 ක්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන, වැඩමුළු සහ සංසද 23 ක් , උපදෙස් සහ ව්‍යාප්ති චාරිකාවන් 67 ක්, වාර්තා සැපයීම 1,218 ක්, ජංගම විශ්ලේෂණ සේවාවන් 36 ක් හා ඉලෙක්ට්‍රොනික තොරතුරු සේවා සැපයීම, පටිගත කරන ලද ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවාවන් ගොවීන් 1,944 ක් සඳහා ලබාදී ඇත. ඇන්ඩ්‍රොයිඩ් දුරකථන යෙදවුම (Tea Advisory App) සඳහා පරිශීලකයන් 2,380 ක් සමාජ මාධ්‍ය, වට්ස්ඇප් සමූහ, ෆේස්බුක් පිටුව සහ තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය ඔස්සේ පාර්ශ්වකරුවන් වෙත ලබාදීම සිදු කරමින් පවතී.
  - ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශත සංවත්සර සැමරුමට සමගාමීව එළිදක්වන ලද ආයතනයේ නිල යූ ටියුබ් නාලිකාව මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.
  - තේ පර්යේෂණ ආයතනය විසින් වාර්ෂිකව පාර්ශ්වකරුවන් වෙත සිදුකරන විශ්ලේෂණ සේවා අතරින් 2024 මේ දක්වා පාංශු pH විශ්ලේෂණ 28,601 ක්, පාංශු කාබන් විශ්ලේෂණ 5,510 ක් තලවාකැලේ, හන්තාන, රත්නපුර සහ වලහන්දූව පාංශු සහ ශාක පෝෂක විද්‍යාගාරවල පාංශු 9,273 ක්, ශාක 250 ක්, රසායනික 1,161 ක් සහ කාබනික පොහොර නියැදි 159 ක් පරීක්ෂාවන් සහ වාර්තාවන් සිදු කර ඇත. කර්මාන්තශාලා සඳහා උපදේශන චාරිකා 49 ක වාර්තා, තෙතමනය මැනීමේ මීටර / උෂ්ණත්ව පාලන මීටර ක්‍රමාංකන 22 ක්, රසායනික් පරාමිතීන් සඳහා කලු තේ සාම්පල විශ්ලේෂණයන් 10 ක්, කැටතීන සංයුතිය විශ්ලේෂණ සාම්පල් 10 ක වාර්තා සහ පොලිෆීනෝල් වාර්තා 06 ක වාර්තා වසර තුළ මේ දක්වා නිකුත් කර ඇත.

- **තේ නිෂ්පාදනය සහ සැකසීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන**
  - තේ පර්යේෂණ ආයතනය විසින් තේ නිෂ්පාදනයේ නියැලෙන මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ තේ කර්මාන්තශාලා හිමියන් සහ ඒ ආශ්‍රිත රැකියාවන්හි නියැලෙන අයවලුන්ගේ

විද්‍යාත්මක දැනුම සහ ප්‍රායෝගික දැනුම ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් 02 ක් මේ වසර තුළ පවත්වා ඇත.

- සිද්ධි අධ්‍යයනයන් සහ සාකච්ඡාවන් ආශ්‍රයෙන් මෙරට කුඩා සහ මධ්‍යම පරිමාණ ශිල්පීය / විශේෂිත තේ නිෂ්පාදකයින්ගේ තොරතුරු රැස්කිරීම සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම සිදු කරන ලද අතර, විශේෂිත / ශිල්පීය තේ නිෂ්පාදකයින් සඳහා අවශ්‍ය මූලික දැනුම ලබාදීම, පුහුණු වැඩසටහන් 06 ක් ඔස්සේ තලවාකැලේ, රත්නපුර, හන්තාන සහ කලුතර, දෙනියාය සහ පස්සර යන මධ්‍යස්ථානවලදී සිදු කර ඇත.

- **තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශ/ මාර්ගෝපදේශ/ ප්‍රකාශන**

  - තේ වගාවන්හි යහපත් පිළිවෙත් / ක්‍රියාකාරකම් සහ නිර්දේශිත ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් චක්‍රලේඛ/ මාර්ගෝපදේශ/ ප්‍රකාශන ඔස්සේ ලබාදෙයි. උපදෙස් චක්‍රලේඛ 24 ක්, මාර්ගෝපදේශ 02 ක් සංස්කරණය කරන ලද ප්‍රකාශන 02 ක් ත්‍රෛභාෂාවෙන් ප්‍රකාශයට පත් කරන පොත් පිංච 03 ක් සහ තාක්ෂණික උපදෙස් පත්‍රිකා 12 ක් ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇත.
  - පර්යේෂකයින් විසින් ජාත්‍යන්තර පර්යේෂණ පත්‍රිකා 10 ක් සහ දේශීය පර්යේෂණ පත්‍රිකා 14 ක් ප්‍රකාශයට පත් කර ඇති අතර, ජාත්‍යන්තර ග්‍රන්ථ සඳහා පරිච්ඡේද 02 ක කර්තෘ දායකත්වය සහ දේශීය ග්‍රන්ථ පරිච්ඡේද 04 ක කර්තෘ දායකත්වය ද, ජාත්‍යන්තර පර්යේෂණ, සම්මන්ත්‍රණ 02 ක් සහ දේශීය පර්යේෂණ සම්මන්ත්‍රණ / සම්මේලන 32 ක ඉදිරිපත් කිරීම් ද සිදු කර ඇත.

- **ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සහයෝගීතා පර්යේෂණ**

  **ජාත්‍යන්තර මට්ටමේ සහයෝගීතා පර්යේෂණ**

  - ඔස්ට්‍රියාවේ වියානා නුවර පිහිටි ජාත්‍යන්තර පරමාණුක බල ශක්ති අධිකාරියේ අරමුදල් ප්‍රදාන යටතේ, ශ්‍රී ලංකාවේ තේ ශාක අභිජනන ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සඳහා නවීන තාක්ෂණය භාවිතය අරමුණු කරගත් ව්‍යාපෘතියේ මූලික පර්යේෂණ කටයුතු ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සමඟ ඒකාබද්ධව ආරම්භ කර ඇත.

  - තේ වගාවට නියඟයෙන් ඇතිවන බලපෑම් තක්සේරු කිරීම, ඒ සඳහා යොදා ගන්නා ක්‍රමවේදයන් හා සුදුසු ප්‍රභේද හඳුනාගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ එක්සත් රාජධානියේ බ්‍රිස්ටල් විශ්වවිද්‍යාලය සහ කිව් රාජකීය උද්භිද උද්‍යානය සමඟ ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

  - ශ්‍රී ලංකාවේ තේ වගා කලාපයන් හි ඇති පුහුණු ශ්‍රම හිඟයට විකල්ප ලෙස ශ්‍රමය යොදා ගත හැකි ක්‍රම වේදයන් අධ්‍යයනය සඳහා කෘෂි ආර්ථික විද්‍යා අංශය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ මිචිගන් විශ්වවිද්‍යාලය සමඟ සිදු කරන සහයෝගීතා පර්යේෂණ ව්‍යාපෘතිය.

  - ස්විට්සර්ලන්තයේ ETH Zurich විශ්ව විද්‍යාලය සමඟ සිදු කෙරෙන සහයෝගීතා ව්‍යාපෘතියක් වන කුඩා තේවතු හිමියන්ගේ ඉඩම්වල නයිට්‍රජන් ප්‍රමාණයේ සංසන්දනාත්මක අධ්‍යයනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි. (N Tea Project)

  **ජාතික මට්ටමේ සහයෝගීතා පර්යේෂණ**

  - දැනට ශ්‍රී ලංකාවේ ඉතිරිව ඇති වසර 70 කට වඩා පැරණි බීජ තේ ශාකවල ජානමය විවිධත්වය අධ්‍යයනය, සංරක්ෂණය කළ යුතු ජාන සම්පත් හඳුනාගැනීම සහ සංරක්ෂණ

ක්‍රමෝපායන් සංවර්ධනය කිරීමට ජාතික පර්යේෂණ සභාව (NRC) සහ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (SLCARP) මුදල් ප්‍රතිපාදන යටතේ සිදු කරන ව්‍යාපෘතිය.

- ශ්‍රී ලංකාවේ කළු තේ සහ අගය එකතු කළ කළු තේ පරිභෝජනය කිරීමෙන් රුධිරයේ ලිපිඩ මත ඇති කරන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම. ජෛව රසායන අංශය විසින් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (SLCARP) මුදල් ප්‍රතිපාදන යටතේ සිදු කරන ව්‍යාපෘතිය.
- අතේ ගෙන යා හැකි ආසන්න අධෝරක්ෂ වර්ණාලික්ෂය (NIR) භාවිතයෙන් තේවල ගුණාත්මය පිළිබඳ පරාමිතීන් තක්සේරු කිරීමට ක්‍රමවේදයක් නිර්ණය කිරීම සහ එහි වලංගුභාවය පිළිබඳ පරික්ෂා කිරීම සඳහා සිදු කරන පර්යේෂණය

- **2025 වර්ෂයේ දී සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති**

තේ පර්යේෂණායතනය විසින් වාර්ෂික විවිධ පර්යේෂණ තේමාවන් යටතේ සිදු කරනු ලබන ව්‍යාපෘති 2025 වර්ෂය තුළ දී තවදුරටත් ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඊට අමතරව දැනට ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියැලෙන පාර්ශ්වකරුවන්ගේ සහ කර්මාන්තයේ ජාතික සහ අන්තර්ජාතික වශයෙන් හඳුනාගන්නා ලද ප්‍රවණතාවයන් සඳහා පහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

- ශ්‍රී ලංකාවේ තේ ව්‍යවසායකත්වය සහ නවෝත්පාදන මධ්‍යස්ථානය: වෙළඳපොළ ඉල්ලුම මත පදනම් වූ නිෂ්පාදන සංවර්ධනය සහ වාණිජකරණය.
- නැනෝ අංශුවලින් සමන්විත ජෛව අඟුරු මඟින් තේ පැළ වර්ධනයට සහ පසෙහි ගුණාත්මකභාවයට සිදු කරන බලපෑම පිළිබඳව අධ්‍යයනය සිදු කිරීම.
- පාංශු ගුණාත්මය සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා පාංශු සංශෝධනයක් ලෙස ජෛව අඟුරු භාවිතය සහ තේ වගාවට දේශගුණික විපර්යාස වලින් ඇති කරන බලපෑම් අවම කරගැනීමට ස්වභාව විද්‍යාත්මක උපාය මාර්ග හඳුනාගැනීම සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම.
- පළිබෝධ නාශක අපද්‍රව්‍ය ඇස්තමේන්තුගත කිරීම, හඳුනාගැනීමේ ක්‍රමවේද සංවර්ධනය සම්බන්ධව විමර්ශන රසායනාගාරයක් පිහිටුවීම.
- තේ පැළවල කෙටි කාලීන නියඟ තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඇති ශාක මත පදනම් වූ නිෂ්පාදන සංවර්ධනය කිරීම.
- 2025 වර්ෂය තුළ තේ පර්යේෂණ ආයතනයේ සියවස් සැමරුමට සමගාමීව ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සහ නව මුහුණුවරකින් එළි දැක්වීම, සියවස් සැමරුම් ප්‍රකාශන, අන්තර්ජාතික තේ විද්‍යා සම්මන්ත්‍රණය, සේවා ඇගයීම් වැඩසටහන, පාර්ශ්වකරුවන් සහ සාමාන්‍ය ජනතාව ඉලක්ක කරගත් දැනුම බෙදාදීමේ වැසටහන්, ප්‍රචාරක වැඩසටහන් හා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල ද ඇතුළත්ව ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු, යෝජිත නව ගොඩනැගිලි සහ විද්‍යාගාර නිර්මාණය කිරීම ආදී අංශ ඔස්සේ යෝජිත ක්‍රියාකාරකම්/ වැඩසටහන් සහ ව්‍යාපෘති ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**දැක්ම**

ආර්ථික හා සාමාජයීය වශයෙන් තිරසාර කුඩා තේ වතු ප්‍රජාවක් බිහි වීම.

**මෙහෙවර**

විශිෂ්ඨතම උපකාරක සේවා සැපයීම තුළින් කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායීතාව හා ගුණාත්මය වර්ධනය කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 1,500.00 |
| 02 | පුනරාවර්තන වියදම් | 583.37 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති)**

❖ **තේ නැවත වගා සහනාධාර ක්‍රමය** (තේ නැවත වගා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා හෙක්ටයාර 01 කට රු.500,000.00 බැගින් අදියර 05 කින් ගෙවීම් කරනු ලැබේ.)

| වැඩසටහන | මිනුම් ඒකකය | භෞතික ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|
| පළමු වන අදියර - බිම් සකස් කිරීම | හෙක්ටයාර | 1,500 | 345.00 |
| දෙවන අදියර - පස පුනරුත්ථාපනය I | හෙක්ටයාර | 348.60 | 17.43 |
| තෙවන අදියර - පස පුනරුත්ථාපනය II | හෙක්ටයාර | 429.96 | 85.99 |
| සිව් වන අදියර - පැළ සිටුවීම | හෙක්ටයාර | 680.96 | 95.33 |
| පස් වන අදියර - පැළ සිටුවා වසරකට පසු නඩත්තුව | හෙක්ටයාර | 691.00 | 41.46 |

❖ **තේ නව වගාව**

තේ නව වගා ක්‍රියාකාරකම සඳහා හෙක්ටයාර 01 කට රු.500,000.00 බැගින් අදියර 03 කින් ගෙවීම් කරනු ලැබේ.

| වැඩසටහන | මිනුම් ඒකකය | භෞතික ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|
| පළමු අදියර - බිම් සකස් කිරීම | හෙක්ටයාර | 680 | 95.20 |
| දෙවන අදියර - තේ පැළ සිටුවීම | හෙක්ටයාර | 680 | 170.00 |
| තුන් වන අදියර - වසරකට පසු නඩත්තුව | හෙක්ටයාර | 198 | 9.90 |

❖ **තේ වගා පුනරුත්ථාපනය** (පාළු පැළ සිටුවීම සඳහා අදියර 02 ක් යටතේ එක් පැළයකට රු.100.00 බැගින් වූ සහනාධාර මුදලක් ගෙවනු ලැබේ.)

| වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය (පැළ සංඛ්‍යාව) | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|
| 1 වන අදියර - පාළු පැළ සිටුවීම. | පැළ සංඛ්‍යාව | 5,200,000 | 520.00 |
| 2 වන අදියර - තේ පැළ සිටුවා වසරක කාලයක් නඩත්තු කිරීම. | පැළ සංඛ්‍යාව (පෙර වර්ෂයේ සිටුවා ඇති) | 1,213,325 | 30.33 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂයේ සඳහා වෙන් කල මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කල මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 550.00 | 503.61 | 91.56% |
| 02 | පුනරාවර්තන වියදම් | 487.81 | 481.95 | 98.80% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | වැඩසටහන | වෙන්කල මුදල (රු.මි.) | වැයකල මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| තේ නැවත වගාව (පෙර වර්ෂයේ ඇතිකර ගත් බැඳීම්) | පස පුනරුත්ථාපනය I | 6.55 | 6.322 | හෙක්ටයාර 131 |
| | පස පුනරුත්ථාපනය II | 59.60 | 59.60 | හෙක්ටයාර 298 |
| | පැළ සිටුවීම | 54.32 | 54.32 | හෙක්ටයාර 388 |
| | පැළ සිටුවා වසරකට පසු නඩත්තුව | 12.36 | 11.51 | හෙක්ටයාර 206 |
| තේ නැවත වගාව (2024 වර්ෂයේ) | නිකුත් කල බලපත්‍ර ගණන | - | - | බලපත්‍ර 1,113 |
| | පැළ සිටුවීම | 105.30 | 104.496 | හෙක්ටයාර 190 |
| තේ වගා පුනරුත්ථාපනය (පාළු සිටුවීම) | අදියර I - භෝග පුනරුත්ථාපනය | 110.00 | 109.61 | පැළ 2,000,000 |
| | අදියර II - (පෙර වර්ෂයන්හි ඇති කරගත් බැඳීම්) | 5.00 | 5.00 | පැළ 200,000 |

### ❖ 2024.12.31 දිනට ආයතනය ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය

- **පොහොර බෙදා දීමට අදාල ප්‍රගතිය**

  අමාත්‍යාංශ නියෝගය අනුව කුඩා තේ වතු හිමියන් සඳහා අප්‍රේල් මස සිට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් පෙහොර මෙ.ටො. 10,000 ක් ද, ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් පොහොර මෙ.ටො. 10,000 ක් ද, කම්හල් මගින් පොහොර මෙ.ටො. 10,000 ක් ද, බෙදා දීමට තීරණය කර ඇත. ඒ අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ගාල්ල, මහනුවර, කළුතර, කෑගල්ල, නුවරඑළිය, රත්නපුර හා ඌව කාර්යාල මඟින් පෙහොර මෙ.ටො.10,000 ක් බෙදා හැරීමට සැලසුම් කර ඇත.

- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා සී.අයි.සී පොහොර සමාගම එක්ව ක්‍රියාත්මක කරන **"දල්ලකින් වෙනසක්"** ඉඩම් සංවර්ධන වැඩසටහන.

- සී.අයි.සී පොහොර සමාගම සමඟ එක්ව ගාල්ල, මාතර හා රත්නපුර යන ප්‍රාදේශීය කාර්යාල මූලික කරගනිමින් කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ මගින් කුඩා තේ ඉඩම් 4,000 ක් වගා ආදර්ශන ඉඩම් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර, ව්‍යාප්ති උපදෙස් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා ද්‍රව්‍යමය ආධාර සී.අයි.සී පොහොර සමාගම මඟින් ලබාදීම සිදුකෙරේ. මෙම ව්‍යාපෘතිය මඟින් මේ වන විට ගාල්ල, මාතර හා රත්නපුර දිස්ත්‍රික්කවල ගොවීන් වෙත උස් සෙවන පැළ (Albizzia moluccana) පැළ 3,000 බැගින් මුළු පැළ 9,000 ක් ලබා දී ඇත.

- **තේ ඉඩම්වල ඵලදායීතාවය හා දළු ගුණාත්මය වැඩි කිරීමේ වැඩසටහන**

  මෙම ව්‍යාපෘතිය මඟින් කෑගල්ල, කළුතර, මහනුවර, නුවරඑළිය හා ඌව යන ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශවල කුඩා තේ ඉඩම් 1,000 ක් බැගින් තෝරා ගනිමින් ඉඩම් 5,000 ක් සංවර්ධනය කිරීම සඳහා සැලසුම් කර ඇති අතර, මූලිකව කෑගල්ල, මහනුවර හා ඌව ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශවල වැඩසටහන ඇග්ස්ටා ආයතනය සමඟ ක්‍රියාත්මක කරයි.

# රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

**දැක්ම**

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම කොටස්කරු වීම.

**මෙහෙවර**

නෛතිකව දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ට අනුගතව ශ්‍රී ලංකාවේ රබර් වගාව හා රබර් වගාව ආශ්‍රිත කර්මාන්තයන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා ව්‍යාප්ති සේවා ක්‍රියාත්මක කිරීම.

**ආයතනයේ අරමුණු**

- ❖ පවතින රබර් වගා ඉඩම්හි ඵලදායීතාවය ඉහළ නැංවීම හා රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම තුළින් දේශීය රබර් නිෂ්පාදනය ඉහළ නැංවීම.
- ❖ රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම තුළින් රබර් සඳහා වැඩි මිලක් ලබා ගැනීම හා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම.
- ❖ ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය ඉහළ නැංවීම තුළින් සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- ❖ දේශීය දැව අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා දායක වීම.
- ❖ ස්වාභාවික පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා වගාවේ තිරසරභාවය තහවුරු කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 780.83 |
| 02 | පුනරාවර්තන වියදම් | 423.97 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | රබර් නව වගාව | හෙක්ටයාර | 655 | - |
| 02 | රබර් නැවත වගාව | හෙක්ටයාර | 345 | - |
| 03 | ගුණාත්මක බද්ධ රබර් පැළ නිෂ්පාදනය හා බෙදාහැරීම | පැළ | 581,000 | 146.00 |
| 04 | වැසි ආවරණ යෙදීම. | හෙක්ටයාර | 1,500 | 60.00 |
| 05 | ආදායම් විවිධාංගීකරණ වැඩසටහන් පැවැත්වීම. | හෙක්ටයාර | 250 | 2.00 |
| 06 | පෙර වසරවල ආරම්භ කළ රබර් නව වගා හා නැවත වගා වගාවන් සඳහා ඉතිරි සහනාධාර වාරික ගෙවීම. | හෙක්ටයාර | 8,877 | 336.10 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | 2023 / 2024 / 2025 වසරවල රබර් වගා සඳහා පොහොර සහනාධාර ලබාදීම. | හෙක්ටයාර | 2,810 | 43.00 |
| 08 | 2025 වර්ෂයේ සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ඉඩම් හඳුනා ගැනීම. | හෙක්ටයාර | 5,000 | 1.00 |
| 09 | ප්‍රචාරණ වැඩසටහන් හා විශේෂ වැඩමුළු සාකච්ඡා | වැඩසටහන් | 15 | 4.00 |
| 10 | රබර් ක්ෂේත්‍රයට අදාලව කිරි කැපුම් ශිල්පී, බද්ධකරු, ෂීට් රබර් නිෂ්පාදනය, රබර් වගාවට වැළඳෙන රෝග පිළිබඳ, පොහොර භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | වැඩසටහන් | 558 | 8.73 |
| 11 | ව්‍යාප්ති සේවා, බලපත්‍රලාභී රබර් වෙළෙඳුන් නිරීක්ෂණය, ලියාපදිංචි රබර් ආශ්‍රිත නිෂ්පාදන ආයතන නිරීක්ෂණය, පෞද්ගලික/ වාණිජ රබර් පැළ තවාන් නිරීක්ෂණය, අසාර්ථක වගා පුනරුත්ථාපනය හෝ ගෙවූ සහනාධාර ආපසු අය කර ගැනීම, සහනාධාර ගෙවීම් පරීක්ෂණ කටයුතු | වැඩසටහන් | 2,939 | - |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | **2024** වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | **2024.12.31** දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 546.198 | 539.050 | 99% |
| 02 | පුනරාවර්තන වියදම් | 427.030 | 396.779 | 93% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල(රු.මි.) | වැයකළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| ගුණාත්මක රබර් පැළ නිෂ්පාදනය | ගුණාත්මක බද්ධ රබර් පැළ නිකුත් කිරීම. | 146.00 | 137.56 | බෙදා හරින ලද පැළ සංඛ්‍යාව 436,240 |
| රබර් වගාව ව්‍යාප්ත කිරීම. | නව වගාව | - | - | වගා බිම් හෙක්. 489.09 |
| | පෙර වසරවල ආරම්භ කළ නව වගා සඳහා ඉතිරි වාරික ගෙවීම. | 62.38 | 80.20 | ගෙවීම් හෙක්.2,007.32 |
| | කණ්ඩායම් සාකච්ඡා, දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, රැස්වීම්, ප්‍රචාරණ, ප්‍රදර්ශන හා සම්මාන ප්‍රදානෝත්සව පැවැත්වීම. | 4.90 | 2.794 | වැඩසටහන් 431 |

| | | | | |
|---|---|---|---|---|
| ඵලදායීතාවය වර්ධනය කිරීම. | රබර් නැවත වගාව | - | - | වගා බිම් හෙක්. 247.79 |
| | පෙර වසරවල ආරම්භ කළ කුඩා වතු අංශයේ රබර් නැවත වගා සඳහා ඉතිරි වාරික ගෙවීම. | 135.30 | 99.68 | ගෙවීම් හෙක්. 2,052.45 |
| | පෙර වසරවල ආරම්භ කළ වැවිලි සමාගම්හි රබර් නැවත වගා සඳහා ඉතිරි වාරික ගෙවීම. | 160.72 | 188.03 | ගෙවීම් හෙක්.3,920.54 |
| රබර් අංශයේ පුහුණු වැඩසටහන් | කිරි කැපුම් ශිල්පී පුහුණුව | 0.62 | 0.58 | පුහුණු පුද්ගලයින් 1,792 |
| | බද්ධකරු පුහුණුව | 0.12 | 0.114 | පුහුණු පුද්ගලයින් 209 |
| | තවාන් සංවර්ධන වැඩසටහන | 0.26 | 0.27 | වැඩසටහන් 06 |
| දත්ත පද්ධතිය කළමනාකරණය | රබර් ඉඩම් සංගණනය | 4.90 | 4.137 | 86% |
| ධාරිතා වර්ධනය | පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 1.00 | 0.99 | පුහුණු පුද්ගලයින් 745 |

- **2025 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්**

- 2025 වර්ෂයේ කුඩා රබර් වතු අංශයේ හෙක්.655 ක රබර් නව වගාව
- 2025 වර්ෂයේ කුඩා රබර් වතු අංශයේ හෙක්.345 ක රබර් නැවත වගාව
- 2025 වර්ෂයේ ගුණාත්මක බද්ධ රබර් පැළ 581,000 ක් නිෂ්පාදනය කිරීම හා බෙදා හැරීම.
- 2025 වර්ෂයේ කුඩා වතු අංශයේ හෙක්.1,500ක වැසි ආවරණ යෙදීම යෙදීම සඳහා සහනාධාර ලබා දීම.
- ආදායම් විවිධාංගීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- 2023/2024/2025 වසරවල රබර් වගා සඳහා පොහොර සහනාධාර ලබා දීම. (හෙක්.2810)
- ශ්‍රී ලංකාවේ රබර් ඉඩම් සිතියම්ගත කිරීම හා භූ බංඩාංක දත්ත ලබා ගැනීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම හා ව්‍යාප්ති සේවා වැඩසටහන් පැවැත්වීම.
- 2025 වර්ෂයේ සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ඉඩම් හඳුනා ගැනීම. (හෙක්.5000)

# රබර් පර්යේෂණායතනය

**දැක්ම**

රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා ගුණාත්මක බවින් පිරිපුන් උසස්ම විද්‍යාත්මක තාක්ෂණය රබර් කර්මාන්තයට ලබා දෙන විශිෂ්ටතම ආයතනය බවට පත්වීම.

**මෙහෙවර**

ආර්ථික වශයෙන් ඵලදායක මෙන්ම පාරිසරික වශයෙන් හිතකාමී තිරසාර නවෝත්පාදන වැඩි දියුණු කිරීම මගින් ද, රබර් කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙත පුහුණු කිරීම් හා උපදේශන සේවා තුළින් නවතම තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මගින් ද රබර් කර්මාන්තයට පුනර්ජීවයක් ලබා දීම.

**අරමුණ**

රබර් කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය නවතම විද්‍යාත්මක තාක්ෂණයන් හා නවෝත්පාදන පර්යේෂණ ක්‍රම හඳුන්වා දීම මඟින්, වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති මත පදනම්ව රටේ රබර් කර්මාන්තය ජාත්‍යන්තර තලයේ සැලකිය යුතු වෙළඳපල කොටසක් අත්කර ගනිමින් ශ්‍රී ලංකාවේ කුඩා, මධ්‍යම සහ මහා පරිමාණ රබර් වගාකරුවන්ට යහපත් ජීවන තත්ත්වයක් සලසා දෙමින්, ශ්‍රී ලංකා රජයට සහාය වීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම | 204.05 |
| 02 | පුනරාවර්තන වියදම | 546.74 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | නව පත්‍ර පතන රෝගයට අදාල වසංගත විද්‍යාත්මක අධ්‍යයන සහ ව්‍යාධිජනකයන්ගේ ජීව විද්‍යාත්මක අධ්‍යයන සිදු කිරීම සහ කාර්යක්ෂම රෝග කළමණාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම. (2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. | නව සොයාගැනීම් | නව සොයාගැනීම් හරහා කාර්යක්ෂම රෝග කළමණාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම. | 49.46 |
| 02 | පර්යේෂණ සහ සොයා ගැනීම් තුළින් කුඩා රබර් හිමියන්ගේ ඵලදායීතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | ඵලදායිතාවය ඉහළ නංවන ලද වගාකරුවන් සංඛ්‍යාව | වගාකරුවන් දහසකගේ රබර් වගාවන්හී ඵලදායිතාවය ඉහළ නැංවීම | ඇමරිකානු ඩොලර් 200,000 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු. මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 1.75 | 1.75 | 100% |
| 2 | ප්‍රාග්ධන සංවර්ධන | 5.75 | 5.75 | 100% |
| 3 | පර්යේෂණ හා සංවර්ධන | 22.50 | 22.50 | 100% |
| | **මුළු එකතුව** | **30.00** | **30.00** | **100%** |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු. මිලි.) | වැය කළ මුදල (රු. මිල.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| රබර් වගාව සම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීම | - | 0.74 | 0.68 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය සහ මිහින්තලේ ප්‍රදේශවල නව රබර් වගාවන් ස්ථාපිත කිරීමේ විද්‍යාත්මක හා සමාජ - ආර්ථික ශක්‍යතාව පිළිබඳව අධ්‍යයනයන් සිදු කරන ලදි. මෙම ප්‍රදේශවල ගොවීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා හොරොව්පතාන ප්‍රදේශයේ ගොවීන් සඳහා රබර් වගාව සහ කිරි කැපීම පිළිබඳ දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදි.<br>වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික්කවල පරිණත රබර් වගාවන්ගෙන් කිරි අස්වැන්න පිළිබඳ දත්ත රැස් කරන ලද අතර, නැගෙනහිර පළාතේ අපරිණත රබර් වගාවන්හි වර්ධනයට බලපාන සමාජ ආර්ථික සහ විද්‍යාත්මක සාධක හඳුනා ගන්නා ලදි. |
| තාක්ෂණ සංවර්ධනය තුළින් ඵලදායීතාව වැඩි දියුණු කිරීම. | කුඩා වතු අංශයේ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ගික තාක්ෂණ හුවමාරු කිරීම.<br>වතු අංශයේ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා RRISL | 0.56 | 0.56 | කුඩා රබර් වතු 82 ක පුනරුත්ථාපනය අවසන් කරන ලද අතර, අපරිණත වතු 40 ක් සහ පරිණත වතු 42 ක් ඇතුළත් විය. එයට අමතරව, ආදර්ශ සැකසුම් මධ්‍යස්ථාන 14 ක් සහ වැසි ආරක්ෂක ආදර්ශන බිම් 21 ක් ස්ථාපිත කරන ලදි.<br>අතුරු බෝග නිරූපණ ක්ෂේත්‍ර |

| | | | | |
|---|---|---|---|---|
| | විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණයන් හුවමාරු කිරීම.<br>ඉල්ලීම් පදනම් කරගත් තාක්ෂණික උපදේශන චාරිකා පැවැත්වීම.<br>රබර් අංශයේ පාර්ශවකරුවන්ගේ මානව සම්පත් සංවර්ධනය<br>රබර් අංශයේ ඵලදායී ව්‍යාප්ති ජාලයක් සංවර්ධනය කිරීම. | | | අටක් නිර්මාණය කරන ලද අතර, එක් සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකරන ලදි. කණ්ඩායම් උපදේශන (STaPT) වැඩසටහන් හතක් පවත්වන ලද අතර, එමඟින් කුඩා වතු හිමියන් 63 දෙනෙකුට සහ ක්ෂේත්‍ර නිලධාරීන් 215 දෙනෙකුට ප්‍රතිලාභ සැලසුණි.<br>රබර් කිරි කපන්නන් 378 දෙනෙකුගේ කුසලතා වැඩි දියුණු කරන ලදි. මොනරාගල උපමධ්‍යස්ථානයේ එක්දින දුම් කුටියක් ඉදිකරන ලද අතර, "කිරිතුරු" මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද අතර, යූ ටියුබ් නාලිකාවක් හරහා තාක්ෂණික උපදේශන වීඩියෝ වැඩසටහන් හයක් බෙදා ගන්නා ලදි. |
| අඩු තීව්‍රතාවයකින් යුත් අස්වනු නෙලීමේ ක්‍රමෝපායන් පර්යේෂණ, සංවර්ධනය සහ වාණිජ ක්‍රමවේදයන් හඳුන්වා දීම. | | 1.14 | 1.14 | කුඩා වතු හිමියන් 10 දෙනෙකුට සහය ලබා දී, ක්ෂේත්‍ර 12 ක් සඳහා අස්වනු උත්තේජන සඳහා ආධාර ලබා දී ඇත.<br>ක්ලෝන 08 ක සහ ප්‍රවේණි දර්ශ 10 ක රබර් කිරිවල රබර් කිරි විශ්ලේෂණය සිදු කිරීම, සහ නව පත්‍ර පතන රෝගයේ බලපෑමට ලක් වූ සහ නොවූ ගස් 315 ක කිරි විශ්ලේෂණය සඳහා නිරීක්ෂණය කර ඇත. |
| | පළිබෝධ පාලනය සඳහා රසායනික ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සහ රෝග ප්‍රතිරෝධී ක්ලෝන පරීක්ෂා කිරීම පළිබෝධකයන්ගේ අණුක ජීව විද්‍යා සහ ජීව විද්‍යාත්මක පාලනය පිළිබඳ අධ්‍යයනය.<br>කුඩා පරිමාණ ගෘහ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයනය සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ ශක්තිමත් කිරීම සඳහා ක්‍රම ගවේෂණය. | 2.40 | 2.39 | පර්යේෂණ දත්ත 22 ක් ලබා ගැනීම සම්පූර්ණ කරන ලද අතර, ක්ලෝන 50 ක් පිළිබඳ රසායනික පර්යේෂණ සම්පූර්ණ කරන ලදි.<br>පර්යේෂණ පත්‍රිකා 06 ක් සකස් කරන ලදි.<br>උපදේශක සේවා සහ වැඩසටහන් සඳහා උපදේශක පත්‍රිකා 05 ක් සකස් කරන ලද අතර, නව පත්‍ර පතන රෝගය පිළිබඳ අත් පත්‍රිකා 04 ක් මුද්‍රණය කරන ලදි. |
| නව/නව රබර් | | 3.02 | 2.74 | ළදරු සපත්තුව, වාහක පටිය, |

| | | | | |
|---|---|---|---|---|
| නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම | | | | ස්වභාවික රබර් කිරි පෙන, සෙල්ලම් බඩු, gypsum පුවරු වෙනුවට ස්වාභාවික අත්වැසුම් අපද්‍රව්‍යවලින් සාදන ලද කොටස් පුවරුව, බිම් ටයිල්, යනාදි නිෂ්පාදන 8 ක් හඳුනා ගැනීමට කටයුතු කරන ලදි.<br>භූමි අලංකරණ සහ ඉදිකිරීම් යෙදුම් සඳහා ස්වාභාවික රබර් අපද්‍රව්‍යවලින් රබර් බ්ලොක් එකක් නිෂ්පාදනය කිරීම. |

- **2025 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ ක්‍රියාකාරකම්**

  - ❖ ආන්තික ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීමේ දී නියඟ සහ ආතතියට ඔරොත්තු දෙන සුදුසු *Hevea* ක්ලෝන විශ්ලේෂණය කර අතුරු නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
  - ❖ වෙනස් වන අනාගත වෙළඳපොළ තත්වයන් යටතේ බහුවිධ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ස්වාභාවික රබර් සඳහා තිරසාර සහතික කිරීමේ ක්‍රමවේදයක් (SCSNR) හඳුන්වා දීම.
  - ❖ ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාපවල වගා කළමනාකරණය ප්‍රශස්ත මට්ටමකට ගැනීම සඳහා රබර් තවාන් සහ අපරිණත රබර් ක්ෂේත්‍ර සඳහා ක්ෂුද්‍ර ජල සැපයුම් පද්ධති ක්‍රියාත්මක කිරීම.
  - ❖ සාම්ප්‍රදායික රබර් වගා කරන ප්‍රදේශවල නිසරු පස ප්‍රතිසංස්කරණය සඳහා වගාකරුවන්ගේ සහභාගීත්වය මත පදනම් වූ ප්‍රවේශය හඳුන්වා දීම.
  - ❖ රබර් වගාවේ පවතින ගැටළු අවම කිරීම සඳහා, සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාකරුවන් සඳහා අඩු තීව්‍රතා අස්වනු නෙලීමේ (LIH) ක්‍රම ඵලදායී ලෙස හඳුන්වා දීම.
  - ❖ භූගෝලීය තොරතුරු පද්ධතිය (SDMIS) හරහා රබර් ඉඩම් කළමනාකරණය සඳහා අවකාශීය දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම.
  - ❖ කොරතස්පොර පත්‍ර රෝගය (CLS) සතුටුදායක මට්ටමකට පාලනය කළ හැකි කෘෂි රසායන මිශ්‍රණයක් හඳුනාගෙන, වතු අංශයේ හෙක්ටයාර් 100 ක පමණ ප්‍රදේශයක රෝගය පාලනය කිරීම පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම.
  - ❖ සුදු මුල් රෝගය පාලනය කිරීම සඳහා සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ සඳහා රසායනාගාර ප්‍රතිතනය ලබා ගැනීමට භාවිතා කරන කෘෂි රසායන ප්‍රමාණය අවම කිරීමට කටයුතු කිරීම.
  - ❖ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් කුඩා රබර් වගාකරුවන් 100 දෙනෙකුගේ ඵලදායිතා මට්ටම් වැඩි දියුණු කිරීම.
  - ❖ රබර් පර්යේෂණ ආයතනය ශ්‍රී ලංකාවේ තාක්ෂණික වශයෙන් නිශ්චිත රබර් (TSR) කර්මාන්තශාලා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීමේ කටයුතු සැලසුම් කිරීම.

# කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

**දැක්ම**

ශ්‍රී ලංකාවේ කුරුඳු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අපනයන - අභිමුඛ වැවිලි බෝගය ලෙස ස්ථානගත කිරීම.

**මෙහෙවර**

තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම, තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නැංවීම, වෙළෙඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම යන උපාය මාර්ගික මුල පිරීම් තුළින් ජාතික ආර්ථිකයට ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ දායකත්වය ශක්තිමත් කිරීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ යහපැවැත්ම වැඩි දියුණු කිරීම.

**අරමුණ**

- කුරුඳු ඉහළ ආදායම් ලැබෙන වෙළෙඳපොළ වෙත යැවෙන කුරුඳු නිෂ්පාදනය වැඩි කිරීම.
- කුරුඳු වෙළඳපොළ විනිවිදභාවය ඇති කිරීම.
- අගය එකතු කළ කුරුඳු නිෂ්පාදන අපනයන ප්‍රතිශතය වැඩි කිරීම හා ප්‍රවර්ධනය.
- දේශීය කුරුඳු වගාකරුවන්ගේ ආදායම වැඩි කිරීම.
- ශ්‍රී ලංකා කුරුඳු සත්‍ය ලොව පුරා ප්‍රවර්ධනය කිරීම.
- කුරුඳු පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම.
- කුරුඳු සම්බන්ධ හවුල්කාරීත්වයන් සහ සන්ධානයන් පවත්වාගෙන යාම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 1,045.00 |
| 02 | පුනරාවර්තන වියදම් | 194.50 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | ලංකා සත්‍ය කුරුඳු දියුණු කිරීමේ පුළුල් පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන | | | |
| | තිරසාර කුරුඳු නිෂ්පාදනය වැඩි කිරීම. | හෙක්ටයාර් | 360 | 61.20 |
| | කුරුඳු ඉඩම්වල ඵලදායීතාවය වැඩි දියුණු කිරීම. | හෙක්ටයාර්<br>වැඩසටහන් | 335<br>100 | 51.50 |
| | පසු අස්වනු සකස් කිරීම හා අගය එකතු කිරීම. | ඒකක | 20 | 15.00 |
| | තත්ව පාලනය හා තත්ව සහතිකකරණය | තත්ව සහතික<br>තත්ව විගණන වැඩසටහන් | 105<br>70 | 2.00 |

| | | | | |
|---|---|---|---|---|
| | කුරුඳු වෙළෙඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම සඳහා නව තාක්ෂණය | ප්‍රදර්ශන හා වැඩසටහන් පත්‍රිකා / සහතික | 05<br>03 | 9.00 |
| | පුහුණු හා ධාරිතා සංවර්ධන | පුහුණු වැඩසටහන් | 300 | 6.30 |
| 02 | ජාතික කුරුඳු කර්මාන්තය ආශ්‍රිතව සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය අදියර II (Cinnamon Gate) | නිම කරන ලද ගොඩනැගිල්ල | අවන්හල හා කෞතුකාගාරයේ වැඩ නිම කිරීම. | 553.10 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 112.00 | 84.25 | 75.22% |
| 02 | පුනරාවර්තන වියදම් | 137.00 | 101.19 | 73.86% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| අනු අංකය | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | ලංකා සත්‍ය කුරුඳු නඟා සිටුවීම සඳහා වන බහු දිශා ප්‍රවේශ ව්‍යාපෘතිය | 35.00 | 31.75 | 96% |
| 02 | ජාතික කුරුඳු කර්මාන්තය ආශ්‍රිතව සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය අදියර I (Cinnamon Gate) | 70.00 | 46.50 | 72% |

- **2025 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපාති/ක්‍රියාකාරකම්**

❖ ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ ගුණාත්මකභාවය, අගය එකතු කිරීම සහ වෙළෙඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල කුරුඳු වගාව ව්‍යාප්ත කිරීම.
- කුරුඳු ඵලදායීතාවය ඉහළ නැංවීම, දියුණු වගා ක්‍රම සහ තාක්ෂණය ක්‍රියාත්මක කිරීම තුළින් කුරුඳු වගාව පුළුල් කිරීම.
- කුරුඳු සඳහා පසු අස්වනු සැකසුම් වැඩි දියුණු කිරීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ පාරිභෝගික මනාපයන් සමඟ සමපාත වන අගය එකතු කිරීමේ ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම තුළින් දේශීය පරිභෝජනය මෙන්ම අපනයන ආදායම ඉහළ නැංවීම.

- තත්ව සහතිකකරණ වැඩසටහන් හරහා සැපයුම්දාමයේ අඛණ්ඩතාව ශක්තිමත් කිරීම සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම තුළින් ගෝලීය වෙළෙඳපොළ තුළ ලංකා කුරුඳු සඳහා පවතින කීර්තිය ඉහළ නැංවීම.
- ගුණාත්මක නිෂ්පාදනය සහ අපනයන ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරීම.
- කුරුඳු බෝගයේ සියලු අංශ පිළිබඳ යාවත්කාලීන පර්යේෂණ සහ පුහුණුව සඳහා ප්‍රමුඛ මධ්‍යස්ථානයක් ලෙස ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය ප්‍රවර්ධනය කිරීම සහ එමගින් කුරුඳු කර්මාන්තය තුළ දැනුම හුවමාරු කිරීම සහ නවෝත්පාදනය සඳහා පහසුකම් සැලසීම.

## ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

**දැක්ම**

වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව හා උපදේශන සැපයීම සහ සමීක්ෂණ පැවැත්වීමේ විශිෂ්ට ආයතනය බවට පත්වීම.

**මෙහෙවර**

ගුණාත්මක පුහුණුව තුළින් කර්මාන්තයේ සියලුම මානව වත්කම් හි වෘත්තීය නිපුණතාව පරිපූර්ණත්වය දෙසට ඉහළ නැංවීම.

**අරමුණු**

❖ වැවිලි සේවයෙහි නියුක්ත සියලු කාණ්ඩයන්ට අයත් සේවා නියුක්තිකයන්ට ආයතනය විසින්ම හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන් හි හෝ ඇති වෙනත් ආයතන සම්බන්ධ වැවිලි කළමනාකරණයට අදාළ පුහුණු විමේ පහසුකම් සහ පුහුණු වීමේ පාඨමාලා සැපයීම.

❖ සේවයෙහි යෙදී සිටින සේවා නියුක්තිකයන්ට වැවිලි කළමනාකරණය පිළිබඳ සංස්කරණ සම්මේලන සහ තත්ත්වානුකූලකරණ පාඨමාලා සංවිධානය කිරීම.

❖ රාජ්‍ය අංශයෙහි මෙන් ම සහ පෞද්ගලික අංශයෙහි වැවිලි සේවයේ නියුතු සේවක පිරිස් සඳහා වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව සැලසීම.

❖ තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, පොල් පර්යේෂණ ආයතනය හා වෙනත් ආයතනයන් සමඟ සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලා සංවිධානය කිරීම සහ යෝග්‍ය අවස්ථාවල දී ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

❖ වැවිලි කළමනාකරණය හා සංවර්ධනය සම්බන්ධ වූ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළු පැවැත්වීම සහ සඟරා පළ කිරීම.

❖ වෙනත් සමාන ආයතනවලින් දැනටමත් විධි විධාන සලස්වා නොමැති, වැවිලි කළමනාකරණය සහ කම්කරු සබඳතා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

❖ වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය දක්ෂතාව ඇති තැනැත්තන්ට වැවිලි කර්මාන්තයේ මිනිස් බල අවශ්‍යතාවන් ගැන සැලකිලිමත්ව වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුව ලබා දීම.

❖ වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර යම් වෙනත් ආයතනයකට කළමනාකාරිත්ව, තාක්ෂණික සහ පරිපාලන උපදෙස් හා සේවා සැපයීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 83.00 |
| 02 | පුනරාවර්තන වියදම් | 226.60 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි පුනරුත්ථාපනය | වර්ග මීටර | 1500 | 48.00 |
| 02 | පුහුණු උපකරණ | ඒකක ගණන | 22 | 17.50 |
| 03 | නේවාසිකාගාර පහසුකම් සංවර්ධනය | ඒකක ගණන | 3 | 1.70 |
| 04 | ඉඩම් සංවර්ධනය | වර්ග මීටර | 200 | 4.50 |
| 05 | මෘදුකාංග සංවර්ධනය | ඒකක ගණන | 1 | 2.50 |
| 06 | කුඩා වතු හිමියන්ගේ ධාරිතා සංවර්ධනය | වැඩ සටහන් ගණන | 150 | 6.00 |
| 07 | සේවක ධාරිතා සංවර්ධනය | සේවක ගණන | 50 | 1.00 |
| 08 | විෂය මාලා සංවර්ධනය | විෂය මාලා | 8 | 1.00 |
| 09 | පර්යේෂණ හා සංවර්ධනය | පර්යේෂණ | 1 | 0.80 |
| | **එකතුව** | | | **83.00** |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන්කල මුදල (රු. මි.) | 2024.12.31 දක්වා වියදම් කල මුදල (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 25.00 | 24.16 | 96.6% |
| 02 | පුනරාවර්තන වියදම් | 81.00 | 81.00 | 100% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| අනු අංකය | පුහුණු වැඩසටහන | 2024 වර්ෂය සඳහා සැලසුම් කළ ආදායම/පිරිවැය (රු.මි.) | 2024.12.31 දක්වා ඉපයූ ආදායම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස 2024.12.31 දිනට |
|---|---|---|---|---|
| 01 | අධ්‍යාපනික හා වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 55.32 | 46.12 | 83.3% |
| 02 | තාක්ෂණික හා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | 3.67 | 2.70 | 73.5% |
| 03 | පුහුණු වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම. | 8.21 | 8.39 | 102.1% |
| 04 | කුඩා වතු හිමියන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. | 5.00 | 4.16 | 83.2% |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ආයතනය උපාධි පිරිනමන ආයතනයක් දක්වා සංවර්ධනය<br><br>දේශන ශාලා සහ පර්යේෂණ ඒකක සහිත නව ගොඩනැගිල්ල ඉදිකිරීම.<br>(අදියර 1 සහ 2) | 500.00 | 548.00 | 100% |

- **2025 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්**
  - ❖ වැවිලි කර්මාන්තයේ අභිවෘද්ධිය වෙනුවෙන් නව උපාධි පාඨමාලා දෙකක් හඳුන්වාදීම මඟින් ආයතනය උපාධි පිරිනමන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීම. එහි ඉලක්කගත පාඨමාලා ගණන දෙකකි.
  - ❖ විදේශීය විශ්ව විද්‍යාලයක් සමඟ ගිවිසුම්ගත වී විදේශීය උපාධි පාඨමාලා හඳුන්වාදීම.
  - ❖ සැලසුම් කරන ලද සියළු අධ්‍යයන හා වෘත්තීමය වැඩසටහන් පැවැත්වීම.
  - ❖ සියළුම කාර්ය මණ්ඩල සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
  - ❖ දේශීය හා විදේශීය සිසුන් සඳහා අන්තර්ජාතික පුහුණු පාඨමාලා පැවැත්වීම.
  - ❖ කුඩා වතු හිමියන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
  - ❖ ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කළ හැකි සූර්ය පැනල මඟින් විදුලි අවශ්‍යතාව සපුරා වාර්ෂිකව රු.මි.12.00 ඉතිරි කර ගැනීමට අපේක්ෂා කිරීම.
  - ❖ ක්ෂේත්‍රයේ වර්තමාන අවශ්‍යතාවයන්ට හා උපනතීන්ට අනුව වැඩසටහන් හඳුන්වාදීම හා සංවර්ධනය කිරීම .
  - ❖ නවීන උපාංග සහිතව පුස්තකාල සුහුරුකරණය (Smart Library) කිරීමට අපේක්ෂා කිරීම.
  - ❖ සුදුසුකම්ලත් වැවිලිකරුවන් සඳහා වරලත් වැවිලිකරුවකු යන වෘත්තියභාවය හඳුන්වා දීම සහ සාමාජිකයත්වය තහවුරු කිරීමට කටයුතු කිරීම.
  - ❖ නව ගොඩනැගිල්ලෙහි නව දේශන ශාලා හතරක් සහ පරිඝනක ඒකක දෙකක් ස්ථාපිත කිරීම.
  - ❖ ආයතනයේ අභිනවයෙන් ඉදි කරන ලද දේශන ශාලා සංකීර්ණය තුළ නවීන තාක්ෂණයෙන් යුතු භූගෝලීය තොරතුරු පද්ධති (GIS), දුරස්ථ සංවේදී දත්ත (Remote Sensing) සහ කෘත්‍රිම බුද්ධිය (AI) සංකල්පය හඳුන්වා දිය හැකි පරිගණක විද්‍යාගාර ස්ථාපිත කිරීම.
  - ❖ අන්තර්ජාතික පර්යේෂණ සම්මේලනය පැවැත්වීම.

# පොල් වගාකිරීමේ මණ්ඩලය

**දැක්ම**

ශ්‍රී ලංකාව ලෝකයේ වඩාත්ම කාර්යක්ෂම පොල් නිෂ්පාදකයා කරවීම.

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම හා අපනයන අවශ්‍යතාවය සපුරාලමින්, ස්වයං පෝෂිත තත්ත්වය ළඟා කර ගැනීම පිණිස ඵලදායි උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මඟින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම.

- **2025** වර්ෂයේ මූල්‍ය ඉලක්ක

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 932.50 |
| 02 | පුනරාවර්තන වියදම් | 832.68 |

- **2025** වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | **පොල් ඉඩම් ඵලදායීතාව ඉහළ නැංවීම** | | | 185.00 |
| | 1.1 පොල් ඉඩම් පුනරුත්ථාපන වැඩසටහන | | | |
| | 1.2 ජල සම්පාදන පද්ධති ඉදි කිරීම සඳහා සහනාධාර ලබාදීම. | | | |
| | 1.3 රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන | | | |
| | 1.4 වන සතුන්ගෙන් පොල් වගාව ආරක්ෂා කිරීම පිළිබඳ වැඩසටහන | | | |
| 02 | **පොල් පැළ සිටුවීමේ වැඩසටහන** | | | 195.00 |
| | 2.1 පොල් පැළ ප්‍රවාහනය | | | 35.00 |
| 03 | **"කප් රුක ආයෝජන" ණය** වැඩසටහන | | | |
| | 3.1 පොලී සහන සහ ඇප ආවරණ ලබාදීම. | | | 50.00 |
| | 3.2 කප්රුක ආයෝජන වැඩසටහන සඳහා ණය ලබා දීම. (*චක්‍රීය අරමුදල) | | | 450.00 |
| 04 | ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ති වැඩසටහන් සහ සේවාව සැපයීම. | | | 35.00 |
| 05 | විශේෂ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | | | 30.00 |
| 06 | මාධ්‍ය සහ ප්‍රචාරණය | | | 30.00 |
| 07 | පොල් ඉඩම් ලියාපදිංචි කිරීම. | | | 30.00 |
| 08 | තොරතුරු තාක්ෂණය හරහා ව්‍යාප්ති සේවා පැවැත්වීමේ පහසුකම් | | | 20.00 |
| 09 | ඉදි කිරීම්, අලුත්වැඩියා, මිලදී ගැනීම් සහ වාහන නඩත්තු කිරීම. | | | 70.00 |
| 10 | මානව සම්පත් සංවර්ධනය | | | 5.00 |
| 11 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | | | 60.00 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 550.00 | 550.00 | 100% |
| 02 | පුනරාවර්තන වියදම් | 530.00 | 587.50 | 110% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| පොල් පැළ බෙදාදීමේ වැඩසටහන් | පොල් නව/ නැවත/ යටි වගා සහනාධාරය | 222.40 | 222.40 | නිකුත් කළ පැළ සංඛ්‍යාව - 400,034 |
| | ගෙවතු වගා වැඩසටහන | | | නිකුත් කළ පැළ සංඛ්‍යාව - 276,668 |
| | පාළු පැළ සිටුවීමේ වැඩසටහන | | | නිකුත් කළ පැළ සංඛ්‍යාව - 108,350 |
| | විශේෂ ගෙවතු වගා වැඩසටහන | | | නිකුත් කළ පැළ සංඛ්‍යාව - 196,388 |
| | මුදලට පැළ නිකුත් කිරීමේ වැඩසටහන | | | නිකුත් කළ පැළ සංඛ්‍යාව - 390,987 |
| | උතුරු පොල් ත්‍රිකෝණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. | | | නිකුත් කළ පැළ සංඛ්‍යාව - 132,660 |
| වෙනත් සංවර්ධන වැඩසටහන් | පෙර වසරේ සිටුවන ලද පොල් පැළ අධීක්ෂණ කටයුතු | 3.50 | 1.22 | පොල් පැළ 3,667 ක් අධීක්ෂණය කර ඇත. |
| | කප්රුක ආයෝජන ණය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම. | 450 (RF) | 545 (RF) | අක්කර 3,172 ක් සඳහා ක්‍රියාත්මකයි. |
| | පොලී සහන ඇප ආවරණ ලබාදීම | 50.00 | 51.34 | ඉඩම් 458 ක් සඳහා ඇප ආවරණ ලබාදීම. |
| | එල්නිනෝ තත්වයෙන් පොල් වගාව ආරක්ෂා කිරීම. | 37.86 | 35.78 | පොල් ගස් මිලියන 0.320 ක් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම |
| ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් | සංවර්ධන වැඩසටහන්වලට සමගාමීව කරන ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම. | 36.02 | 29.71 | කණ්ඩායම් වැඩසටහන් - 1,151<br>ඒක පුද්ගල හමුවීම් - 66,146 |
| | බහු මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම. | | | මාධ්‍ය වැඩ සටහන් 05 ක් පැවැත්වීම. |
| | නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | පුහුණු වැඩ සටහන් 22 ක් පැවැත්වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | වගාකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | පුහුණු වැඩ සටහන් 89 ක් පැවැත්වීම. |
| රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන | මයිටා පැකට් බෙදාදීමේ වැඩසටහන | 36.52 | 31.25 | පැකට් 232,365 |
| | රතු හා කළු කුරුමිණි වයල් බෙදාදීමේ වැඩසටහන | | | වයල් 27,386 |
| | මොනක්‍රොටපස් බෙදාදීමේ වැඩසටහන | | | 2,423 |
| | රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන් | | | වැඩසටහන් 78 ක් පැවැත්වීම. |
| පොල් පැළ නිෂ්පාදනය කිරීම | යල - බිම් පැළ | | | 242,570 |
| | යල - බඳුන් පැළ | | | 565,997 |
| | මහ - බිම් පැළ | | | **340,143 |
| | මහ - බඳුන් පැළ | | | **793,666 |

** මෙම පැළ දැනට නිෂ්පාදන තත්වයේ පවතී.

# පොල් සංවර්ධන අධිකාරිය

**දැක්ම**

"පොල් කර්මාන්තය දළ දේශීය නිෂ්පාදනය සඳහා වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම දායකත්වය ලබා දෙන්නා වීම සහ නිෂ්පාදන අළෙවි විවිධාංගීකරණයේ දී ගෝලීය නායකයා වීම."

**මෙහෙවර**

ගෘහස්ථ පාරිභෝජනය සහ කර්මාන්තය සඳහා පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම තහවුරු කිරීම මඟින්, පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජමය ඵලදායීතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය සඳහා ඉහළ දායකත්වයක් කරා ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 531.89 |
| 02 | පුනරාවර්තන වියදම් | 404.779 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | ගෘහස්ථ පොල් පරිභෝජනයේ දී සිදුවන පොල් නාස්තිය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | | | |
| | රූපවාහිනී සාකච්ඡා වැඩසටහන් | වැඩසටහන් | 30 | 15.00 |
| | රූපවාහිනී/ ගුවන්විදුලි/ පුවත්පත් දැන්වීම් | දැන්වීම් | 1,566 | 100.00 |
| | ජනප්‍රිය ටෙලි නාට්‍ය අතරතුර පොල් නිෂ්පාදන ප්‍රවර්ධනය | ප්‍රවර්ධන අවස්ථාවන් | 45 | 3.00 |
| | සමාජ මාධ්‍ය තුළින් ප්‍රවර්ධනය කිරීම | දැන්වීම් | 90 | 5.00 |
| | මහල් නිවාස සහ රජයේ කාර්යාල සංකීර්ණවල මහජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් | 05 | 2.20 |
| | පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය වෙනුවෙන් බස් සන්නාමකරණය සහ දැන්වීම් පුවරු | දැන්වීම් | 20 | 6.00 |
| | දේශීය වෙළෙඳ හා අධ්‍යාපනික ප්‍රදර්ශන සඳහා සහභාගී වීම. | ප්‍රදර්ශන | 12 | 5.00 |
| | පොල් දින වැඩසටහන | වැඩසටහන් | 01 | 5.00 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | ජාත්‍යන්තර වෙළඳපොළ ප්‍රවර්ධන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් | | | |
| | ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම. | ප්‍රදර්ශන | 03 | 21.00 |
| | රට පුරා සංචාරක ප්‍රදේශවල විදේශීය සංචාරකයින්ට පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම. | වැඩසටහන් | 05 | 3.00 |
| | සංචාරක ප්‍රදේශවල තැඹිලි අලෙවිකරුවන් සඳහා තැඹිලි කරත්ත බෙදා හැරීම. | තැඹිලි කරත්ත | 20 | 3.00 |
| | ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා වීඩියෝ නිර්මාණය කිරීම සහ සකස් කිරීම. | වීඩියෝ | 02 | 5.00 |
| | අත් පත්‍රිකාව/ පොත්/ නාමාවලිය මුද්‍රණය කිරීම. | ප්‍රකාශන | 1,500 | 1.00 |
| | සමාජ මාධ්‍ය හරහා ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදන ප්‍රවර්ධනය සහ වෙබ් අඩවි සංවර්ධනය/ නඩත්තුව | නඩත්තු | 01 | 5.00 |
| 03 | වෙළෙඳපොළ සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම. | සමීක්ෂණ | 03 | 4.20 |
| 04 | පොල් ආශ්‍රිත අවිධිමත් අංශයේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හා අලෙවිය පුළුල් කිරීම. (පුහුණු කිරීම / දැනුවත් කිරීම/ තාක්ෂණ හුවමාරුව) | ප්‍රතිලාභීන් | 300 | 3.00 |
| | පරිසර හිතකාමී පොල්කටු දහන උඳුන් ස්ථාපනය කිරීම. (එක් පුද්ගලයෙකුට උපරිමය ලක්ෂ 2.50 බැගින්) | ප්‍රතිලාභීන් | 20 | 5.00 |
| | පොල් පැණි, පොල් සීනි, පොල් හකුරු, පොල් අයිස්ක්‍රීම් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.(උපරිමය ලක්ෂ 1 බැගින් උපකරණ සඳහා) | ප්‍රතිලාභීන් | 30 | 3.00 |
| 05 | ගුණාත්මක පොල්තෙල් නිෂ්පාදනය/ පරිභෝජනය සම්බන්ධව දැනුවත් කිරීම | ප්‍රතිලාභීන් | 350 | 2.00 |
| | වෙළඳපොළ පොල්තෙල් පරීක්ෂා කිරීම. | නියැදි | 400 | 6.00 |
| | කර්මාන්තශාලාවල නිෂ්පාදනය කෙරෙන පොල්තෙල්වල තත්වය පරීක්ෂා කිරීම. (ජංගම රසායනාගාරය) | නියැදි | 200 | 2.00 |
| 06 | නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා විකල්ප බලශක්ති ප්‍රභවයන් භාවිතය සඳහාවූ ණය යෝජනා ක්‍රමය | ප්‍රතිලාභීන් | 20 | 200.00 |
| 07 | නිලධාරින්ගේ තාක්ෂණික දැනුම වර්ධනය/ ISO 17020 ප්‍රතීතනය | පුහුණු වැඩසටහන් | 12 | 2.00 |
| | යහපත් පිළිවෙත් නිෂ්පාදන සහතිකකරණය/ පොල් නිෂ්පාදනය සම්බන්ධ නීති රෙගුලාසි පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම. | ප්‍රතිලාභීන් | 500 | 2.00 |

| | | | | |
|---|---|---|---|---|
| 08 | අපනයන සහ දේශීය පරිභෝජනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන්හී තත්වය සහතික කිරීම. (දෛනික දිසිදි, කොහුබත් අපනයන) | ආදර්ශ ප්‍රමාණය | 16,500 | |
| 09 | පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා රසායනාගාර පරික්ෂණ සේවා පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම. (ඉල්ලුම්කරුවන් විසින් යොමු කරන ආදර්ශ) | ආදර්ශ ප්‍රමාණය | 1,000 | |
| 10 | ISO/IEC 17025 ප්‍රතීතන තත්වයට අදාලව රසායනාගාර, උපකරණ, නවීකරණය, වැඩි දියුණු කිරිම හා ක්ෂුද්‍ර ජීවි සහ රසායනික පරික්ෂණ සඳහා ලබා ඇති ප්‍රතීතන තත්වය පවත්වා ගැනීම. | ළඟාකර ගැනීම | ප්‍රතීතන තත්වය අඛණ්ඩව පවත්වා ගැනීම | 2.50 |
| | පුහුණු පාඨමාලා | පුහුණු වැඩසටහන් | 08 | |
| 11 | අපනයනය සඳහා නිෂ්පාදනය වන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්වය සුරක්ෂිත කිරීම. | ආදර්ශ ප්‍රමාණය | 350 | |
| | | ක්ෂේත්‍ර රාජකාරි වාරගණන | 400 | |
| | දේශීයව නිෂ්පාදිත පොල්තෙල් සඳහා ඇෆ්ලටොක්සින් පරික්ෂා කිරීම. | ආදර්ශ ප්‍රමාණය | 600 | |
| | කොහු බත් උපස්ථරයන්හි වැලි අන්තර්ගතය නිර්ණය කිරීම. | ආදර්ශ ප්‍රමාණය | 150 | |
| 12 | සැකසුම් සංවර්ධන අංශයේ ක්‍රියාකාරිත්වයට අදාළව පොල් නිෂ්පාදන විශ්ලේෂණය (නැවුම් පොල්තෙල්, පොල්තෙල්, කොහුබත්, පොල් කිරි හා පිටි කළ පොල් කිරි, මේදය තරමක් ඉවත් කළ දිසිදි පොල්තෙල්, පොල් කටු අඟුරු) | ආදර්ශ ප්‍රමාණය | 900 | |
| 13 | දේශීය හා විදේශීය වශයෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදන ඉල්ලුම අඛණ්ඩව සපුරාලීම සඳහා පොල් ආශ්‍රිත කර්මාන්ත හා අලෙවි ක්ෂේත්‍ර පුළුල් කිරීම. | | | 15.00 |
| 14 | පොල් ක්ෂේත්‍රයට සම්බන්ධ වන පාර්ශ්වයන්ට කාර්යක්ෂම හා ගුණාත්මක සේවයක්, ලබාදීම උදෙසා සේවා පද්ධති සම්පාදනය ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම හා ක්‍රම වේද පුළුල් කිරීම. | | | 55.00 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 433.45 | 68.54 | 15.8% |
| 02 | පුනරාවර්තන වියදම් | 150.00 | 150.00 | 100% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| දේශීය අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් | දේශීය වෙළෙඳ හා අධ්‍යාපනික ප්‍රදර්ශන සඳහා සහභාගී වීම. | 3.40 | 3.50 | ප්‍රදර්ශන 12 |
| | පොල් අංශයේ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් | 0.10 | 0.03 | වැඩසටහන් 1 |
| | පොල් අපනයනකරුවන් සඳහා සම්මාන උළෙල | 6.00 | 4.33 | සම්මාන උළෙල 01 |
| | පොල් දින වැඩසටහන | 2.00 | 0.39 | වැඩ සටහන් 01 |
| | පොල් නාස්තිය අවම කිරීම සඳහා සකසන ලද පොල් කිරි නිෂ්පාදන ගෘහස්ථ භාවිතය ජනප්‍රිය කිරීම සහ පොල් කටු සහ ලෙලි එකතු කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම. | 5.00 | 0.34 | පුවත්පත් දැන්වීම් පළ කරන ලදි. අනෙකුත් ක්‍රියාකාරකම් ප්‍රසම්පාදන කටයුතු කරමින් පවතී. |
| ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් | ජාත්‍යන්තර වෙළඳපොළ ප්‍රවර්ධන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් | 60.00 | 33.11 | වැඩසටහන් 05 |
| | පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා විදේශ වෙළඳාම වැඩි දියුණු කිරීම සඳහා විදේශීය නියෝජිතයින් සමඟ සාකච්ඡා පැවැත්වීම. | 0.50 | 0.266 | සාකච්ඡා 05 |
| | ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ වාණිජ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට විදේශීය ගැනුම්කරුවන් සම්බන්ධ කිරීමේ අවස්ථා සැකසීම. | 0.20 | 0.035 | |
| | ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන සඳහා වීඩියෝ නිර්මාණය කිරීම සහ සකස් කිරීම. | 4.30 | 0.00 | වීඩියෝ 2 |
| | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ සහයෝගයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් අතර පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම. | 2.00 | 0.00 | |
| | පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය හරහා ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම/ පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් | 0.50 | 0.135 | |

| | | | | |
|---|---|---|---|---|
| | අඩවිය වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම. | | | |
| වෙළෙඳපොළ සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම | කප්රුක අරමුදල සමඟ වෙළෙඳපොළ/ නිෂ්පාදන සමීක්ෂණය පැවැත්වීම. | 0.20 | 0.00 | 01 |
| | විශ්වවිද්‍යාලයක් සමඟ එක්ව වෙළෙඳපොළ පර්යේෂණයක් පැවැත්වීම. | 2.00 | 0.00 | 01 |
| ඉරටු, පොල් යුෂ, පොල් ලෙලි, පොල් කටු ආදී අභාවිතව පවතින අමුද්‍රව්‍ය කර්මාන්තයට රැගෙන ඒම. | මධ්‍ය හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 4.50 | 4.30 | දැනුවත් කිරීම්/ වැඩසටහන් 43 |
| | පොල්කටු එකතු කිරීම සඳහා පාසල් මට්ටමෙන් දැනුවත් කිරීම. | 0.50 | 0.04 | වැඩසටහන් 18 |
| දේශීය පොල්තෙල් කර්මාන්තය සංවර්ධනය කිරීම. | දේශීය වෙළෙඳපොළේ ගුණාත්මක පොල්තෙල් සුලභතාවය ඇති කිරීම. | 10.00 | 1.00 | වැඩසටහන් 04 ක් දේශීය පොල්තෙල් නියාමනය සම්බන්ධ නීති රෙගුලාසි කෙටුම්පත් කිරීම. |
| | ඇෆ්ලටෝක්සින් රහිත පොල්තෙල් නිෂ්පාදන ක්‍රමවේදයන් හඳුනාගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම. | 6.50 | 5.18 | නියැදි 354 ක් පරීක්ෂා කිරීම් සඳහා යොමුකර ඇත. |
| සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන්ගේ ධාරිතාවය ඉහළ නැංවීම. | කාර්ය මණ්ඩල පුහුණුව ISO 17020:2012 විෂය පථය පුළුල් කිරීම. | 3.00 | 1.90 | පුහුණු වැඩසටහන් 13 ක් පවත්වා ඇත. |
| ඉහළ ආදායම් ලැබෙන නිෂ්පාදන සංවර්ධනය කිරීම. | ඉහළ ආදායම් ලැබෙන නිෂ්පාදන තවදුරටත් සංවර්ධනය කිරීම. | 0.50 | 0.50 | නව නිෂ්පාදන සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පවත්වා ඇත. |
| | පොල් කර්මාන්තය නව්‍යකරණය සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් හඳුනාගැනීම. | 0.50 | 0.50 | තාක්ෂණික හුවමාරු වැඩසටහන් 02 ක් පවත්වා ඇත. |

# පොල් පර්යේෂණ ආයතනය

**දැක්ම**

පොල් සංවර්ධන සඳහා අවශ්‍ය පර්යේෂණ, තාක්ෂණය ජනනය කිරීම සහ තාක්ෂණ ප්‍රවර්ධනය කිරීමෙහිලා කලාපයේ ප්‍රමුඛයා බවට පත්වීම

**මෙහෙවර**

පොල් කර්මාන්තයේ තිරසාර දියුණුව සඳහා අවශ්‍ය වන තාක්ෂණ දැනුම පර්යේෂණ කටයුතු මගින් බිහි කිරීම.

**අරමුණු**

පොල් පර්යේෂණ ආයතනය විසින් ශ්‍රී ලංකාවේ පොල් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා අවශ්‍ය නිර්දේශ නිකුත් කිරීමට අවශ්‍ය පර්යේෂණ සිදු කරනු ලබයි.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 244.125 |
| 02 | පුනරාවර්තන වියදම් | 401.805 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු. මි.) |
|---|---|---|---|---|
| 01 | පොල් නිෂ්පාදනය වැඩිකිරීමට හා පොල් ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීමට අවශ්‍ය දේශගුණ විපර්යාසවල බලපෑම නැවැත්වීම සහ අවම කිරීමේ පර්යේෂණ, සත්ත්ව පාලන සහ ශෂ්‍ය විද්‍යාත්මක නිර්දේශ සඳහා අවශ්‍ය පර්යේෂණ සිදුකිරීම. | නිර්දේශ සංඛ්‍යාව | තෙතමන සංරක්ෂණය, නව ආවරණ බෝග හා ගෝචර තෘණ පිළිබඳ, පැළ වගාවේ නියඟය නිසා සිදුවන හානිය මඟහරවා ගැනීමට රසායන ද්‍රව්‍ය අත්හදා බැලීම පිළිබඳව දැනට පවත්වාගෙන යනු ලබන පර්යේෂණවල දත්ත රැස්කිරීම. නිර්වද්‍ය කෘෂිකර්මය පිළිබඳ පර්යේෂණයක් ආරම්භ කිරීම. | 9.945 |
| 02 | පළිබෝධ හා රෝග මගින් පොල් අස්වැන්නට සිදු වන හානිය අවම කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීමට අවශ්‍ය පර්යේෂණ සිදු කිරීම. | නිර්දේශ සංඛ්‍යාව | සුදු මැස්සා, රතු කුරුමිණියා, වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය, බ්‍රොන්ටිස්පා කුරුමිණියා, ප්ලෙසිස්පා කුරුමිණියා යන රෝග හා පළිබෝධ මර්දනය සඳහා අවශ්‍ය නිර්දේශ නිකුත් කිරීමට අවශ්‍ය පර්යේෂණ පවත්වාගෙන යාම. | 1.65 |

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු. මි.) |
|---|---|---|---|---|
| | | | බ්‍රොන්ටිස්පා කුරුමිණියා සඳහා ජීව විද්‍යාත්මක පාලන නිර්දේශ දෙකක් නිකුත් කිරීම, රතු කුරුමිණියා සහ ප්ලේසිස්පා කුරුමිණියා සඳහා නිර්දේශ ලබාදීම. | |
| 03 | පොල් ජාන වැඩි දියුණු කිරීම් හරහා පොල් නිෂ්පාදනය සහ ඉඩම් ඵලදායීතාව වැඩි කිරීම. | වැඩි දියුණු කරන ලද පොල් ප්‍රභේද සංඛ්‍යාව<br><br>සංරක්ෂණය කරන ලද පොල් සහ තැඹිලි ප්‍රභේද සංඛ්‍යාව<br><br>හඳුනාගත් තැඹිලිවල විවිධත්ව ප්‍රමාණය | වැඩි අස්වැන්නක් සහ අනෙකුත් ලක්ෂණ සහිත (කීමට සහ පළිබෝධ හා රෝග සඳහා ප්‍රතිරෝධී) පොල් ප්‍රභේද නිෂ්පාදනය සඳහා අවශ්‍ය ජාන ප්ලාස්මාව සංරක්ෂණය කිරීම හා එම ප්‍රභේද භාවිතා කර නව පොල් ප්‍රභේද නිෂ්පාදනයට අවශ්‍ය සියලු පර්යේෂණ සිදු කිරීම.<br><br>තැඹිලි වගාවේ විවිධත්වය හඳුනාගැනීමට අවශ්‍ය පර්යේෂණ සිදු කර එම විවිධත්වය තහවුරු කිරීම | 7.90 |
| 04 | පටක රෝපණය මගින් පොල් හා තැඹිලි නිෂ්පාදනය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම. | හඳුන්වා දෙන ලද නව තාක්ෂණ සංඛ්‍යාව | පොල් පටක රෝපණයට අවශ්‍ය පර්යේෂණ සිදු කිරීම.<br><br>තැඹිලි පටක රෝපණය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම. | 4.60 |
| 05 | අගය එකතු කිරීම හරහා පොල් ආශ්‍රිත කර්මාන්තවල ආදායම වැඩි කිරීම. | නිෂ්පාදන සංඛ්‍යාව | දැනට කරගෙන යනු ලබන අගය එකතු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීම. | 2.292 |
| 06 | සායනික අධ්‍යයන මගින් පොල්තෙල්වල සෞඛ්‍ය ප්‍රතිලාභ හෙළි කිරීම. | ජනනය කරන ලද තොරතුරු ප්‍රමාණය | ග්ලයිසිමික් දර්ශකය අඩු ආහාර නිෂ්පාදනය, ආහාරමය තන්තු වැඩි ආහාර සහ පොල්තෙල්වල ප්‍රතිඔක්සිකාරක පිළිබඳ පර්යේෂණ සිදු කර නිර්දේශ ලබාදීම. | 1.51 |
| 07 | පොල් කර්මාන්තයේ ගෝලීය තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම මගින් ජාතික ආදායම වැඩිකිරීම. | නිකුත් කළ ප්‍රතිපත්ති යෝජනා සංඛ්‍යාව | අපනයන වෙළඳාම සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනාවන් ඉදිරිපත් කිරීම.<br><br>නැවුම් පොල් තෙල් නිෂ්පාදනයේ පවතින ගැටළු හා අභියෝග නිරාකරණය සඳහා ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීම.<br><br>කොහු ආශ්‍රිත නිෂ්පාදන සඳහා පවතින ගැටළු හා අභියෝග නිරාකරණය සඳහා ප්‍රතිපත්ති | 1.50 |

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු. මි.) |
|---|---|---|---|---|
| | | | යෝජනා ඉදිරිපත් කිරීම.<br>පොල් අගයදාම විශ්ලේෂණය හා ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීම. | |
| 08 | පොල් ක්ෂේත්‍රය සඳහා විවිධ සේවාවන් සැපයීම. | පොල් පැළ සංඛ්‍යාව | පොල් පැළ සහතික කිරීම | 34.635 |
| | | පරපෝෂිතයන් සංඛ්‍යාව | පරපෝෂිතයන් බෝ කිරීම | |
| | | පුහුණු සැසි සංඛ්‍යාව | පුහුණු සැසි පැවැත්වීම | |
| | | ක්ෂේත්‍ර ආදර්ශන සංඛ්‍යාව | ක්ෂේත්‍ර ආදර්ශන පවත්වාගෙන යාම | |
| | | විශ්ලේෂණ වාර්තා සංඛ්‍යාව | කොහුබත්, පොහොර, ජලය, ආහාර යනාදිය විශ්ලේෂණය කර අවශ්‍ය වාර්තා ලබාදීම. | |
| | | උපදෙස් නිකුත් කිරීම් ප්‍රමාණය | පාර්ශ්වකරුවන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම. | |
| | | කප්රුක හා කෙටි පණිවිඩ (SMS) උපදේශන සංඛ්‍යාව | කප්රුක හා කෙටි පණිවිඩ (SMS) සේවාව පවත්වාගෙන යාම. | |
| | | අධීක්ෂණය කළ බීජ පොල් උයන් සංඛ්‍යාව | පොල් පර්යේෂණ ආයතනය හා අනෙකුත් ආයතනවලට අයත් බීජ පොල් උයන් අධීක්ෂණය | |
| | | ප්‍රතිපත්ති යෝජනා සංඛ්‍යාව | ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කිරීම. | |
| | | ඇස්තමේන්තු වාර්තා සංඛ්‍යාව | පොල් අස්වැන්න පුරෝකථනය කිරීම හා සත්‍ය අස්වැන්න ඇස්තමේන්තු කිරීම. | |
| | | වගාකරුවන්ට නිකුත් කළ පෙරමෝන නල හා ජෙලි සංඛ්‍යාව | පෙරමෝන නල හා ජෙලි නිෂ්පාදනය යන කාර්යයන් අඛණ්ඩව සිදු කර ගෙන යාම. | |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කල මුදල (රු.මි) | 2024.12.31 දක්වා වියදම් කල මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 15.00 | 14.15 | 94.33% |
| 02 | පුනරාවර්තන වියදම් | 320.00 | 318.66 | 99.58% |
| 03 | ප්‍රාග්ධන වියදම් | 32.70 | 24.29 | 74.21% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | වෙන් කල මුදල (රු.මි) | වැය කල මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| වැලිගම පොල් කොළ මැලවීමේ රෝග මර්දන ව්‍යාපෘතිය | 23.50 | 12.815 (අතැති බිල්-7.662) | 54.53% |
| පොල් පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම. | 5.00 | 3.93 | 78.6% |
| අත්‍යවශ්‍ය විද්‍යාගාර උපකරණ අළුත්වැඩියා කිරීම. | 3.00 | 0.4151 (ඉදිරිපත් කර ඇති ගැණුම් ඇණවුම් 3.8149) | 86% |

- **2025 වර්ෂයේ දී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්**

1. පොල් බීජ උයන්වල අලි වැටවල් ඉදිකිරිම.
2. පොල් කිරිවල අස්වැන්න සහ ගුණාත්මකභාවය කෙරෙහි පොල් ප්‍රභේදයේ, අස්වැන්නේ පරිණතභාවයේ සහ වැඩෙන දේශගුණික තත්ත්වයන්හි බලපෑම අධ්‍යයනය
3. වැලිගම පොල් කොළ මැලවීමේ රෝග පාලන ව්‍යාපෘතිය
4. අපනයනය ඉලක්ක කරගත් කර්මාන්ත සඳහා තැඹිලි ප්‍රවර්ධනය වෙනුවෙන් අවශ්‍ය භෞත-රසායනික, ජීව රසායනික සහ ශාක රසායනික පර්යේෂණ සිදුකිරීම.

# තල් සංවර්ධන මණ්ඩලය

**දැක්ම**

ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා ජවයෙන් යුතු ක්ෂේත්‍රයක් වශයෙන් තල් අංශය සංවර්ධනය කිරීම.

**මෙහෙවර**

දේශයේ දළ දේශීය නිෂ්පාදිතය වෙත සුවිශේෂී දායකයකු වනු පිණිස තිරසාර තල් කර්මාන්තය සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචලිත කරවීම හා නියාමනය කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්මේන්තුගත මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 92.00 |
| 02 | පුනරාවර්තන වියදම් | 286.31 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | තල් මව් ශාක තෝරා ගැනීම | මව් පැළ ගණන | 500 | 0.30 |
| 02 | තල් බීජ සිටුවීම | නව වගාව | අක්. 500 | 1.50 |
| 03 | ආදර්ශ ගොවිපල නඩත්තු කිරීම | නඩත්තු කරන ලද ගොවිපල ගණන | 01 | 0.20 |
| 04 | ග්‍රාමීය ප්‍රදේශයේ කාන්තා කණ්ඩායම් සඳහා මාස 06 ක මූලික අත්කම් පුහුණුව පැවැත්වීම. | පුහුණුව ලැබූ පුහුණු කරුවන් සංඛ්‍යාව | 200 | 5.00 |
| 05 | පුහුණුකරුවන් / බද්ධකරුවන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) සතියක පුහුණු වැඩසටහනක් පැවැත්වීම. | ප්‍රතිලාභීන් 25 බැගින් පුහුණු වැඩසටහන් | 02 | 0.70 |
| 06 | තරුණ තල් රා මදින්නන්ගේ පුහුණු කිරීම | පුහුණුව ලැබූ පුහුණු කරුවන් සංඛ්‍යාව | 100 | 2.50 |
| 07 | පල්ප සංරක්ෂණය සහ පල්ප පදනම් වූ අගය එකතු කළ නිෂ්පාදනයන් සිදු කිරීමේ දින 05 ක පුහුණු වැඩසටහන් පැවැත්වීම. | පුහුණුව ලැබූ පුහුණු කරුවන් සංඛ්‍යාව | 60 | 0.30 |
| 08 | තල් සංවර්ධන මණ්ඩලය යටතේ පවතින නිෂ්පාදන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම. | වැඩිදියුණු කර ක්‍රියාත්මක වන නිෂ්පාදන මධ්‍යස්ථාන සංඛ්‍යාව | 07 | 10.00 |
| 09 | පවතින නිෂ්පාදන උපකරණ අලුත් වැඩියා කිරීම | ක්‍රියාත්මක භාවයට ලක් කරන ලද උපකරණ සංඛ්‍යාව | 07 | 1.00 |
| 10 | නිෂ්පාදන මධ්‍යස්ථාන වෙත තත්ත්ව පාලන උපකරණ මිලදී ගැනීම. | මිලදී ගත් උපකරණ ගණන | 15 | 1.50 |

| | | | | |
|---|---|---|---|---|
| 11 | අමුද්‍රව්‍ය සඳහා නිසි ගබඩා පහසුකම් ඇති කිරීම. | වැඩ අවසන් ප්‍රතිශතය | 100 | 5.00 |
| 12 | ත්‍රිකුණාමලයේ උප්පුවේලිහි නව කට්පහම් අලෙවි මධ්‍යස්ථානයක් පිහිටුවීම.<br>(අදියර ii) | වැඩ අවසන් ප්‍රතිශතය | 100 | 2.00 |
| 13 | සුපිරි වෙළඳසැල්වල ෆ්‍රැන්චයිස් අලෙවි ඒකකයක් විවෘත කිරීම. | අලෙවි මධ්‍යස්ථාන සංඛ්‍යාව | 02 | 1.00 |
| 14 | අපනයන ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම. | පවත්වන ලද රැස්වීම් ගණන | 01 | 0.50 |
| 15 | තල් නිෂ්පාදන ප්‍රචාරණය සහ ප්‍රචලිත කිරීම. | සවි කරන ලද පුවරු ගණන | 05 | 1.00 |
| 16 | දැනට පවතින කට්පහම් අලෙවිසැල් වැඩි දියුණු කිරීම | වැඩි දියුණු කළ කට්පහම් අලෙවි මධ්‍යස්ථාන ප්‍රමාණය | 02 | 1.00 |
| 17 | අලෙවි මධ්‍යස්ථාන සඳහා මුදල් යන්ත්‍රය සහ POS පද්ධතිය සහ ගෘහ භාණ්ඩ ලබාදීම. | වැඩි දියුණු කළ කට්පහම් ගණන | 02 | 2.00 |
| 18 | කටුනායක ගුවන්තොටුපලේ තල් ප්‍රදර්ශනාගාරය සහ තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම. | ගුවන්තොටුපලේ ස්ථාපිත තොරතුරු මධ්‍යස්ථාන ගණන | 01 | 2.00 |
| 19 | තල් කර්මාන්තය නංවාලීම සඳහා පර්යේෂණ දිගටම කරගෙන යාම | පර්යේෂණ සංඛ්‍යාව | 05 | 2.00 |
| 20 | පර්යේෂණ සොයාගැනීම් බෙදාහැරීම සහ වාණිජකරණය කිරීම. | වාණිජකරණය වූ නිෂ්පාදන සංඛ්‍යාව | 05 | 2.00 |
| 21 | ජංගම තත්ත්ව පාලන ඒකකයක් පිහිටුවීම | තත්ත්ව පාලන ඒකක ක්‍රියාත්මක කිරීම | 01 | 1.00 |
| 22 | ප්‍රමිතිකරණ (ISO) විෂය පථය පුළුල් කිරීම සහ නඩත්තු කිරීම | නඩත්තු කරන ලද විෂය පථයන් ගණන | 25 | 2.00 |
| 23 | රසායනික ගබඩාව පුළුල් කිරීම | වැඩ අවසන් ප්‍රතිශතය | 100 | 5.00 |
| 24 | විදුලි පිරිවැය අඩු කිරීම සඳහා PRI වෙත සූර්ය පැනල (අදයර i) ලබාදීම. | ප්‍රතිලාභ ලැබූ මධ්‍යස්ථාන ගණන | 03 | 8.00 |
| 25 | ආයතනික වත්කම් සංවර්ධනය | ශක්තිමත් කරන ලද දිස්ත්‍රික් කාර්යාල සංඛ්‍යාව | 04 | 2.00 |
| 26 | ප්‍රධාන කාර්යාලයේ සම්මන්ත්‍රණ ශාලා පහසුකම් වැඩි දියුණු කිරීම. | වැඩ අවසන් ප්‍රතිශතය | 100% | 5.00 |
| 27 | කාර්ය මණ්ඩලය සඳහා ධාරිතාව ගොඩනැගීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | පුහුණුව ලැබූ සේවක සංඛ්‍යාව | 50 | 1.00 |
| 28 | තල් පුහුණු ආයතනයේ වැඩ නිම කිරීම, කයිතඩි<br>(අදියර iv) | වැඩ අවසන් ප්‍රතිශතය | 100% | 17.00 |
| 29 | පවතින වාහන තත්ත්වය වැඩි දියුණු කිරීම | තත්ත්වය වැඩි දියුණු කළ වාහන සංඛ්‍යාව | 03 | 1.00 |
| 30 | ප්‍රධාන කාර්යාල පරිශ්‍රවල වාහන සඳහා නිසි වාහන නැවැත්වීමේ පහසුකම් ස්ථාපිත කිරීම. | වැඩ අවසන් ප්‍රතිශතය | 100% | 2.00 |

| | | | | |
|---|---|---|---|---|
| 31 | කයිතඩි ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කල් ඉකුත් වූ ගෙවීම් පියවීම. | | | 3.00 |
| 32 | රසායනාගාර අයිතම සඳහා කල් ඉකුත් වූ ගෙවීම් පියවීම. | | | 2.00 |
| 33 | ව්‍යාපෘති පරිපාලන පිරිවැය | | | 1.50 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩ සටහන | **2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි)** | **2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි)** | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධනය වියදම් | 24.00 | 23.11 | 96.29% |
| 02 | පුනරාවර්තන වියදම් | 145.00 | 255.21 | 176% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| අනු අංකය | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | 1.1 පවතින ආදර්ශ ගොවිපල ප්‍රතිසංස්කරණය කිරීම. | 0.20 | 0.19 | කජු සිටුවීම අවසන්, (පුලියන්කුලම 200, මාමුනෙයි 200) |
| | 1.2 තල් මව් ශාඛ තෝරා ගැනීම. | 0.30 | 0.15 | විවිධ ප්‍රදේශවල විවිධ ප්‍රභේදවලට අයත් මව් ශාක 200 ක් තෝරාගෙන වැඩිදුර අධ්‍යයනයන් සඳහා පොල් පර්යේෂණ ආයතනය සමඟ සහයෝගීතාවයක් ඇති කරගන්නා ලදි. (තල්වල සෘතුමය ඵලදායීතාවය සහ මැදීමේ ලක්ෂණ හේතුවෙන් එය ලබන වසර දක්වා පවතිනු ඇත.) |
| 02 | 2.1 කාන්තා කණ්ඩායම් සඳහා හස්ත කර්මාන්ත පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 0.82 | 0.77 | තල් ආශ්‍රිත අත්කම් නිර්මාණය කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණුවීම් අවසන් කර ඇත. වවුනියා (ප්‍රතිලාභීන් 20), මඩකලපුව (ප්‍රතිලාභීන් 22), හම්බන්තොට (ප්‍රතිලාභීන් 21) සහ ත්‍රිකුණාමලය (ප්‍රතිලාභීන් 24), කිලිනොච්චි (ප්‍රතිලාභීන් 13) |

| | | | | |
|---|---|---|---|---|
| | 2.2 ජාතික වෘත්තීය නිපුණතා සහතිකය අදියර - III (NVQ Level – III) අදියර 1 ට අදාලව තරුණ මදින්නන් සඳහා ගස් නැගීම පිළිබඳව පුහුණුවීම් පැවැත්වීම. | 0.30 | 0.13 | පුහුණු වැඩසටහන් අවසන් කරන ඇත. රා මැදීම සෘතුමය ක්‍රියාවලියක් බැවින් පුහුණුව ආරම්භ කරන ලද අතර, එය සති දෙකක් ඇතුළත එය අවසන් වේ. |
| | 2.3 කාන්තා කණ්ඩායම් සඳහා පල්ප් සහ පල්ප් පදනම් කරගත් ආහාර සැකසුම් පුහුණුවීම් පැවැත්වීම. | 0.38 | 0.25 | පුහුණුවීම් 02 ක් අවසන් කර ඇත. (කිලිනොච්චිය, මඩකලපුව). |
| 03 | 3.1 හකුරු සැකසුම් සහ පල්ප සැකසුම් මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම. (සිංගයිනගර්, පුලියන්කුලම්) | 0.90 | 0.90 | හකුරු සැකසුම් මධ්‍යස්ථානය සඳහා අර්ධ ස්ථිර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. පුලියන්කුලමේ මෝල සවි කිරීම සම්පූර්ණ කර ඇත. |
| | 3.2 හකුරු නිෂ්පාදන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීමට හකුරු භාජන සහ තත්ව පාලන උපකරණ ලබාදීම. | 2.00 | 1.70 | භාණ්ඩ මිලදී ගෙන ඇත. |
| | 3.3 තල් නිෂ්පාදන සඳහා ආකර්ෂණීය ඇසුරුම් ද්‍රව්‍ය හඳුන්වාදීම. | 0.20 | 0.20 | වැඩ අවසන් කර ඇත. |
| | 3.4 කයිතඩි, කරෙයිනගර් තල් ආහාර නිෂ්පාදන මධ්‍යස්ථානය යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) ඇතුළත් සහතික කළ මධ්‍යස්ථාන ලෙස පවත්වා ගෙන යාම. | 1.15 | 1.15 | උපකරණ මිලදී ගැනීම අවසන් කර ඇත. (තෙතමනය විශ්ලේෂකය, ඩිජිටල් උෂ්ණත්වමානය) යටිතල පහසුකම් වැඩ නිම කර ඇත. |
| | 3.5 යන්ත්‍රවල නිසි ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා දැනට පවතින යන්ත්‍ර සහ උපකරණ ඵලදායී ලෙස නඩත්තු කිරීම. | 1.00 | 1.00 | වැඩ අවසන් කර ඇත. මිලදී ගැනීම් අවසන් කර ඇත. |
| | 3.6 යන්ත්‍රවල නිසි ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා දැනට පවතින නියමු යන්ත්‍ර සහ විද්‍යාගාර උපකරණ ඵලදායී ලෙස නඩත්තු කිරීම. | 1.00 | 1.00 | ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍ර අලුත් වැඩියා කටයුතු අවසන් කර ඇත. |
| 04 | 4.1 "කටපහම්" අලෙවි මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම. | 0.50 | 0.50 | නාම පුවරුව සවිකිරීම අවසන්. කොන්ඩෝල් මිළට ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත. |
| | 4.2 අපනයන ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම. | 0.30 | 0.30 | වැඩ අවසන් කර ඇත. |
| | 4.3 ත්‍රිකුණාමලයේ උප්පුවේලිහි කටපහම් මධ්‍යස්ථානය පිහිටුවීම. | 0.80 | 0.80 | වැඩ අවසන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | 4.4 කොළඹ කට්පහම් නැවත ස්ථානගත කිරීම. | 0.50 | 0.50 | වැඩ අවසන් කර ඇත. |
| | 4.5 තල් නිෂ්පාදන ප්‍රචලිත කිරීම. | 0.50 | 0.50 | වාහන නැවත සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇත. |
| 5 | 5.1 තල් කර්මාන්තය නංවාලීම සඳහා පර්යේෂණ පැවැත්වීම. | 2.00 | 2.00 | පර්යේෂණ 10 ක් අවසන් කර ඇත.<br>බෙදා හැරීමේ වැඩසටහන් 09 ක් අවසන් කර ඇත.<br>නව රසායනික පරාමිතීන් 03 ක් නිරීක්ෂණ තක්සේරුව සම්පූර්ණ කර ඇත. |
| 06 | 6.1 වවුනියාව දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ලේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම. | 1.28 | 1.20 | වැඩ අවසන් කර ඇත. |
| | 6.2 හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය ශක්තිමත් කිරීම. | 0.50 | 0.50 | වැඩ අවසන් කර ඇත. |
| | 6.3 කාර්ය මණ්ඩලය සඳහා පුහුණුවීම් පැවැත්වීම. | 0.67 | 0.67 | කාර්යාල පද්ධති කළමනාකරණය, වත්කම් සත්‍යාපනය හා ලිපි ගොනු නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් අවසන් කර ඇත. |
| | 6.4 තල් පුහුණු ආයතනයේ පළමු මහලේ වැඩ නිම කිරීම, කයිතඩි<br>(අදියර iii) | 8.00 | 8.00 | ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. |

# කිතුල් සංවර්ධන මණ්ඩලය

**දැක්ම**

ලංකාවේ කිතුල් කර්මාන්තයේ තිරසාර සංවර්ධනයට උත්ප්‍රේරකයක් වීම.

**මෙහෙවර**

තම ප්‍රජාව විසින්ම ලබාගෙන නිෂ්පාදනය කරනු ලබන ශ්‍රී ලාංකේය කිතුල් නිෂ්පාදන පරිභෝජනයට දේශීය ජනතාව උනන්දු කරවන අතරම ගෝලීය වෙළෙඳපොළ ජයගැනීම සඳහා සවිබල ගැන්වූ කිතුල් ව්‍යවසායකයින් හරහා රටට තිරසාර ආර්ථික වර්ධනයක් ගෙන දෙමින් ශ්‍රී ලාංකේය කිතුල් නිෂ්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඉහළ නංවාලීම.

**අරමුණු**

1. අපනයන සහ ආනයන කටයුතුවල දී මිල සහ තත්ව ප්‍රමිතින් නියාමනය කිරීම.
2. කර්මාන්තයේ සුමට ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපාන දැනට පවතින නීති සහ රෙගුලාසි ප්‍රතිසංස්කරණය කිරීම.
3. වටිනාකම්දාම ප්‍රවේශය හරහා නිෂ්පාදනයන්ට සහාය වීම සඳහා මහා පරිමාණ හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජාලගත කිරීම.
4. ව්‍යවසායකත්ව සංවර්ධනය හරහා සම්ප්‍රදායික කර්මාන්ත මානසිකත්වයේ සිට ව්‍යාපාරික මානසිකත්වය දක්වා සංස්කෘතික මාරුවක් ඇති කිරීම.
5. සමාජ සංවර්ධනය මඟින් ප්‍රජාවගේ සාමූහික සහභාගිත්වය සංවිධානය කිරීම.
6. තාක්ෂණය භාවිතයෙන් කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා නිසි වගා පිළිවෙත් සහ නිෂ්පාදන ක්‍රියාවලින් සමඟ කර්මාන්තය ප්‍රමිතිගත කිරීම .
7. ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය ශිල්පීය ක්‍රම හරහා නව වෙළඳපොළ වෙත ළඟා වීම.
8. පවතින ආර්ථික අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම තුළින් කිතුල් නිෂ්පාදකයින් කර්මාන්තයේ රඳවා ගැනීම, තරුණ සහභාගීත්වය වැඩි කිරීම සහ ඔවුන්ගේ ආත්ම විශ්වාසය ගොඩ නැගීම.
9. වෙළෙඳපොළ සහ නිෂ්පාදන පදනම් කරගත් පර්යේෂණ මත පදනම්ව නව නිෂ්පාදන හඳුන්වා දීම.
10. කර්මාන්ත ප්‍රජාව අගය කිරීම සඳහා ක්‍රමානුකූලව ප්‍රතිලාභ යාන්ත්‍රණය සංවර්ධනය කිරීම.
11. කිතුල් වගාව ව්‍යාප්ත කිරීම මඟින් හරිතාගාර ආවරණය අඩු කිරීම.
12. කාන්තාවන් අගය එකතු කළ නිෂ්පාදනය වෙත යොමු කිරීමෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම.
13. සුදුසු අතුරු බෝග හඳුනා ගැනීමෙන් කිතුල් ශාඛය සහිත ඉඩම්වල ඵලදායීතාව වර්ධනය කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 27.93 |
| 02 | පුනරාවර්තන වියදම් | 49.45 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | කිතුල් ක්ෂේත්‍රයේ මූලික දත්ත එකතු කිරීම. | කිතුල් ශාඛ සහ ව්‍යවසායකයන් පදනම් කරගත් විස්තරාත්මක සංගණනය | 01 | 3.00 |
| 02 | කිතුල් ව්‍යවසායකත්ව සංවර්ධනය කිරීම. | ආහාර තාක්ෂණය, ඇසුරුම්කරණය ආදී වූ තාක්ෂණික දැනුමැති කිතුල් ව්‍යවසායකයින් සංඛ්‍යාව | 75 | 0.20 |
| | | මූල්‍ය හා කළමනාකරණය පිළිබඳ සුදුසුකම් ලැබූ කිතුල් නිෂ්පාදකයින් සංඛ්‍යාව | 50 | 0.20 |
| | | අප ජල කළමනාකරණ පුහුණු වැඩසටහන් | 02 | 0.20 |
| | | උසස් තත්ත්වයේ කිතුල් පිටි නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික දැනුමැති නිෂ්පාදකයින් | 10 | 0.30 |
| | | කිතුල් දැව ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණික දැනුමැති නිෂ්පාදකයින් | 10 | 0.50 |
| | | රක්ෂණ ක්‍රමයකට අනුගත වූ කිතුල් මදින්නන් සංඛ්‍යාව | 150 | 0.50 |
| | | අගය එකතු කළ කිතුල් නිෂ්පාදන හඳුන්වාදුන් ව්‍යවසායකයින් ගණන | 30 | 0.50 |
| | | කිතුල් මල් මැදීමේ තාක්ෂණය පිළිබඳ සුදුසුකම් ලැබූ පුහුණුකරුවන් සංඛ්‍යාව | 30 | 1.00 |
| | | ජාතික වෘත්තීය නිපුණතා සහතිකලත් (NVQ) කිතුල් කාර්මිකයින් | 300 | 0.30 |
| | | යහපත් නිෂ්පාදන ක්‍රියාවලි (GMP) සහතික ලබාගත් | 25 | 2.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | ව්‍යවසායකයින් | | |
| | | ගෘහාශ්‍රිත කර්මාන්ත වැඩි දියුණු කළ ව්‍යවසායකයින් | 75 | 2.50 |
| 03 | විකුණුම් ප්‍රවර්ධනය හා වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම. | කිතුලක වරුණ ප්‍රදර්ශනය | 1 | 4.00 |
| | | උපාය මාර්ගික ස්ථානවල ස්ථාපිත ප්‍රදර්ශනාගාර සංඛ්‍යාව | 03 | 0.25 |
| | | අපනයන සඳහා යොමු වූ නිෂ්පාදකයින් සංඛ්‍යාව | 5 | 1.00 |
| | | ඊ වාණිජ වේදිකා (e - Commercial Platform) සඳහා යොමු වූ ව්‍යවසායකයින් | 150 | 0.10 |
| | | වෙනත් ප්‍රදර්ශන සඳහා යොමු වූ ව්‍යවසායකයින් | 10 | 0.50 |
| 04 | පර්යේෂණය හා සංවර්ධනය ශක්තිමත් කිරීම. | කිතුල් කර්මාන්තයට අදාලව පවත්වන පර්යේෂණ සංඛ්‍යාව | 03 | 3.00 |
| 05 | නියාමන රාමුවක් සැකසීම හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම. | නීති හා රෙගුලාසි පද්ධතියක් ස්ථාපිත කිරීම. | 01 | 2.10 |
| 06 | ආදර්ශ කිතුල් වගා ව්‍යාපෘතිය අඛණ්ඩව සංවර්ධනය කිරීම. | සංවර්ධිත තවාන් සංඛ්‍යාව | 01 | 1.00 |
| | | කිතුල් ගොවීන් විසින් වගා කළ පැළ සංඛ්‍යාව | 25,000 | 2.00 |
| | | ආදර්ශ වගා ඉඩම් | 01 | 1.00 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | **2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)** | **2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.)** | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 11.00 | 3.319 | 30% |
| 02 | පුනරාවර්තන වියදම් | 13.00 | 8.78 | 68% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| කිතුල් සංවර්ධන මණ්ඩලය යටතේ දැනට සිටින කිතුල් කර්මාන්ත කරුවන් ලියාපදිංචි කිරීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සහ දැන්වීම් මගින් ව්‍යවසායකයින් ලියාපදිංචිය | 0.30 | 0.00 | කිතුල් කර්මාන්තය පවතින දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල 13 වෙතින් අයදුම්පත් කැඳවන ලද අතර, කිතුල් ගොවීන් හා ව්‍යවසායකයින් 2,358 ක ගෙන් ලියාපදිංචිය සඳහා අයදුම්පත් ලැබී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ගගත වේදිකාවක් නිර්මාණය කිරීම. (Online platform) | 1.30 | 0.48 | වෙබ් අඩවිය නිර්මාණය කර එළිදක්වන ලදි. |
| ක්‍රියාවලි වැඩි දියුණු කිරීම. | ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම. | 2.30 | 1.38 | අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ එක්වී අපනයනයට යොමු වූ කිතුල් ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ මූලික වැඩමුළුව පවත්වන ලදි.<br>දිස්ත්‍රික් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් යටතේ කිතුල් මදින්නන් සහ ව්‍යවසායකයින් 50 ක් සඳහා බදුල්ල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල වැඩසටහන් 53 ක් පවත්වන ලදි.<br>කිතුල් ගොවීන් සහ ව්‍යවසායකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටළු දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා හඳුනාගන්නා ලදි.<br>කිතුල් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කාර්මික තාක්ෂණ ආයතනයේ සම්බන්ධීකරණයෙන් උමංදාවේ දී පවත්වන ලදි.<br>කිතුල් මදින්නන් 28 දෙනෙකු පුහුණුකරුවන් වශයෙන් පුහුණු කිරීමේ වැඩසටහනක් මහනුවර නවයාලතැන්න පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදි.<br>කිතුල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිසැල් බදු දීම සඳහා පිරිවිතර/ කොන්දේසි යටියන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලද අතර අළුත්වැඩියාව සඳහා අවශ්‍ය කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| සහතිකකරණය | රසායනාගාර පරීක්ෂණ පැවැත්වීම සඳහා සම්බන්ධීකරණය කිරීම. | 0.70 | 0.13 | කිතුල් ව්‍යවසායකයින්ගෙන් 10% ක් හා කිතුල් සංවර්ධන මණ්ඩලයෙන් 90% ක දායකත්වයෙන් පොල් පර්යේෂණ ආයතනයෙන් කිතුල් පැණි සාම්පල් පරීක්ෂාව සිදුකිරීම. ඒ අනුව ව්‍යවසායකයින් 06 දෙනෙකුගේ සාම්පල් රසායනාගාර පරීක්ෂණ සඳහා යොමු කරන ලදි. |
| | යහපත් නිෂ්පාදන ක්‍රියාවලි සහතික ලබාදීම. | 1.00 | 0.00 | මේ සඳහා සුදුසු කර්මාන්තශාලා 12 ක ව්‍යවසායකයින්ගේ විස්තර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත යොමු කර ඇත. |
| | කිතුල් සංවර්ධන මණ්ඩලයේ සහතිකකරණය | 0.80 | 0.013 | කිතුල් සන්නාම ලාංඡනය නිර්මාණය කරන ලදි. |
| නීති හා රෙගුලාසි පද්ධතියක් සංවර්ධනය කිරීම. | නීති හා රෙගුලාසි සකස් කිරීම. | 0.20 | 0.00 | පොල් සංවර්ධන අධිකාරිය, කාර්මික තාක්ෂණ ආයතනය සහ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහ රේඛීය අමාත්‍යාංශයේ නීති නිලධාරිගෙන් සමන්විත කමිටුවක් මගින් නීති හා රෙගුලාසි කෙටුම්පත් සකස් කරන ලදි. |
| වෙනත් ක්ෂේත්‍ර සඳහා කිතුල් ව්‍යවසායකයින් සම්බන්ධීකරණය | දේශීය හා විදේශීය වෙළෙඳපොළ සඳහා සම්බන්ධීකරණය | 1.80 | 0.56 | බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වූ කිතුල් ව්‍යවසායකයින් 06 දෙනෙකු දිරිගැන්වීම සඳහා අළෙවි කුටි සඳහා වූ වියදමින් ප්‍රතිශතයක් කිතුල් සංවර්ධන මණ්ඩලය විසින් දරන ලද අතර එය කාර්මික සංවර්ධන මණ්ඩලයට ගෙවන ලදි. බටඅත අලෙවි ප්‍රදර්ශනය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සඳහා කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රදර්ශන කුටි ස්ථාපිත කිරීම. |
| ආදර්ශ ඉඩමක් සංවර්ධනය | කිතුල් වගා ආදර්ශ ඉඩම සංවර්ධනය කිරීම. | 0.70 | 0.00 | පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පැළ තවානක් සහ වාණිජ වගාවක් සඳහා අක්කර 1.6 ක ඉඩමක් ලබාදීමට එකඟතාව පළ කර ඇති අතර, කිතුල් වාණිජ වගාව සම්බන්ධයෙන් කාර්මික තාක්ෂණ ආයතනය වෙතින් ව්‍යාපෘති යෝජනා කැඳවා ඇත. |
| කිතුල් සංවර්ධනය සඳහා වූ උපාය මාර්ගික සැලැස්ම | උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම. | 1.80 | 0.77 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් උපදේශන සේවා ලබාගෙන, උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමට අදාල පාර්ශ්වකරුවන් සඳහා වැඩමුළුවක් පවත්වන ලදි. උපාය මාර්ගික සැලැස්මේ කෙටුම්පත සකස් කරමින් පවතී. |

- **2025 වර්ෂයේ දී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ ක්‍රියාකාරකම්**
  - ❖ සංගණනයක් පවත්වා කිතුල් ක්ෂේත්‍රයේ දත්ත එක්රැස් කිරීම.
  - ❖ ව්‍යවසායකත්ව සංවර්ධනය
    - ➢ ආහාර තාක්ෂණය, ඇසුරුම්කරණය හා තත්ත්වයෙන් උසස් තෙලිදිය නිෂ්පාදන පිළිබඳ කිතුල් ව්‍යාවසායකයින් 50 ක් සඳහා තාක්ෂණික දැනුම ලබාදීම.
    - ➢ කිතුල් මදින්නන් 300 ක් සඳහා ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය සමඟ එක්වී පුහුණු වැඩසටහන් පවත්වා ජාතික වෘත්තීය නිපුණතා සහතිකය (NVQ) ලබාදීම.
    - ➢ කිතුල් මදින්නන් 150 ක් සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම.
    - ➢ කිතුල් ව්‍යාවසායකයින් 30 ක් සඳහා අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වාදීම.
    - ➢ කිතුල් මැදීමේ තාක්ෂණය පිළිබඳව පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහනක් පැවැත්වීම මගින් සුදුසුකම්ලත් පුහුණුකරුවන් 30 බිහිකිරීම.

- ❖ විකිණුම් ප්‍රවර්ධනය හා වෙළෙඳ අවස්ථා පුළුල් කිරීම.
    - ➢ කිතුලක වරුණ ප්‍රදර්ශනය පැවැත්වීම.
    - ➢ උපාය මාර්ගික ස්ථාන 03 ක ප්‍රදර්ශනාගාර ස්ථාපිත කිරීම.
    - ➢ කිතුල් නිෂ්පාදකයින් 05 ක් අපනයන වෙළෙඳපොළ සඳහා යොමු කිරීම.
    - ➢ ගුණාත්මක කිතුල් නිෂ්පාදන අලෙවිය ඊ වාණිජ්‍ය වේදිකාවක් (e-commercial platform) හරහා ප්‍රවර්ධනය.
    - ➢ කිතුල් නිෂ්පාදකයින් වෙනත් ප්‍රදර්ශන සඳහා යොමු කිරීම.

- ❖ නියාමන රාමුවක් සැකසීම හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
    - ➢ කිතුල් සංවර්ධන මණ්ඩලය බල ගැන්වීම සඳහා සුදුසු නීති හා රෙගුලාසි පද්ධතියක් සකස් කිරීම.
    - ➢ නීති රෙගුලාසි පද්ධතිය ස්ථාපිත කර රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කිරීම.

- ❖ පර්යේෂණ හා සංවර්ධනය
    - ➢ කිතුල් කර්මාන්තයට අදාලව ගැටළු පිළිබඳව පොල් පර්යේෂණ ආයතනය හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව පර්යේෂණ 03 ක් පැවැත්වීම.

- ❖ ආදර්ශ කිතුල් වගා ව්‍යාපෘතිය අඛණ්ඩව සංවර්ධනය කිරීම.
    - ➢ පැළ තවානක් ස්ථාපිත කිරීම.
    - ➢ කිතුල් ගොවීන් විසින් පැළ 25,000 ක් වගා කිරීම.
    - ➢ ආදර්ශ කිතුල් වගා ඉඩමක් සංවර්ධනය කිරීම.

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

**දැක්ම**

ඉතාමත් උසස් තත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුළින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත් කිරීම.

**මෙහෙවර**

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාල පාර්ශ්වයන් වෙත වෘත්තීයමය මඟ පෙන්වීම ලබා දීම තුළින් දිගු කාලීන වූ වාණිජමය ශක්‍යතාවයක් ළඟා කර ගැනීමට හැකි වන පරිදි කජු කර්මාන්තය නඟා සිටුවීම.

**ඉලක්ක හා අරමුණු**

ගෝලීයව පිළිගත් වෙළෙඳ නාමයක් සහ ඉහළ අපනයන ධාරිතාවක් සඳහා ශ්‍රී ලංකාවේ කජු නිෂ්පාදනයේ ව්‍යාප්තිය, පිරිසැකසුම්කරණය, අලෙවිකරණ හා සහතිකකරණයේ ඵලදායීතාවය ඉහළ නැංවීම.

- වගාව ව්‍යාප්ත කිරීම මඟින් අස්වැන්න ඉහළ නැංවීම.
- කජු පිරිසැකසුම් කර්මාන්තයේ හා වතුයායන්වල ඵලදායීතාවය ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකාවේ කජු සඳහා ගෝලීයව පිළිගත් වෙළෙඳ නාමයක් ඇති කිරීම.
- අගය එකතු කිරීම හා නව නිෂ්පාදන සංවර්ධනය.
- කජු අපනයනය දිරි ගැන්වීම.
- ශ්‍රී ලංකාව කජු නිෂ්පාදනයේ ප්‍රමුඛයා බවට පත් කිරීම.
- ලාභ ඉපැයීම මඟින් ස්වයංපෝෂිත රාජ්‍ය සංස්ථාවක් බවට පත්වීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු. මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 196.00 |
| 02 | පුනරාවර්තන වියදම් | 115.00 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු. මි.) |
|---|---|---|---|---|
| 01 | රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | මිලදී ගනු ලබන පොලී බෑග් සංඛ්‍යාව<br><br>සාර්ථක බද්ධ කජු පැළ සංඛ්‍යාව | කජු සහනාධාර වැඩසටහනට අදාලව බද්ධ කජු පැළ 165,200 ක් නිෂ්පාදනය කිරීම සඳහා පොලි බෑග් 206,500 ක් මිලදී ගැනීම, තවාන් බිම් සැකසීම හා පැළ නිෂ්පාදනය කොට නිකුත් කිරීම.<br>සංස්ථා අලෙවි සැල්වල විකිණීම, සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරන වෙනත් ව්‍යාපෘති සහ සංස්ථා වතුයායන්වල සිටුවීම සඳහා අවශ්‍ය බද්ධ කජු පැළ 92,900 ක් | 45.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිෂ්පාදනය කිරීම සඳහා පොලි බෑග් 116,125 ක් මිලදී ගැනීම, තවාන් බිම් සැකසීම හා පැළ නිෂ්පාදනය කොට නිකුත් කිරීම. | |
| 02 | කජු සහනාධාර වැඩසටහන | වගා කළ කජු අක්කර ප්‍රමාණය හා ගොවීන් සංඛ්‍යාව | බද්ධ කජු අක්කර 2,360 ක් සහ බීජ කජු අක්කර 140 ක් වශයෙන් මුළු අක්කර 2,500 ක් වගා කිරීම සඳහා ගොවීන් 2,000 ක් තෝරා ගැනීම. | 24.00 |
| | | ගොවි පුහුණු පන්ති සංඛ්‍යාව | ගොවීන් 2,000 ක් සඳහා ගොවි පුහුණු පන්ති 80 ක් පැවැත්වීම. | |
| | | බෙදා දෙනු ලබන පැළ සංඛ්‍යාව | අක්කර 2,500 ක පේළි ලකුණු කිරීම හා වළවල් කැපීම.<br>අක්කර 2,500 ක් සඳහා ගොවීන් 2,000 ක් අතර පැළ 170,800 ක් බෙදා දීම. | |
| 03 | වැවිලි කළමනාකරණය | ලෙලි කජු මෙ. ටො. ප්‍රමාණය | සංස්ථා වතුයායන්ගෙන් ලෙලි කජු මෙ. ටො. 183 ක (ගබඩා බර) අස්වැන්නක් ලබා ගැනීම. | 101.00 |
| | | පොල් ගෙඩි ප්‍රමාණය | පොල් ගෙඩි 70,000 ක අස්වැන්නක් ලබා ගැනීම. | |
| | | නව වගාව සිදු කරන අක්කර ප්‍රමාණය | එළුවන්කුළම අක්කර 15 ක නව කජු වගාව හා අක්කර 130 ක පවතින නව වගාවේ කැළය සම්පූර්ණයෙන් එළි කොට පාළු පැළ සිටුවීම හා කමන්දළුව වතුයායේ ජොහානා කොටසෙහි අක්කර 15 ක සහ අක්කර 70 කොටසෙහි අක්කර 10 ක කැළය එළි කර, පාළු පැළ සිටුවීම මෙන්ම නීරාවිය / ඔට්ටුකුළම කොටසෙහි අක්කර 25 ක කැළය එළි කර නව වගාව සිදු කිරීම හා මීටර 600 ක කම්බි වැට ඉදි කිරීම ද වෙල්ලන්කුළම වතුයායේ අක්කර 50 ක කැළය එළි කිරීම සහ පාළු පැළ සිටුවීම.<br>පුනරීන් වතුයායේ අංක 01 කොටසේ අක්කර 50 ක කැළය එළි කිරීම සහ පාළු පැළ සිටුවීම සහ පුත්තලම වතුයායේ මුන්ගිල්ආරු කොටසේ අක්කර 25 ක නව කජු වගාව සිදු කිරීම. | |
| 04 | කජු පිරිසැකසුම් කර්මාන්තය සංවර්ධනය | පිරිසැකසුම් හා අගය එකතු කළ ලෙලි කජු හා කජු මඳ මෙ. ටො. ප්‍රමාණය. | ලෙලි කජු මෙ. ටො. 223 ක් පිරිසැකසුම් කොට අගය එකතු කිරීම සහ කජු මඳ මෙ. ටො. 5.4 ක අගය එකතු කිරීම. | 322.70 |
| | | අලෙවි කරන කජු මඳ මෙ. ටො. ප්‍රමාණය | කජු මඳ මෙ. ටො. 50 ක් අලෙවිකරණය සහ බෙදා හැරීම. | |

| | | | | |
|---|---|---|---|---|
| | | මිලදී ගනු ලබන ලෙලි කපු සහ කපු මඳ සංඛ්‍යාව | ලෙලි කපු මෙ. ටො. 40 ක් හා කපු මඳ මෙ. ටො. 5.4 ක් මිලදී ගැනීම. | |
| | | විවෘත කරන නව අලෙවිසැල් ප්‍රමාණය | නව කපු අලෙවිසැල් 01 ක් විවෘත කිරීම. | |
| 05 | ස්ථාවර වත්කම් කළමනාකරණය | ගොඩනැගිලි සංඛ්‍යාව | වෙල්ලන්කුළම ගබඩාවක් ඉදි කිරීම, පුනරීන් ගබඩාවේ වහලය අළුත්වැඩියා කිරීම සහ පුත්තලම කමත සඳහා පොලිටනල් එකක් ඉදි කිරීම. | 47.10 |
| | | මිලදී ගැනීමට නියමිත මෙවලම් සහ උපකරණ, සංඛ්‍යාව | ගොවිබිම් ගෘහවලට අවශ්‍ය මෙවලම් සහ උපකරණ මිලදී ගැනීම. | |
| | | මිලදී ගැනීමට සහ අළුත්වැඩියා කිරීමට නියමිත රථවාහන සංඛ්‍යාව | ට්‍රැක්ටර් ටේලර් 02 ක් හා ඩබල් කැබ් රථ 02 ක් මිලදී ගැනීම. | |
| | | මිලදී ගැනීමට නියමිත කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ සංඛ්‍යාව | කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | |
| 06 | පර්යේෂණ සහ සංවර්ධනය | ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ වැඩසටහන් ගණන | බහු වාර්ෂික අඛණ්ඩ පර්යේෂණ වැඩසටහන් 06 ක් සහ වාර්ෂිකව අවසන් කරන නව පර්යේෂණ වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කිරීම. | 6.30 |
| 07 | මානව සම්පත් සංවර්ධනය | පුහුණු කිරීමට අපේක්ෂිත නිලධාරීන් සංඛ්‍යාව | කාර්ය මණ්ඩල නිලධාරීන් හා සේවකයින් 100 ක් සඳහා දේශීය සේවා පුහුණුව ලබා දීම. | 4.00 |
| | | පැවැත්වීමට අපේක්ෂිත පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංඛ්‍යාව | කාර්ය මණ්ඩලයේ සේවා ධාරිතාව ඉහළ නැංවීම සඳහා සහභාගීත්වයෙන් වැඩමුළු 02 ක් පැවැත්වීම. | |

| | | | | |
|---|---|---|---|---|
| | | ලබාදීමට අපේක්ෂිත පාඨමාලා සංඛ්‍යාව | කණිෂ්ඨ සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් 02 ක් සහ කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පාඨමාලා 05 ක් ලබා දීම. | |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු. මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 55.00 | 50.52 | 92% |
| 02 | පුනරාවර්තන වියදම් | 383.50 | 279.81 | 73% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන / ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු. මි.) | වැය කළ මුදල (රු. මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය | 13.00 | 13.00 | සංස්ථා මධ්‍යම පැළ තවාන්වල බද්ධ කජු පැළ 98,000 ක් නිෂ්පාදනය කිරීම සඳහා පොලි බෑග් 122,500 ක් මිලදී ගෙන තවාන් වෙත නිකුත් කොට කජු පැළ 122,500 ක් බද්ධ කර අවසන්ව ඇත.<br>ඉන් සාර්ථක බද්ධ කජු පැළ 82,320 ක් මේ වන විට ලබාගෙන ඇති අතර, සාර්ථක අසාර්ථකභාවය තවමත් නිර්ණය කළ නොහැකි බද්ධ කජු පැළ 19,770 ක් එයට අමතරව පවතී. |
| කජු සහනාධාර යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක 22 ක කජු වගා කිරීම. | 6.50 | 6.49 | බද්ධ කජු අක්කර 1,400 ක් සහ බීජ කජු අක්කර 100 ක් ගොවීන් 1,000 ක් මගින් වගා කිරීම සඳහා ගොවීන් 2,790 ක් තෝරාගෙන, ගොවි පුහුණු පන්ති 26 ක දී පුහුණුව ලබා දී ඇත. |
| වැවිලි කළමනාකරණය | 24.85 | 24.56 | සංස්ථා බීජ උද්‍යාන සංවර්ධනය යටතේ කජු අක්කර 841 ක වල් මර්දන කටයුතු සිදු කර, අක්කර 17 ක වගාව කප්පාදු කර ඇත. අක්කර 400 ක් සඳහා පළිබෝධ මර්දන කටයුතු සිදු කර අවසන්ය.<br>සංස්ථාවට අයත් කජු වතුයායන් ප්‍රමාණය ව්‍යාප්ත කිරීම යටතේ, එළුවන්කුළම අදියර II හි අක්කර 65 ක නව වගාව සඳහා කැලෑ එළි කිරීමේ කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත පවරා, වැඩ ආරම්භ කර ඇත.<br>එළුවන්කුළම වතුයායේ මීටර 262 ක් වූ දැනට පවතින අලි අගල සුද්ධ කර, මීටර 2750 ක් වූ නව අලි අගල ස්ථාපනය කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව ද ඉහත සඳහන් ආයතනය වෙතම පිරිනමා ඇති අතර, මේ වන විට වැඩ |

| | | | |
|---|---|---|---|
| | | | ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.<br><br>කජු වගාවේ පළිබෝධ මර්දනය යටතේ කඳ පණුවා මර්දනය සඳහා Profenophos මිලිලීටර 400 කෘමිනාශක බෝතල් 60 ක් සහ හෙලෝපෙල්ටිස් මර්දනය සඳහා මොස්පිලාන් කිලෝ 105 ක් මිලදී ගැනීම් අවසන් කර ඇත. |
| කජු පිරිසැකසුම් කර්මාන්තය සංවර්ධනය | 1.35 | 0.38 | නව කජු අලෙවිසැල් 02 ක් විවෘත කිරීම යටතේ 2024.06.27 දින මහනුවර කජු අලෙවි සැළ විවෘත කරන ලදි.<br><br>අනෙක් කජු අලෙවි සැළ විවෘත කිරීමට ඇල්ල ප්‍රදේශය තෝරාගෙන ඇති අතර, සංස්ථාවේ සභාපතිතුමන් ද ස්ථානීය නිරීක්ෂණ කර සුදුසු බව හඳුනාගෙන ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී නව කජු අලෙවි සැළ විවෘත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට නියමිතයි. |
| ස්ථාවර වත්කම් කළමනාකරණය | 5.50 | 2.42 | පරිගණක සහ අවශ්‍ය උපාංග මිලදී ගැනීමට සහ කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයට කැමරා පද්ධතියක් සවි කිරීම සඳහා පිරිවිතර සකස් කිරීමට මේ වන විට තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.<br>කාර්යාල ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ටෙන්ඩරය ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කර ඇති අතර, අනුමැතිය ලද පසු ඇණවුම් කිරීමට නියමිතයි.<br>ප්‍රාදේශීය ප්‍රසම්පාදනය යටතේ ගස් කැපීමට අවශ්‍ය උපකරණ (Pruning Saw 04, Chain Saw 02) මිලදී ගෙන ඇත. Grass Cutter 01 ක්, Slasher 01 ක් සහ Solar Panel System 01 ක් මිලදී ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය මගින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.<br><br>ප්‍රධාන කාර්යාලයේ හා නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානයේ කජු මඳ ප්‍රවාහන කටයුතු සඳහා භාවිත කරනු ලබන LC-9422 දරන රථය අළුත්වැඩියා කර ඇත. |
| පර්යේෂණ සහ සංවර්ධනය. | 2.80 | 2.68 | පර්යේෂණ වැඩසටහන් 07 න් මෙම වසරේ අවසන් කිරීමට නියමිත වැඩසටහන් 02 ක් සාර්ථකව අවසන් කර ඇති අතර, ඉතිරි බහු වාර්ෂික පර්යේෂණ 05 මේ වර්ෂයේ ඉලක්ක සපුරා ඇත.<br>නව කජු ප්‍රභේද 02 ක් හඳුන්වාදීම යටතේ විජිනිත සහ ශක්ති යන කජු ප්‍රභේද 02 හි සියළු වැඩ කටයුතු අවසන් බැවින් 2025 ජනවාරි 31 දින ඒවා නිදහස් කිරීමට සැලසුම් කර ඇත.<br>කජුවල ගුණාත්මකභාවය සහ අස්වැන්න වැඩි කිරීම සඳහා කජුවල පරාගණය ඉහළ නැංවීමට පවත්වන ලද පර්යේෂණ වැඩසටහන මේ වන විට නිමකර විශ්ලේෂණ කටයුතු ද අවසන්ය. |

| | | | |
|---|---|---|---|
| මානව සම්පත් සංවර්ධනය. | 1.00 | 0.99 | පුත්තලම සහ නැදගමුව පිරිසැකසුම් මධ්‍යස්ථානවල හා පුත්තලම සහ කමන්දළුව වතුවල සේවය කරන කම්කරුවන් 200 කගේ ආකල්ප සහ සේවා ධාරිතාව වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහනක් 2024.01.15 දින පවත්වන ලදි.<br>කාර්ය මණ්ඩල නිලධාරීන් 40 ක් හා සේවකයින් 30 ක් සඳහා සඳහා ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහනක් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පවත්වා ඇත. |

# කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය

**දැක්ම**

ශ්‍රී ලාංකීය කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවිකරණයේ සහ ප්‍රවර්ධනයේ ප්‍රමුඛයා සහ ඒ සම්බන්ධ සියළු සේවා සපයන්නා බවට පත් වීම.

**මෙහෙවර**

ජාත්‍යන්තර සහ දේශීය කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය තුළ නිෂ්පාදන අගය, ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අපනයනික සහ ආනයනික දේශීය වෙළඳපොළේ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදනවල සහතිකකරණය, ප්‍රමිතිකරණය සහ සම්බන්ධීකරණය පිළිබඳ වගකිව යුතු රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනය ලෙස පෙනී සිටීමට කටයුතු කිරීම.

**ඉලක්ක සහ අරමුණු**

- ❖ කුළුබඩු මිලදී ගැනීම, සැකසීම, ගබඩා කිරීම අගය එකතු කිරීම, ඇසුරුම් කිරීම සහ අලෙවිය ඇතුළත් වූ අගයදාම කටයුතුවල නියැලීම.
- ❖ කුළුබඩු සඳහා නව සන්නාමයක් හඳුන්වාදීම සහ ජාත්‍යන්තරව පිළිගත් සහතිකකරණ ආයතනයන් සමඟ සම්බන්ධ වී ප්‍රතීතන සහතිකකරණය හඳුන්වාදීම.
- ❖ කුළුබඩු ක්ෂේත්‍රයට අදාළව කෘෂිකාර්මික අංශය දියුණු කරලීමේ ජාතික අවශ්‍යතාවය ඉටුකරලීම සඳහා දායක වීම.
- ❖ අතිරික්ත නිෂ්පාදන ලැබෙන කාල වකවානුවන්හි මෙන්ම නිෂ්පාදන හිඟ කාලයන්හි දී පවා ආයතනය සමඟ බැඳී පවතින ගොවීන් ජාලයක් බිහි කිරීම සහ ඔවුන්ට ස්ථාවර ආදායම් මාර්ගයක් ඇති කරලීම සඳහා පහසුකම් සැලසීම.
- ❖ ගොවීන් 10,000 ක් ඇතුළත්ව අවම වශයෙන් ගොවි නිෂ්පාදන පොකුරු 10 ක් ඇතුළත් අගයදාමයක් කුළුබඩු මණ්ඩලය සමඟ ඒකාබද්ධ කරවීම.
- ❖ දේශීයව ස්ථාපනය කරනු ලබන කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවිසැල් ජාලයක් අලෙවි නියෝජිත ආයතන පිහිටුවීම.
- ❖ නිෂ්පාදකයන්ට වාසිදායක මිලක් ලබාදීමටත්, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වඩාත් යෝග්‍ය ලෙස කඩිනමින් අලෙවි කිරීමටත්, නිමි නිෂ්පාදන දිරිගැන්වීමටත්, අපනයනය කිරීමට හැකිවනු පිණිස දිරිගැන්වීම් ක්‍රියාත්මක කිරීමටත්, පුද්ගලික අංශයේ ආයෝජකයින් සහ දේශීය විදේශීය ගැනුම්කරුවන් හඳුන්වාදීම.
- ❖ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අගයදාම සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම, අගය එකතු කිරීම සඳහා පර්යේෂණ සහ නව්‍යකරණ (Research and Innovations) මඟින් නව නිෂ්පාදන හඳුන්වා දීම.
- ❖ ශ්‍රී ලාංකීය කුළුබඩු විදේශයන්හි ප්‍රචලිත කිරීම සඳහා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, වෙළෙඳ ප්‍රදර්ශනවලට සහභාගී වීම.
- ❖ පවතින කෘතිම රසකාරක වෙනුවට දේශීය කුළුබඩුවලින් එම නිෂ්පාදන ආරම්භ කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 22.50 |
| 02 | පුනරාවර්තන වියදම් | 126.00 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන | | | | |
| 01 | කුළුබඩු නිෂ්පාදකයින්ට වාසිදායක මිලක් ලබාදීමට, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වඩාත් කඩිනමින් අලෙවි කිරීම සහ නිමි නිෂ්පාදන දිරි ගැන්වීම. | මිලදී ගනු ලබන නිෂ්පාදන ප්‍රමාණය | කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා අවශ්‍ය ගම්මිරිස් මෙ.ටො.5.4 ක් සහ කහ මෙ.ටො.1.6 ක් මිලදී ගැනීම. | 7.00 |
| 02 | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ව්‍යවසායකයින් නිෂ්පාදන අපනයන වෙළෙඳපොළ දක්වා ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍යාධාර සපයමින් ඔවුන් දිරිගැන්වීම. | සහතිකලාභීන් සංඛ්‍යාව | "යහපත් නිෂ්පාදන පිළිවෙත්" (GMP) සම්බන්ධ සහතිකලාභීන් 30 දෙනෙක් | 2.25 |
| 03 | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ නිෂ්පාදනවල අගයදාම සංවර්ධනය සඳහා ධාරිතා සංවර්ධනය සහ දිරිගැන්වීම. | වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් ගණන - 14 (ආයතනය තුළ-12/ක්ෂේත්‍ර - 02) | 1.85 |
| 04 | කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සන්නාම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රවර්ධනය සහ සුළු පරිමාණ දේශීය කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදකයන් පිරිසැකසුම්කරුවන් සහ අගය එකතු කරන්නන් අපනයන වෙළෙඳපොළ දක්වා ප්‍රවර්ධනය කිරීම. | සහභාගී වන ප්‍රදර්ශන සංඛ්‍යාව | දේශිය හා විදේශීය වශයෙන් පැවැත්වෙන ප්‍රදර්ශන සඳහා සහභාගී වීම. (දේශීය - 05, විදේශීය-01) | 3.00 |
| 05 | කුළුබඩු අගය එකතු කිරීම සඳහා පර්යේෂණ හා නව්‍යකරණ පහසුකම් සැලසීම. | උපකරණ සංඛ්‍යාව | කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂණාගාරය සඳහා අන්වීක්ෂයක් සහ අවශ්‍ය උපාංග ලබා ගැනීම. | 0.20 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | ඇඹිලිපිටිය කුළුබඩු සැකසුම් මධ්‍යස්ථානයේ ධාරිතාවය සංවර්ධනය කිරීම. | අලුත් වැඩියා කළ වර්ග අඩි ප්‍රමාණය/ අත්‍යාවශ්‍ය ගෘහ භාණ්ඩ සංඛ්‍යාව | නිලධාරි නිල නිවස අලුත් වැඩියාව, අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සහ සේවක නේවාසිකාගාරය අලුත් වැඩියා කිරීම. | 3.20 |
| | | ස්ථාපිත කැමරා පද්ධතිය | ප්‍රධාන කාර්යාලයේ සිට ගබඩාවේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා කැමරා පද්ධතියක් සවි කිරීම. | 0.50 |
| | | අලුත් වැඩියා කළ පාලම් තරාදිය | ඇඹිලිපිටිය කුළුබඩු සැකසුම් මධ්‍යස්ථානයේ පාලම් තරාදිය අළුත් වැඩියා කිරීම. | 0.50 |
| 07 | බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයීය සේවක ධාරිතාවය සංවර්ධනය කිරීම. | වැඩසටහන් ගණන | ප්‍රධාන කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා අත්‍යාවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 0.50 |
| 08 | බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම. | මෘදුකාංග රූපවාහිනි යන්ත්‍ර ලිපි ගොනු කබඩ් | ප්‍රධාන කාර්යාලයේ Third Eye ERP මෘදුකාංගය වැඩි දියුණු කිරීම, රූපවාහිනි යන්ත්‍රයක් සහ ලිපි ගොනු කබඩ් 04 ක් මිලදී ගැනීම. | 1.00 |
| **එකතුව** | | | | **20.00** |

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| ආයතනික ප්‍රතිපාදන - ප්‍රාග්ධන | | | | |
| 01 | කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයේ ධාරිතාවය සංවර්ධනය කිරීම. | කුළුබඩු මන්දිර සංඛ්‍යාව | ආරම්භ කරනු ලබන “කුළුබඩු මන්දිර” ගණන - 02 | 2.00 |
| 02 | කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වෙළෙඳපොළ පුළුල් කර ගැනීම. | වැඩසටහන් සංඛ්‍යාව | කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මාර්ගගත අලෙවිය ප්‍රවර්ධනය කිරීම. | 0.20 |
| 03 | අපනයන කටයුතු සංවර්ධනය | රටවල් සංඛ්‍යාව | සාම්පල් අපනයනය කරනු ලබන රටවල් ගණන - 10 | 0.10 |
| 04 | කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයේ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සන්නාම ප්‍රවර්ධනය. | ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | සමාජ මාධ්‍ය ජාලා තුළ සිදු කරනු ලබන ප්‍රවර්ධන වැඩසටහන් ගණන - 20 | 0.10 |
| 05 | කුළුබඩු සැකසුම් මධ්‍යස්ථානයේ භූමිය පූර්ණ වශයෙන් උපයෝජනය කිරීම. | භූමි ප්‍රමාණය | ඇඹිලිපිටිය කුළුබඩු සැකසුම් මධ්‍යස්ථාන භූමිය ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම සඳහා සුදුසු වගා කටයුතු සිදු කිරීම. (වාණිජ අඹ වගාව) | 0.10 |
| | | | **එකතුව** | **2.50** |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් (භාණ්ඩාගාර ප්‍රතිපාදන) | 10.00 | 8.853 | 88.53% |
| | ප්‍රාග්ධන වියදම් (ස්වයං මූල්‍යාන ප්‍රතිපාදන | 84.39 | 69.605 | 82.48% |
| | **එකතුව** | **94.39** | **78.45** | **83.11%** |
| 02 | පුනරාවර්තන වියදම් (භාණ්ඩාගාර ප්‍රතිපාදන) | | | |
| | පුද්ගල පඩිනඩි | 31.60 | 31.60 | 100% |
| | වෙනත් | 25.00 | 25.44 | 101.76% |
| | **එකතුව** | **56.60** | **57.04** | **100.77%** |
| 03 | පුනරාවර්තන වියදම් (ස්වයං මූල්‍යාන ප්‍රතිපාදන) | | | |
| | පුද්ගල පඩිනඩි | 40.00 | 43 | 107.05% |
| | වෙනත් | 50.00 | 48.08 | 96.16% |
| | **එකතුව** | **90.00** | **91.08** | **101.2%** |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | | | | |
| 01. ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාවේ ධාරිතාවය සංවර්ධනය කිරීම. | 1.1. 2023 වර්ෂයේ මිලදී ගත් යන්ත්‍ර සඳහා අතැති බිල්පත් ගෙවීම. | 3.50 | 3.457 | යන්ත්‍ර සවිකිරීම සඳහා වන වියදම් සහ යන්ත්‍ර 09 ඇතුළුව Movable Trolley සඳහා ගෙවීමට ඇති හිඟ මුදල ගෙවා අවසන් කර ඇත. |
| | 1.2 ඇඹිලිපිටිය කර්මාන්තශාලාවේ නිෂ්පාදන ඇසුරුම්කරණය වැඩි දියුණු කිරීම. | 1.75 | 1.30 | අවශ්‍ය යන්ත්‍ර මිලදී ගෙන ඇත. |
| | 1.3 ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාවේ කාර්යාලයීය උපකරණ හා ආරක්ෂක කැමරා සවි කිරීම. | 0.15 | 0.025 | කාර්යාලයීය පුටු 10 ක් පමණක් මිලදී ගෙන ඇත. |
| | 1.4 ඇඹිලිපිටිය කර්මාන්ත ශාලාවේ සේවක විවේකාගාරය සහ අමුද්‍රව්‍ය සේදීමේ ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ කටයුතු සිදු කිරීම. | 2.60 | 2.608 | වැඩ අවසන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 02. බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයීය පහසුකම් වැඩි දියුණු කිරීම. | 2.1 බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය උපකරණ සපයා ගැනීම. | 0.195 | 0.1774 | කර්යාලයීය පුටු - 50 ක් සහ ලිපිගොනු කබඩ් 02 ක් මිලදී ගෙන ඇත. |
| | 2.2 2023 වර්ෂයේ වාහන අළුත්වැඩියා කටයුතු සඳහා අතැති බිල්පත් ගෙවීම. | 0.915 | 0.9103 | ජීප් රථය අළුත්වැඩියා කිරීමට අදාලව බිල්පත ගෙවා අවසන් කර ඇත. |
| 3. ක්ෂුද්‍ර, සුළු හා මාධ්‍ය පරිමාණ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන පිරිසකසුම්කරුවන්, අගයදාම එකතුකරන්නන් හා නිෂ්පාදකයින්ගේ සන්නාම ප්‍රවර්ධනය හා ඔවුන්ගේ නිෂ්පාදන වඩාත් යෝග්‍ය ලෙස කඩිනමින් අලෙවි කර දීම. | 3.1 අලෙවි ප්‍රවර්ධනය සඳහා දෙසැම්බර් මාසයේ පැවැත්වෙන ප්‍රධාන අලෙවි ප්‍රදර්ශනයකට සහභාගී වීම. | 0.375 | 0.375 | වෙළෙඳ ප්‍රදර්ශනය 01 ක් සඳහා සහභාගී වන ලදි. |
| **ආයතනික ප්‍රතිපාදන** | | | | |
| 1.කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයේ ධාරිතාවය සංවර්ධනය කිරීම. | 1.1 කුළුබඩු මිලදී ගැනීම, සැකසීම, අගය එකතු කිරීම සහ අලෙවිය ඇතුළත් වූ අගයදාම කටයුතුවල නියැලීම. | 72.15 | 68.18 | අමුද්‍රව්‍ය ලෙස මිරිස් මෙ.ටො. 13.34, තුනපහ මෙ.ටො. 5.6, කහ මෙ.ටො.5.64, ගම්මිරිස් මෙ.ටො.2.21, අබ මෙ.ටො.0.255, ගොරකා මෙ.ටො.1.21, උළුහාල් මෙ.ටො.0.691, සූදුරු මෙ.ටො.0.432, මාදුරු මෙ.ටො.0.42 මිලදී ගන්නා ලදි. |
| | 1.2 කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ග්‍රාමීය / නාගරික වශයෙන් අලෙවි කිරීම සඳහා වරලත් අලෙවි නියෝජිත ආයතන 10 ක් පත් කිරීම. | 0.06 | 0.05 | අලෙවි නියෝජිතයින් 09 දෙනෙකු පත් කිරීම සිදු කර ඇත. |
| 02. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළ පුළුල් කර ගැනීම. | 2.1 මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ ලබාගන්නා ඇණවුම් ප්‍රවාහනය සහ බාරදීමට දේශීය සහ විදේශීය ජාලයක් සහිත සේවා සපයන්නෙකු ලියාපදිංචි කර ගැනීම. | 0.08 | 0.01 | කුළුබඩු මාර්ගගතව අලෙවි කිරීමේ ආයතනයක් ලියාපදිංචි කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 03. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය , ශ්‍රී ලංකාවේ කුළුබඩු පිළිබඳ උපදේශක, නියාමන හා සහතිකකරණ ආයතනය වශයෙන් කටයුතු කිරීම. | 3.1 සුළු හා මධ්‍ය පරිමාණ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම්කරුවන්, අගයදාම එකතු කරන්නන් සහ නිෂ්පාදකයින් වෙත ප්‍රතීතන සහතික ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශ නිකුත් කිරීම. (SGS Sri Lanka Pvt. Ltd.) | 0.11 | 0.028 | 2024.08.01 දින ප්‍රතීතන සහතික කරන ආයතනය ලෙස SGS ආයතනය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කර ඇත. තෝරාගත් නිෂ්පාදකයින් දෙදෙනෙක් සහතික කරන ක්‍රියාවලියට ඇතුළත්ව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| | 3.2 ප්‍රතීතන සහතික ලබා ගැනීම සඳහා නිර්දේශිත ආයතන වෙනුවෙන් හැටන් නැෂනල් බැංකුව මඟින් සහන පොලී පදනම මත කෙටි සහ මධ්‍ය කාලීන ණය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම් සඳහා නිර්දේශ ලබාදීම. | 0.03 | 0.01 | තෝරාගත් බැංකුවක් සමඟ ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 04. අපනයන කටයුතු සංවර්ධනය | 4.1 කුළුබඩු අපනයනය, ප්‍රවර්ධනය යටතේ සාම්පල් ඉල්ලුම් කර ඇති රටවල් සහ ආනයනකරුවන් සඳහා සාම්පල් ලබාදීම. | 0.01 | - | රටවල් 09 ක් සඳහා සාම්පල් 505 ක් යැවීම සිදු කොට ඇත. |
| 05. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයේ සන්නාම ප්‍රවර්ධනය මඟින් අලෙවි කටයුතු පුළුල් කිරීම සඳහා සහාය වීමට සහ පාරිභෝගිකයින්ට පිරිසිදු කුළුබඩු ලබාගැනීම සඳහා අවස්ථාව ඇති කිරීම. | 5.1 සමාජ මාධ්‍ය ජාල තුළ දැන්වීම් පළ කිරීම. | 0.05 | 0.016 | දැන්වීම් 22, අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් 02 ක් පවත්වා ඇත. |
| | 5.2 දේශීය හා විදේශීය වශයෙන් සංස්ථා කුළුබඩු සන්නාම ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රදර්ශනවලට සහභාගී වීම. | 1.295 | 0.93 | ප්‍රදර්ශන 04 ක් සඳහා සහභාගී වී ඇත. |
| 06. දේශීය ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන ධාරිතාවය වැඩි දියුණු කිරීම. | 6.1 සුළු හා මධ්‍ය පරිමාණ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ව්‍යවසායකයින් ලියාපදිංචි කර ඔවුන්ගේ නිෂ්පාදන හා අලෙවි කටයුතු විධිමත් කර ගැනීමට අවශ්‍ය ධාරිතා | 0.105 | 0.006 | රජයේ වාණිජ දෙපාර්තමේන්තුවේ වැඩසටහනකට සහභාගී වී නිෂ්පාදන ව්‍යවසායකයින් ලියාපදිංචි කර දැනුවත් කිරීම් සිදු කර ඇත. 2024 සැප්තැම්බර් මාසයේ දී එක් වැඩමුළුවක් පවත්වා |

| | | | | |
|---|---|---|---|---|
| | සංවර්ධනය සඳහා කාලීන වැඩමුළු පැවැත්වීම. | | | ඇත. |
| 07.ඇඹිලිපිටිය කර්මාන්ත ශාලා භූමියේ ධාරිතාවය පූර්ණ වශයෙන් උපයෝජනය කිරීම. | 7.1 ඇඹිලිපිටිය කර්මාන්ත ශාලා අවට භූමියේ වගා කටයුතු සිදු කිරීම | 0.50 | - | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදෙස් මත වැඩ ආරම්භ කර ඇත. |

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**දැක්ම**

වැවිලි ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රබලතම වාණිජ ව්‍යවසායකත්ව ආයතනය බවට පත්වීම.

**මෙහෙවර**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වත්කම් සේවක සහභාගීත්වයෙන් නිසි කළමනාකරණය කරමින් රටේ දේශීය නිෂ්පාදනයට සහ වතු සේවක පවුල්වල සහ අසල්වැසි ගම්මානයන්හි යහ සාධනය ඇති කිරීමට උපරිම දායකත්වයක් ලබා දීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්කය**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 1,266.79 |
| 02 | පුනරාවර්තන වියදම් | 1,773.73 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | තේ නැවත වගාව | හෙක්ටයාර් | 29 | 75.26 |
| 02 | තේ නව වගාව | හෙක්ටයාර් | 19 | 18.62 |
| 03 | තේ පාළු පැළ සිටුවීම | හෙක්ටයාර් | 41 | 79.05 |
| 04 | කරදමුංගු වගාව | හෙක්ටයාර් | 24 | 1.66 |
| 05 | කරාබුනැටි වගාව | හෙක්ටයාර් | 6 | 4.28 |
| 06 | කෝපි වගාව | හෙක්ටයාර් | 16 | 0.24 |
| 07 | නව දැව වගාව | හෙක්ටයාර් | 2 | 0.60 |

- **2024.11.30 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.11.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 1,041.00 | 89.50 | 8.59% |
| 02 | පුනරාවර්තන වියදම් | 1,540.00 | 1,123.00 | 73% |

- **2024.11.30** දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය (හෙක්ටයාර) |
|---|---|---|---|---|
| තේ නැවත වගාව වසර 2022/2023 (මහනුවර, මාතලේ, බදුල්ල යන දිස්ත්‍රික්ක කේන්ද්‍ර කොට මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇත.) | නැවත වගාව පළමු වසර නඩත්තුව(2022/2023 තේ නැවත වගා වැඩසටහන) | 19.04 | 31.08 | 36.16 |
| | තේ නැවත වගාව දෙවන වසර නඩත්තුව(2022/2023 තේ නැවත වගා වැඩසටහන | 37.38 | 82.15 | 57.55 |
| | තේ නව වගාව පළමු වසර නඩත්තුව (2022/2023 තේ නැවත වගා වැඩසටහන) | 31.55 | 31.08 | 34.50 |
| | තේ නව වගාව දෙවන වසර නඩත්තුව (2022/2023 තේ නැවත වගා වැඩසටහන) | 25.57 | 27.95 | 30.12 |
| විශේෂ ව්‍යාපෘතිය වලහන්දුව වතුයාය (2022) (ගාල්ල දිස්ත්‍රිකයේ වලහන්දුව වතුයායේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.) | තේ නව වගාව පළමු වසර නඩත්තුව(පැළ 25,000) | 15.68 | 2.30 | 2.00 |
| | පොල් වගාව පළමු වසර නඩත්තුව (පැළ 1,600) | 3.05 | 3.78 | 10.00 |
| | කුරුඳු වගාව පළමු වසර නඩත්තුව (පැළ 9,000) | 1.10 | 0.75 | 1.00 |
| සංචාරක ව්‍යාපෘති | වැවතැන්න සංචාරක පෙදෙස නඩත්තුව | 1.84 | 0.65 | |

- **2025** වර්ෂයේ දී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්

**නකල්ස් කඳු පන්තියේ ඉහළ ස්ථරයේ පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුයායන්හි ඇති තේ ඉඩම් Green Climate Fund යටතේ සංවර්ධනය කිරීම.**

දැනට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් පාලනය කරනු ලබන වතුයායන් අතරින් 13ක් නකල්ස් කඳු පන්තියේ ඉහළ ස්ථරයේ පිහිටා ඇත.එසේ පිහිටා ඇති තේ වතුයායන්වල තේ වගා කොට ඇති ක්ෂේත්‍රවල නියමිත ප්‍රමාණයට වඩා තේ පඳුරු ගහනය අඩු ක්ෂේත්‍රයන්හි කෝපි වගා කරමින්, ඉහළ ආදායමක් උපයා ගනිමින් නකල්ස් කලාපයේ හරිත ගහනය වැඩි කිරීම මෙහි අරමුණයි. ඉහත ක්‍රියාකාරකම් තුලින් වැවිලි සංස්ථාවට නකල්ස් කඳුකරයට ආවේනික කෝපි වෙළඳ සංනාමයක් ඇති කර, පාංශු ඛාදනය සහ අවසාදිතයන් වළක්වමින් ජල කළමණාකරණය, කෘෂිකර්මය සහ අගයදාම වැඩි දියුණු කිරීම, වන සංරක්ෂණ, ප්‍රජා වන සංරක්ෂණය හා සංචාරක කරමාන්තය හා නකල්ස් අවට ප්‍රජාව ආදායම් මට්ටමින් ශක්තිමත් කිරීම මෙහි ප්‍රධාන ඉලක්ක වේ.

## සී/ස කුරුණෑගල වැවිලි සමාගම

**දැක්ම**

අග්නිදිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි හා කෘෂි ව්‍යාපාර කළමනාකාරීත්ව සමාගම බවට පත්වීම.

**මෙහෙවර**

පරිසර හිතකාමීව සහ සමාජ වගකීමකින් යුක්තව ස්වභාවික, භෞතික හා මානව සම්පත් ඵලදායි අන්දමින් ප්‍රයෝජනයට ගැනීම තුළින් වැවිලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ඵලදායි ලෙසත්, ලාභදායි ලෙසත් තිරසාර ලෙසත් කළමනාකරණය කරමින් සියලු පාර්ශවකරුවන්ගේ උන්නතිය උදෙසා මෙන්ම සමස්තයක් වශයෙන් රටේ උන්නතිය උදෙසා කටයුතු කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 619.08 |
| 02 | පුනරාවර්තන වියදම් | 1,317.59 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු ආදායම (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | **ආදායම් උත්පාදනය** | | | |
| | පොල් | ගෙඩි | 15,150,000 | 986.75 |
| | රබර් | කිලෝ ග්‍රෑම් | 134,550 | 80.73 |
| | පොල් ආශ්‍රිත නිෂ්පාදන | - | - | 36.35 |
| | කිරි නිෂ්පාදනය | - | - | 4.13 |
| | අතුරු බෝග | - | - | 147.24 |
| | අගය එකතු කල නිෂ්පාදන සහ අලෙවිසැල් | - | - | 516.68 |
| | අනෙකුත් | - | - | 3.92 |

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 02 | **වගා හා වගා සංවර්ධනය කිරීම** | | | |
| | පොල් යටි වගා ස්ථාපිත කිරීම | පොල් පැළ | 5,043 | 50.47 |
| | පුරප්පාඩු පොල් පැල සිටුවීම | පොල් පැළ | 3,850 | 4.83 |
| | පොල් පැල තවාන් ස්ථාපිත කිරීම | පොල් පැළ | 43,000 | 9.77 |
| | දැව වගා කිරීම | දැව පැළ | 3,800 | 0.28 |
| | තේ වගා කිරීම | හෙක්ටයාර් | 04 | 6.34 |
| | ටොම්.ඊ.ජේ.සී. අඹ වගා කිරීම | පැළ | 1,500 | 3.13 |

| | | | | |
|---|---|---|---|---|
| | කුරුඳු වගා කිරීම | පැළ | 149,120 | 47.47 |
| | කජු වගා කිරිම | පැළ | 300 | 1.12 |
| | කෝපි වගා කිරීම | පැළ | 2,100 | 0.51 |
| | වැල් දොඩම් වගා කිරීම | පැළ | 400 | 0.64 |
| | කරාබු වගා කිරීම | පැළ | 400 | 0.08 |
| | සමෝච්ඡ කාණු කැපීම | මීටර් | 5,750 | 0.69 |
| | පවතින වැටවල් අලුත්වැඩියාව | මීටර් | 24,000 | 3.61 |

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 03 | **ඉඩම් සංවර්ධනය කිරීම** | | | |
| | වැටවල් ඉදි කිරීම | මීටර් | 10,400 | 17.81 |
| | පාරවල් සැකසීම | මීටර් | 700 | 6.50 |
| | ජල සම්පාදන ව්‍යාපෘති | ගණන | 04 | 2.10 |
| | ළිං ඉදි කිරීම | ගණන | 07 | 1.80 |
| | සී.සී.ටී.වී. කැමරා පද්ධති ස්ථාපිත කිරීම | ගණන | 11 | 3.1.0 |
| | වෙනත් ඉදි කිරීම් | | | 1.28 |
| | **එකතුව** | | | **32.59** |
| 04 | **ගොඩනැගිලි** | | | |
| | මුර නිවාස ඉදි කිරීම | ගණන | 07 | 19.50 |
| | වතු නිවාස ඉදි කිරීම හා අලුත්වැඩියාව | ගණන | - | 15.84 |
| | කබානා ඉදි කිරීම | ගණන | 06 | 13.50 |
| | වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියාව | | | 17.32 |
| | **එකතුව** | | | 66.17 |
| 05 | කාර්යාලයීය සහ ගෘහ භාණ්ඩ | | | 2.10 |
| 06 | උපකරණ | | | 5.39 |
| 07 | වාහන හා යන්ත්‍රසූත්‍ර | | | 4.20 |
| 08 | පරිගණක හා උපාංග | | | 0.54 |
| 09 | සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීම. | | | 16.00 |
| 10 | අයිස්ක්‍රීම් කර්මාන්තශාලා ස්ථාපිත කිරීම. | | | 150.00 |
| 11 | පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම. | | | 5.00 |

- **2024.11.30 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | **2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)** | **2024.11.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.)** | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 730.54 | 265.63 | 36.35% |
| 02 | පුනරාවර්තන වියදම් | 1,304.49 | 863.72 | 66.13% |

- **2024.11.30 දිනට ආදායම් උපයා ගැනීමේ ප්‍රගතිය**

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම (රු.මි.) | 2024 නොවැම්බර් මස 30 වන දිනට සත්‍ය ආදායම (ආසන්න වශයෙන්) (රු.මි.) |
|---|---|---|
| පොල් | 943.38 | 736.80 |
| රබර් | 55.66 | 63.40 |
| පොල් ආශ්‍රිත නිෂ්පාදන | 18.44 | 55.80 |
| කිරි ගව ව්‍යාපෘතිය | 7.02 | 1.98 |
| අතුරු බෝග | 136.81 | 105.60 |
| අගය එකතු කළ නිෂ්පාදන | 376.48 | 162.50 |
| වෙනත් | 3.60 | 3.10 |

- **2024.11.30 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| වගා සංවර්ධනය කිරීම | පොල් යටි වගා ස්ථාපනය කිරීම | 35.18 | 24.87 | අත්තනගල්ල,දඹදෙණිය,දොඩම්ගස්ලන්ද, හිරියාල,කටුගම්පොල,කුරුණෑගල හා නාරම්මල වතුයායන්වල පොල් පැල හෙක්ටයාර් 44.05 ක් ආවරණය කරමින් පොල් පැල 6992 ක් සිටුවීම අවසන් කර කර ඇත. * |
| | පොල් පැළ තවාන් ස්ථාපනය කිරීම | 6.01 | 2.89 | දඹදෙණිය, දොඩම්ගස්ලන්ද, හිරියාල, කුරුණෑගල හා නාරම්මල වතුයායන්වල පොල් පැළ 32,000 ක් නිෂ්පාදනය කරන ලද අතර ඒවා වතුයායන්වල අවශ්‍යතාවය පරිදි සිටුවීම සඳහා සහ අලෙවි කිරීම සඳහා භාවිතා කරනු ලබයි. * |
| වගා සංවර්ධනය කිරීම. | දැව වගා කිරීම | 0.35 | 0.18 | අත්තනගල්ල,දඹදෙණිය,දොඩම්ගස්ලන්ද, හිරියාල,කටුගම්පොල, කුරුණෑගල හා නාරම්මල යන සමාගමට අයත් සියලුම වතුයායන්වල දැව ගස් 3550 ක් සිටුවා අවසන් කරන ලදි. * |
| | තේ වගා කිරීම | 9.11 | 2.20 | අත්තනගල්ල පළාත් වතු කලාපයට අයත් වායගොල්ල බෙදුමේ අතුරු බෝගයක් ලෙස හෙක්ටයාර් 04 ක බිම් ප්‍රමාණයක තේ පැල සිටුවා අවසන් කරන ලදි. * |

| | | | | |
|---|---|---|---|---|
| | ටොම්.ඊජේ. සී. වර්ගයේ අඹ වගා කිරිම | 3.22 | 2.98 | දඹදෙණිය, දොඩම්ගස්ලන්ද සහ කටුගම්පොල යන වතුයායන්වල අතුරු බෝග ලෙස අඹ පැළ 2,600 ක් සිටුවා අවසන් කරන ලදි. * |
| | කුරුඳු වගා කිරිම | 6.60 | 4.65 | දඹදෙණිය, දොඩම්ගස්ලන්ද, කටුගම්පොල කුරුණෑගල හා නාරම්මල යන වතුයායන්වල කුරුඳු පැළ 32,992 ක් සිටුවා අවසන් කරන ලදි. * |
| | කෝපි | 0.22 | 0.12 | දොඩම්ගස්ලන්ද වතුයායේ කෝපි පැළ 1000 ක් සිටුවා අවසන් කරන ලදි. * |
| | පේර | 0.97 | 0.66 | කුරුණෑගල පළාත් වතුයායේ පේර පැළ 2000 ක් සිටුවා අවසන් කරන ලදි. * |
| **ඉඩම් හා ඉඩම් සංවර්ධනය කිරීම** | වැටවල් ඉදි කිරිම | 16.16 | 8.50 | සමාගමේ සියලුම වතුයායන්වල වැටවල් මීටර් 10,400 ක් ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත කල අතර 2024 නොවැම්බර් මස වන විට මීටර් 4826 ක් ඉදි කර අවසන් කරන ලදි. ඉතිරි ප්‍රමාණය කෙරීගෙන යන වැඩ ලෙස පවතී. * |
| | ජල සම්පාදන ව්‍යාපෘති හා පතස් ඉදි කිරීම. | 2.13 | 0.29 | වතුයායන්වල පතස් 03 ක් ඉදි කල අතර ජල සම්පාදන ව්‍යාපෘති ස්ථාපිත කරන ලදි. * |
| | ළිං ඉදි කිරිම | 0.90 | 0.30 | වතුයායන්වල කාර්ය මණ්ඩලයේ, මුරකරුවන්ගේ හා කම්කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ළිං 05 ක් ඉදි කරන ලදි. * |
| | ගේට්ටු ඉදි කිරිම | 1.40 | 0.19 | වතුයායන්වල ගේට්ටු 10 ක් ඉදිකර අවසන් කරන ලදි. * |
| | සී.සී.ටී.වී. කැමරා පද්ධති ස්ථාපිත කිරිම | 7.8 | 3.70 | වතුයායන්වල පොල් ගොඩවල්වල ආරක්ෂාව සඳහා සී.සී.ටී.වී. කැමරා පද්ධති ස්ථාපිත කරන ලදි. * |
| **ගොඩනැගිලි ඉදි කිරීම** | මුර නිවාස/වතු නිවාස/වෙනත් ගොඩනැගිලි ඉදි කිරීම හා අලුත් වැඩියාව | 49.70 | 23.00 | වතුයායන්වල මුර නිවාස 05 ක් ඉදි කිරීමට ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඉදි කිරීමේ කටයුතු සිදු කරගෙන යමින් පවතී. |
| | පළතුරු යුෂ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාව ඉදි කිරිම | 7.00 | - | හිරියාල පළාත් වතුයායේ ඉදි කිරීම් ආරම්භ කර ඇත. * |

| | | | | |
|---|---|---|---|---|
| **ගොඩනැගිලි ඉදි කිරීම** | අලෙවි මධ්‍යස්ථාන හා පැළ තවාන ස්ථාපනය | 2.00 | 2.81 | නාරම්මල පළාත් වතුයායේ ඔළියදෙනිය බෙදුමේ අලෙවි මධ්‍යස්ථාන හා පැළ තවාන ඉදි කිරීම් අවසන් කරන ලදි. * |
| | විදුලිය ලබා ගැනීම හා සූර්ය පැනල පද්ධති ස්ථාපිත කිරීම | 5.34 | 3.30 | වතුයායන්වල මුර නිවාස සඳහා විදුලිය ලබා ගෙන ඇති අතර අලුතින් ඉදි කරන නිවාස සඳහා විදුලිය ලබා ගැනීමට නියමිතය. * |
| **කාර්යාලීය සහ ගෘහ භාණ්ඩ** | ප්‍රධාන කාර්යාලයේ, වතු කාර්යාලයේ හා කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම. | 2.15 | 1.59 | වර්ෂය තුළ මිලදී ගැනීමේ කටයුතු අවසන් කරන ලදි. |
| වාහන හා යන්ත්‍ර සූත්‍ර උපකරණ | ප්‍රධාන කාර්යාලයේ, වතු කාර්යාලවල වතු නිවාස හා ක්ෂේත්‍ර කටයුතු සඳහා උපකරණ මිලදී ගැනීම. | 5.40 | 6.73 | වර්ෂය තුළ මිලදී ගැනීම් කටයුතු සිදු කරන ලදි. * |
| | පරිගණක උපකරණ (ප්‍රධාන කාර්යාලය) | 8.01 | 5.73 | වර්ෂය තුළ මිලදී ගැනීම් කටයුතු සිදු කරන ලදි. * |
| | යතුරු පැදි | 1.70 | - | මිලදී නොගන්නා ලදි. |
| | කොහු නිෂ්පාදනය සඳහා යන්ත්‍ර සූත්‍ර | 3.00 | 3.74 | කටුගම්පොල පළාත් වතුයාය සඳහා මිලදී ගන්නා ලදි. |
| | ට්‍රක් රථ | 5.50 | - | භාණ්ඩාගාර අනුමැතිය ලැබී නැත. |
| | ට්‍රැක්ටර් ට්‍රේලර් රථ | 1.50 | 1.63 | මිලදී ගන්නා ලදි. |
| | වාහන අලුත්වැඩියා කිරීම් (ප්‍රාග්ධන වියදම්) | 5.55 | 1.25 | අලුත්වැඩියා කරනු ලබයි. * |

| | | | | |
|---|---|---|---|---|
| විශේෂ ව්‍යාපෘති | අයිස්ක්‍රීම් කර්මාන්තශාලා හා යන්ත්‍ර සූත්‍ර | 135.00 | 10.14 | ප්‍රධාන කාර්යාල භූමියේ මූලික ඉදි කිරීම් වැඩ කටයුතු ආරම්භ කර ඇත. |
| | ජල බෝතල් කිරීමේ ව්‍යාපෘතිය | 50.00 | - | ප්‍රධාන කාර්යාල භූමියේ ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | පොල් තාක්ෂණික උද්‍යානය | 100.00 | 21.00 | නාරම්මල පළාත් වතුයායට අයත් ඔලියදෙනිය බෙදුමේ ආරම්භ කරන ලදි. |
| | සූර්ය පැනල පද්ධති සවි කිරීම | 35.20 | 7.20 | සූර්ය පැනල පද්ධති සවි කිරීම සඳහා මූලික කටයුතු සිදු කරමින් පවතී.<br>(අලෙවි සැල් - 10<br>වතු කාර්යාල - 07<br>වතු අධිකාරි නිල නිවාස - 07<br>කළමනාකරුවන්ගේ නිල නිවාස - 04 |

* 2024 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී සත්‍ය වියදම් සඳහා ගැලපුම් සිදු කිරීමට යටත්ව වැය වූ වියදම ගණනය කිරීමට නියමිතය.

- **2025 වර්ෂයේ දී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්**

| පළාත් වතුයාය | කෘෂිකාර්මික/ කෘෂිකාර්මික නොවන ව්‍යාපෘති | පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | ➢ අයිස්ක්‍රීම් නිෂ්පාදන කර්මාන්තශාලාව | |
| අත්තනගල්ල | ➢ පාරිසරික/ පොල් වගාව ආශ්‍රිත සංචාරක කර්මාන්තය<br>➢ විජලිත හීන්බෝවිටියා, තෙබු, යකිනාරම්, වැල් පෙනෙල නිෂ්පාදනය<br>➢ තැඹිලි තෙල් නිෂ්පාදනය | ➢ රඹුටන් සහ වරකා ඇසුරුම් කිරීම<br>➢ හීන්බෝවිටියා, තෙබු, යකිනාරම්, වැල් පෙනෙල වලින් කැප්සියුල් නිෂ්පාදනය |
| දඹදෙණිය | | ➢ කෝපි වගාව කෘෂි වන වගාවක් ලෙස සිදුකිරීම |
| දොඩන්ගස්ලන්ද | ➢ පොල් වතුර බෝතල් කිරීම<br>➢ ස්වාභාවික පරිසරය තුල සංචරණය කිරීමට අවස්ථාව ලබාදීම<br>➢ තරු පංතියේ හෝටල් සඳහා කුළුබඩු සැපයීම | ➢ කුරුඳු කොල තෙල් සඳහා අගය එකතු කිරීම<br>➢ විජලිත අනෝදා කුඩු නිෂ්පාදනය<br>➢ ගාගත් පොල් පැකට් කිරීම |
| හිරියාල | ➢ කබානා තුනක් ඉදිකිරීම | ➢ පලතුරු යුෂ ඇසුරුම් කිරීම |
| කටුගම්පොල | | ➢ කොහු නිෂ්පාදනය |
| කුරුණෑගල | ➢ පොල් ආශ්‍රිත නිෂ්පාදන සැකසීම | ➢ ආරක්ෂිත කුටි තුල බෝග වගාව |
| නාරම්මල | ➢ සෙක්කු තෙල් නිෂ්පාදනය<br>➢ මී රා ඇසුරුම් කිරීම<br>➢ කබානා තුනක් ඉදිකිරීම | ➢ කාබන් තිර කිරීම |

# ඇල්කඩුව වැවිලි සමාගම

**දැක්ම**

සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ආරක්ෂා කරමින් වතු කර්මාන්තයේ වඩාත්ම අභියෝගාත්මක තරඟකරුවා වීම.

**මෙහෙවර**

ජාතික අවශ්‍යතා ආරක්ෂාකාරීව මෙහෙයවන අතරතුර සේවකයන්ගේ ජීවන තත්වය නංවාලීම තුළින් සම්පත් ප්‍රශස්ත මට්ටමින් භාවිතා කර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 138.00 |
| 02 | පුනරාවර්තන වියදම් | 120.00 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | තේ නැවත වගාව | හෙක්ටයාර | හෙක් . 10 | 15.00 |
| 02 | පොල් නැවත වගාව | හෙක්ටයාර | හෙක් . 13 | 6.50 |
| 03 | රබර් නැවත වගාව | හෙක්ටයාර | හෙක්. 27 | 8.50 |
| 04 | බණ්ඩාරපොල කර්මාන්තශාලාව අලුත්වැඩියාව | නිෂ්පාදන කිලෝ | දෛනික නිමි තේ නිෂ්පාදන ධාරිතාව කිලෝ 525 සිට කිලෝ 3,150 දක්වා වැඩි කිරීම. | 35.00 |
| 05 | රත්වත්ත කර්මාන්තශාලාව අලුත් වැඩියාව | නිෂ්පාදන කිලෝ | තේ නිෂ්පාදනය නැවත ආරම්භ කිරීම. (දෛනික නිමි තේ නිෂ්පාදන ධාරිතාව කිලෝ 1,575) | 25.00 |
| 06 | නව ට්‍රැක්ටර් රථ මිලදී ගැනීම. | කල්බදු ක්‍රමයට මිලදී ගත් ට්‍රැක්ටර් රථ සංඛ්‍යාව | නව ට්‍රැක්ටර් රථ 08ක් මූල්‍ය කල්බදු ක්‍රමයට මිලදී ගැනීම. | 32.00 |
| 07 | නව ලොරි රථ මිලදීගැනීම | කල්බදු ක්‍රමයට මිලදී ගත් ලොරි රථ සංඛ්‍යාව | නව ලොරි රථ 02 මූල්‍ය කල්බදු ක්‍රමයට මිලදී ගැනීම. | 16.00 |
| 08 | යාන්ත්‍රීකරණය | හඳුන්වා දුන් යාන්ත්‍රීකරණ සංඛ්‍යාව | පුහුණු කම්කරු හිඟය මඟ හරවා ගැනීමට පිලියමක් වශයෙන් තේ දළු නෙලීම, කප්පාදුව සහ පත්‍ර මත දියර පොහොර ඉසීම යාන්ත්‍රීකරණය කිරීම. | 5.00 |

| | | | | |
|---|---|---|---|---|
| 09 | නකල්ස් ව්‍යාපෘතිය (Funding Agent - International Union for Conservation of Nature and Natural Resources – IUCN and Ministry of Irrigation) | හෙක්ටයාර් ප්‍රමාණය | නකල්ස් ආරක්ෂිත කලාපයේ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය- හෙක්. 100 | 120.00 |

- **2024.11.30 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.11.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 175.27 | 12.087 | 7% |
| 02 | පුනරාවර්තන වියදම් | 429.373 | 362.169 | 84% |

- **2024.11.30 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**
  - ❖ දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රමවත් වී පැවති රසායනික පොහොර භාවිතය ක්‍රමවත්ව ආරම්භ කිරීමට අවශ්‍ය රුපියල් මිලියන 60 ක ප්‍රතිපාදන වෙන් කිරීම සහ මින් ප්‍රථම තොගය වන රුපියල් මිලියන 15 වටිනා පොහොර ලබාදීම.
  - ❖ සමාගමට දීර්ඝ කාලයක් තිස්සේ අඩුපාඩුවක්ව පැවති මෘදුකාංග පද්ධතිය (ERP) අවුරුද්දක කාලයක් සඳහා නොමිලේ ලබා ගැනීම.
  - ❖ බණ්ඩාරපොළ තේ කර්මාන්තශාලාවට දීර්ඝ කාලයක් තිස්සේ අඩුපාඩුවක්ව පවතින වර්ණ විභේදක (Color Sorter) යන්ත්‍රයක් ලබා ගැනීමට කටයුතු කිරීම තුළින් ඉතා අඩු අගයක පවතින නිමි තේ කිලෝවක විකුණුම් මිල, ප්‍රාදේශීය විකුණුම් සාමාන්‍ය අගය (Elevation Average) දක්වා වැඩි කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.
  - ❖ ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වෙතින් අධ්‍යාපනය ලැබූ අභ්‍යාසලාභී කණිෂ්ඨ සහකාර වතු අධිකාරිවරුන් හතර දෙනෙකු දෙසැම්බර් මස 15 දින සිට වසරක කාලයක් සඳහා බඳවා ගැනීම.
  - ❖ අත්හැර දමා හා වල් වැදී තිබූ, ආදායම් ලබා ගත හැකි ක්ෂේත්‍රයන් නැවත යථාතත්වයට පත් කිරීම තුළින් කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ දැමීමට කටයුතු කිරීම.
  - ❖ 2024 නොවැම්බර් මස 18 වන දින කළමනාකාරිත්වය සමඟ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති සහ තේ කොමසාරිස්වරයා හා පැවති සාකච්ඡාවෙන් පසු තේ නැවත වගා කිරීමේ සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා ක්‍රමය ආරම්භ කිරීම සඳහා කටයුතු සිදු කිරීම.

- **2025 වර්ෂයේ දී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්**

❖ පුහුණු කම්කරු හිඟය මඟ හරවා ගැනීමට පිළියමක් වශයෙන් තේ දළු නෙලීම, කප්පාදුව සහ පත්‍ර මත දියර පොහොර ඉසීම යාන්ත්‍රීකරණය කිරීම සහ ඒ සඳහා රුපියල් මිලියන 05 කට අධික යන්ත්‍රෝපකරණ ගෙවීමේ පදනම මත ලබාදීම.

❖ තේ දළු නෙලීමේ චක්‍රය ක්‍රමවත් කිරීම, අතහැර තිබූ වගා ක්ෂේත්‍ර නැවත ක්ෂේත්‍ර ගත කිරීම හා බාහිර පාර්ශ්ව වෙත නිදහස් කොට තිබූ වගා ක්ෂේත්‍ර නැවත සමාගම් පාලනය වෙත නතු කර ගැනීම තුළින් වාර්ෂික අමු තේ දළු අස්වැන්න කිලෝ ග්‍රෑම් මිලියන 1.8 සිට කිලෝ ග්‍රෑම් මිලියන 2.6 දක්වා ඉහළ නැංවීමට සැලසුම් කිරීම.

❖ රාජ්‍ය නොවන සංවිධාන (Berendia) හරහා වතු සේවකයන් හා වතු ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට අවශ්‍ය සෞඛ්‍ය, අධ්‍යාපන, සනීපාරක්ෂක හා නිවාස ආදී සියලු පහසුකම් ලබා දීමට කටයුතු සංවිධානය කිරීම.

❖ වතුයායන් තුළ පුරප්පාඩු වී පැවති නිලතල සඳහා කාර්යක්ෂමතාවය පදනම් කරගනිමින් අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම මගින් එම වතුයායන් තුළ දීර්ඝ කාලයක් තුළ පැවති කළමනාකරණ ගැටළු නිරාකරණය කිරීම.

❖ දීර්ඝ කාලයක් තිස්සේ වසා දමා තිබූ රත්වත්ත තේ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට අවශ්‍යය මූලික කටයුතු සිදු කිරීම සහ එමගින් දෛනිකව නිමි තේ කිලෝ 1,575 නිෂ්පාදනය කිරීමට සැලසුම් කිරීම.

❖ කුලී ලොරි රථ සඳහා දැනට ප්‍රවාහන වියදම් ලෙස වසරකට රුපියල් මිලියන 04 කට අධික මුදලක් වියදම් වන අතර එලෙස සමාගමෙන් පිටතට ගලා යන මුදල් නතර කිරීම සඳහා සමාගමට විශාල අඩුපාඩුවක්ව පවතින ලොරි 02 ක් සහ ට්‍රැක්ටර් 08 ක් මූල්‍ය කල්බදු ක්‍රමයට මිලදී ගැනීමට සැලසුම් කිරීම.

❖ සමාගමෙන් පිටතට විකුණනු ලබන අමු තේ දළු සඳහා දැනට පවතින මිලට (රු.168/=) වඩා රුපියල් 4.50/= ක් වැඩියෙන් (රු.172.50/=) අමු තේ දළු විකිණීමට කටයුතු කිරීම. එමගින් 2025 වසරේ අතිරේක රුපියල් මිලියන 10 කට වඩා වැඩි ආදායමක් ලබාගැනීමට සැලසුම් කිරීම.

❖ අතිරික්ත ලෙස කොළඹ කාර්යාලයේ සහ මාතලේ ප්‍රධාන කාර්යාලයේ රඳවා සිටි සේවකයන් පුරප්පාඩු වී පැවති සේවා ස්ථාන වෙත යොමු කිරීම.

- සේවක පඩි නඩි මුදලින් ගෙවීම වෙනුවට, බැංකු ගත කිරීම සඳහා මූලික කටයුතු සිදු කිරීම මඟින් වාර්ෂිකව රුපියල් මිලියන 3.2 ක් 2025 වසරේ දී සමාගමට ඉතිරි කර ගැනීමට කටයුතු කිරීම.
- එමගින් මාසිකව මහේස්ත්‍රාත් උසාවි හරහා ගෙවන රුපියල් මිලියන 06 කට අධික මුදලක්
- විකල්ප ආදායම් ප්‍රභවයන් බලගැන්වීම අරමුණු කොටගෙන පහත සඳහන් පරිසර හිතකාමී ආකර්ෂණීය සංචාරක කලාපයන් සංවර්ධනය කිරීම තුළින් සමාගමේ ලාභදායීතාව වැඩි දියුණු කිරීම.

  අ). සෙම්බුවත්ත සංචාරක කළාපය - ඇල්කඩුව වතුයාය

  ආ). හුලංගල නැරඹුම් මධ්‍යස්ථානය හා සංචාරක කළාපය - සැලගම වතුයාය

  ඇ). හුදෙකලා කන්ද නැරඹුම් ප්‍රදේශය - හුණුගල වතුයාය (One Tree Hill)
- ඉහත සංචාරක කලාප මුල් කරගත් පරිසර හිතකාමී හෝටල් ව්‍යාපෘතියක් සංචාරක අමාත්‍යාංශයේ සහ සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ (TDA) උපදෙස් මත දියත් කිරීමට සැලසුම් කිරීම.

## සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම

**දැක්ම**

වඩාත් හොඳ ශ්‍රී ලාංකීය සීටීසී හා ඕතඩොක්ස් තේ නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ වඩාත් පිළිගත් ආදර්ශමත් ආයතනයක් බවට පත්වීම.

**මෙහෙවර**

දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින් විශිෂ්ඨ තත්වයේ ප්‍රණීත හා පාරිභෝගිකයන්ට හිතකර ශ්‍රී ලාංකීය තේ නිෂ්පාදනය කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 809.180 |
| 02 | පුනරාවර්තන වියදම් | 2,929.573 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | නිමි තේ නිෂ්පාදනය | මෙ.ටො. | 1,935.42 | 2,783.612 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) |
|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 809.180 | 8.60 |
| 02 | පුනරාවර්තන වියදම් | 2,929.573 | 1,249.538 |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| නිමි තේ නිෂ්පාදනය | 2,783.612 | 1,249.538 | නිෂ්පාදිත නිමි තේ තොගය මෙ.ටො. 948,790 |

- **2025 වර්ෂයේ දී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්**

  - ❖ නිමි තේ නිෂ්පාදනය හා අපනයනය
  - ❖ තේ කර්මාන්තශාලා සඳහා සූර්ය පැනල පද්ධති ස්ථාපනය
  - ❖ තේ කර්මාන්ත ශාලා ධාරිතා සංවර්ධනය

# ජනතා වතු සංවර්ධන මණ්ඩලය

**දැක්ම**

ප්‍රාදේශීය මට්ටමින් හොඳම මැදරට පාරම්පරික තේ නිෂ්පාදකයා වීම මඟින් ඉහළම ශුද්ධ අලෙවි මිලක් ලබාගැනීමෙන් ලාභ ලබන හා ශක්තිමත් රාජ්‍ය ආයතන අතරින් එකක් බවට පත්වීම.

**මෙහෙවර**

උපරිම කැපවීමකින්, පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පුද්ගල නිපුණතාවයන් සංවර්ධනයට වැඩි සැලකිල්ලක් දක්වමින් කණ්ඩායම් ක්‍රියාකාරීත්වය හරහා අරමුණු කරා ළඟා වීම තුළින් කර්මාන්ත අභිවෘද්ධියේ ප්‍රතිලාභ සමස්ත රටටම හිමි කර දීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 696.245 |
| 02 | පුනරාවර්තන වියදම් | 2,671.003 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | තේ නැවත වගාව | හෙක්ටයාර් | 24 | 84.00 |
| 02 | රබර් නැවත වගාව | හෙක්ටයාර් | 20 | 34.00 |
| 03 | තේ නැවත වගාවේ නඩත්තු කටයුතු වෙනත් කටයුතු | හෙක්ටයාර් | 30 | 61.00 |
| 04 | රබර් වගාවේ නඩත්තු කටයුතු | හෙක්ටයාර් | 103 | 51.00 |
| 05 | පාළු සිටුවීම | හෙක්ටයාර් | 14 | 51.00 |
| 06 | තේ පැළ තවාන් | පැල ගණන | 760,000 | 25.00 |
| 07 | තේ කර්මාන්තශාලා හා යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා | කර්මාන්තශාලා ගණන | කර්මාන්තශාලා 03 (හොප්, ලෙවලන් සහ ලූලේකඳුර) | 245.00 |
| 08 | වාහන අලුත්වැඩියා | ගණන | 10 | 53.00 |
| 09 | පාරවල් අලුත්වැඩියා | කිලෝ මීටර් | 4.5 | 07.00 |
| 10 | වතු බංගලා වෙනත් අලුත්වැඩියා | ගණන | බංගලා 17 | 34.00 |

- **2024.11.30 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.11.30 දක්වා වැය කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 813.587 | 60.50 | 7.43% |
| 02 | පුනරාවර්තන වියදම් | 2,393.391 | 1661.42 | 69.62% |

- **2024.11.30 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | තේ නැවත වගාව | 54.08 | 2.25 | හෙක්ටයාර් 4.50 |
| 02 | තේ නැවත වගාවේ නඩත්තු කටයුතු වෙනත් කටයුතු | 53.45 | 16.38 | හෙක්ටයාර් 21.50 |
| 03 | රබර් වගාවේ නඩත්තු කටයුතු | 63.47 | 15.88 | හෙක්ටයාර් 107.45 |
| 04 | පාළු සිටු වීම | 47.89 | 1.35 | හෙක්ටයාර් 2.00 |
| 05 | තේ පැළ තවාන් | 21.50 | 4.09 | තේ පැළ 131952 |
| 06 | තේ කර්මාන්තශාලා හා යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා | 376.77 | 0.03 | - |

- **2025 වර්ෂයේ දී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්**

  - ❖ තේ නැවත වගාව පාළු සිටුවීමේ ක්‍රමයට සිදු කිරීමට කටයුතු කරන අතර, ඒ අනුව තේ හෙක්ටයාර් 40 ක් රබර් හෙක්ටයාර් 15 ක් වශයෙන් නැවත වගා කිරීමට සැලසුම්කර ඇත. ඒ අනුව මේ සඳහා රු මිලියන 225ක පමණ මුදලක් ආයෝජනය කිරීමට සැලසුම් කර ඇත.
  - ❖ පාළු සිටුවීම සඳහා අවශ්‍ය පැළ ලබාගැනීමට හඳුනාගත් වතුයායන්වල තේ සහ රබර් පැළ තවාන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර, පැළ 700,000ක් පමණ මේ තුළින් තවාන් කිරීමට සැලසුම් කර ඇත.
  - ❖ ISO and HACCP සහතික ලබාගැනීමට අවශ්‍ය පරිදී කර්මාන්තශාලා අලුත්වැඩියා කිරීමට සැලසුම් කර ඇත.

# සී/ස හලාවත වැවිලි සමාගම

**දැක්ම**

පොල් ඇතුළු වැවිලි කර්මාන්තයේ තිරසර සංවර්ධනය මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට උපරිම දායකත්වයක් ලබා දීම.

**මෙහෙවර**

පොල් ඇතුළු වැවිලි කර්මාන්තයේ තිරසර සංවර්ධනය සඳහා තමන් සතු සීමිත සම්පත් ඵලදායී ලෙස හා කාර්යක්ෂම ලෙස භාවිත කරමින් විදේශ වෙළෙඳපොළ සඳහා, අගය එකතු කළ නිෂ්පාදන යොමු කරමින් පිළිගත් ප්‍රතිපත්ති මඟින් සේවකයන්ගේ සහ මහජනතාවගේ ජීවන තත්වය නංවාලීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 185.00 |
| 02 | පුනරාවර්තන වියදම් | 1,190.00 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | යටි වගාව- දිවුලපිටිය | හෙක්/පැළ | හෙක් 02 /පැළ 320 | 1.113 |
| 02 | යටි වගාව- මංගලඑළිය | හෙක්/පැළ | හෙක් 05 /පැළ 800 | 16.244 |
| 03 | යටි වගාව - පලුගස්වැව | හෙක්/පැළ | හෙක් 05 /පැළ 750 | 4.282 |
| 04 | යටි වගාව- තම්බපණ්ණි | හෙක්/පැළ | හෙක් 05 /පැළ 800 | 3.269 |
| 05 | නව වගාව- තම්බපණ්ණි | හෙක්/පැළ | හෙක් 05 /පැළ 800 | 4.761 |
| 06 | කුරුඳු වගාව- දිවුලපිටිය | හෙක්/පැළ | හෙක් 02 /පැළ 5000 | 6.926 |
| 07 | කජු වගාව- මංගලඑළිය | හෙක්/පැළ | හෙක් 02 /පැළ 300 | 0.799 |
| 08 | කජු වගාව - තම්බපණ්ණි | හෙක්/පැළ | හෙක් 01.5 /පැළ 300 | 1.237 |
| 09 | කප්රුවන පැළ තවාන -බිංගිරිය | පැළ | 8,000 | 3.300 |
| 10 | පැළ තවාන -දිවුලපිටිය | පැළ | 1,875 | 0.399 |
| 11 | පැළ තවාන - මංගලඑළිය | පැළ | 7,500 | 1.539 |
| 12 | පැළ තවාන - පලුගස්වැව | පැළ | 25,500 | 6.977 |
| 13 | පැළ තවාන තම්බපණ්ණි | පැළ | 15,000 | 3.040 |

- **2024.11.30 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.11.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 244.00 | 76.00 | 31% |
| 02 | පුනරාවර්තන වියදම් | 1,017.00 | 757.00 | 74% |

- **2024.11.30 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| යටි වගාව | බිංගිරිය වතු කොටස | 4.90 | 0.10 | බිම් සැකසීම් කටයුතු ආරම්භ කර ඇත. |
| යටි වගාව | හලාවත වතු කොටස | 4.00 | 0.23 | බිම් සැකසීම් කටයුතු ආරම්භ කර ඇත. |
| යටි වගාව | දිවුලපිටිය වතු කොටස | 1.10 | 0.046 | බිම් සැකසීම් කටයුතු සිදු කර, පැළ සිටුවීම ආරම්භ කර ඇත. |
| නව යටි වගාව | මංගලඑළිය වතු කොටස | 2.60 | 2.13 | බිම් සැකසීම් කටයුතු සිදු කර, පැළ සිටුවීම ආරම්භ කර ඇත. |
| යටි වගාව | පලුගස්වැව වත්ත | 4.00 | 2.30 | පැළ සිටුවීම අවසන් කර ඇත. |
| නව වගාව | තම්බපණ්ණි වතු කොටස | 14.50 | 7.00 | බිම් සැකසීම් කටයුතු සිදු කර, පැළ සිටුවීම ආරම්භ කර ඇත. |
| කුරුඳු වගාව | බිංගිරිය වතු කොටස | 0.47 | 0.15 | බිම් සැකසීම් කටයුතු සිදු කර, පැළ සිටුවීම ආරම්භ කර ඇත. |
| කුරුඳු වගාව | හලාවත වතු කොටස | 0.30 | 0.025 | බිම් සැකසීම් කටයුතු සිදු කර, පැළ සිටුවීම ආරම්භ කර ඇත. |
| කුරුඳු වගාව | දිවුලපිටිය වතු කොටස | 0.60 | 0.054 | බිම් සැකසීම් කටයුතු සිදු කර ඇත. |
| තැඹිලි වගාව | තම්බපණ්ණි වතු කොටස | 2.00 | 0.37 | බිම් සැකසීම් කටයුතු සිදු කර, පැළ සිටුවීම ආරම්භ කර ඇත. |

- **2025 වර්ෂයේ දී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්**
  - ❖ තවාන් ව්‍යාපෘතිය යාපනය දිස්ත්‍රික්කයට ව්‍යාප්ත කරමින් නව පොල් ත්‍රිකෝණයේ නව පොල් වගාව සහ කජු වගාව දියුණු කිරීමට අපේක්ෂිතයි.
  - ❖ නව බිංදු ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කිරීම මඟින් පොල් වගාවට අවශ්‍ය ජලය ලබාදීමටත් එමඟින් ඵලදාව ඉහල දැමීමටත් අපේක්ෂා කරයි.
  - ❖ කිණියම වතු කලාපයේ පවතින කප්රුවන බීජ පොල් උයන මඟින් පැළ නිපදවා ගොවීන් අතට ලබාදීම තවදුරටත් වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.
  - ❖ පොල් කර්මාන්තයේ උන්නතිය උදෙසා හලාවත වැවිලි සමාගම ඉදිරියේ දී, පොල් ගස් ගහණය වැඩි කිරීමට සහ ඵලදාව වැඩි කිරීමට කටයුතු යොදා ඇත.
  - ❖ පුවක් පැළ 10,000 ක් සිටුවීම.
  - ❖ නව/යටි වගාව හෙක්ටයාර 22 ක් ඇති කිරීම.
  - ❖ අක්කර 07 ක කටු අනෝදා ව්‍යාපෘතියක් ඇති කිරීම.
  - ❖ අඹ වගාව (TJC) තවදුරටත් ව්‍යාප්ත කිරීම. (පැළ 2,550 ක් සිටුවීම.)
  - ❖ පොකුණු සහ පතස් සඳහා මිරිදිය මත්ස්‍ය ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම.
  - ❖ කුරුඳු වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීම.
  - ❖ සුදුසු වතු කොට්ඨාසවල මී මැසි පාලනය ආරම්භ කිරීම.
  - ❖ නව නිෂ්පාදනය ඇති කිරීම හා අලෙවි ජාලය පුළුල් කිරීම.
  - ❖ තෙත් කලාපයට අයත් වතු කොට්ඨාසවල අතුරු භෝග වගාව ව්‍යාප්ත කිරීම.

## විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය
## කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR)

- **ව්‍යාපෘති සාරාංශය**

| | |
|---|---|
| **ව්‍යාපෘති මුළු පිරිවැය** | රු.මි. 9,401.00 |
| **ව්‍යාපෘති ආරම්භක දිනය** | 2016.04.26 |
| **ව්‍යාපෘති කාල සීමාව** | 2016 – 2024 |
| **අරමුදල් දායකත්වය** | කෘෂිකර්මය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD),<br>ශ්‍රී ලංකා රජය (GOSL) |

- **2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අරමුදල් ප්‍රභවයන් | **2024 වර්ෂය සඳහා වෙන්කිරීම (රු.මි.)** | **වියදම (රු.මි.)** | **අතැති බිල් පත් (රු.මි.)** |
|---|---|---|---|
| කෘෂිකර්මය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | 200.00 | 54.09 | - |
| ශ්‍රී ලංකා රජයේ දායකත්වය (GOSL) | 78.00 | 78.00 | - |
| **එකතුව** | **278.00** | **132.09** | **-** |

❖ ව්‍යාපෘතිය ක්‍රියාත්මක අවධියේ කටයුතු / ක්ෂේත්‍ර කටයුතු 2023.09.30 ට අවසන් විය. 2023.10.01 දින සිට 2024.03.31 දක්වා ව්‍යාපෘතිය වසා දැමීමේ කටයුතු සිදු කරන ලදි. එම නිසා භෞතික ප්‍රගතියක් නොමැත.

# කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතිය (ASMP)

- **ව්‍යාපෘති සාරාංශය**

| | |
|---|---|
| **ව්‍යාපෘති මුළු පිරිවැය** | ඇ.ඩො.මි. 59.66 (ඇ.ඩො.මි. 48.62 වෙනස්කම් සිදු කර ඇත.) |
| **ව්‍යාපෘති ආරම්භක දිනය** | 2017.03.17 |
| **ව්‍යාපෘති කාල සීමාව** | 2017 මාර්තු - 2021 දෙසැම්බර් (2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ඇත.) |
| **අරමුදල් දායකත්වය** | ශ්‍රී ලංකා රජය (GOSL), ලෝක බැංකුව |

- **ව්‍යාපෘති කාර්ය සාධනයට අනුව ප්‍රගතිය (2017.03.17 දින සිට 2024.12.31 දිනට ප්‍රගතිය)**

| **දර්ශකය** | **සමස්ත ඉලක්ක** | **2024.12.31 දිනට සමස්ත ප්‍රගතිය** |
|---|---|---|
| සෘජු ව්‍යාපෘති ප්‍රතිලාභීන් (සංඛ්‍යාව) | 100,000 | 130,000 |
| කාන්තා ප්‍රතිලාභින් | 40,000 | 52,000 |
| ව්‍යාපෘතිය මඟින් ප්‍රවර්ධනය කරන ලද වැඩිදියුණු කළ කෘෂිකාර්මික තාක්ෂණයන් භාවිත කර ඇති වගාකරුවන් | 70,500 | 39,321 |
| ව්‍යාපෘතිය මඟින් ප්‍රවර්ධනය කරන ලද වැඩි දියුණු කළ කෘෂිකාර්මික තාක්ෂණයන් භාවිත කර ඇති වගාකරුවන් - කාන්තා | 28,000 | 22,029 |
| ව්‍යාපෘති මැදිහත්වීම් හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනවල විකුණුම්වල සාමාන්‍ය අගය ඉහළ යාම (වෙළෙඳපොළ ප්‍රවේශ දර්ශකය) (ප්‍රතිශතය) | 25 | 45.3 |
| ව්‍යාපෘතිය යටතේ උත්පාදනය කරන ලද නව රැකියා | 9,900 | 7,923 |
| ව්‍යාපෘතිය යටතේ උත්පාදනය කරන ලද නව රැකියා ලද කාන්තාවන් ප්‍රමාණය | 3,960 | 4,773 |
| Window 1 යටතේ අනුමත මුළු ව්‍යාපෘති ගණන | 1,000 | 1,277 |
| Window 1 යටතේ අනුමත කුඩා පරිමාණ ව්‍යාපෘති ගණන | 300 | 340 |
| Window 1 යටතේ අනුමත පොකුරු ව්‍යාපෘති ගණන | 700 | 937 |
| Window 2 යටතේ අනුමත මහා පරිමාණ ව්‍යාපෘති ගණන | 160 | 171 |
| ව්‍යාපෘති-සහාය ලත් ගොවි නිෂ්පාදක සංවිධාන ලාභ ලැබීමේ ප්‍රතිශතය | 70 | 77.7 |
| ව්‍යාපෘති සහාය ලත් කාන්තා නායකත්ව ගොවි නිෂ්පාදක සංවිධාන ලාභ ලැබීමේ ප්‍රතිශතය | 70 | 75 |
| අනුමත ව්‍යාපාර සැලසුම් මත පදනම්ව ක්‍රියාත්මක වන ගැළපුම් ප්‍රදාන ලබන්නන්ගේ ප්‍රතිශතය | 80 | 95 |
| වෙළෙඳපොළ ප්‍රවේශය වැඩි දියුණු වූ ගැළපුම් ප්‍රදාන ලබන ව්‍යාපෘති ප්‍රතිශතය | 50 | 90 |
| පුහුණු වැඩසටහන් මඟින් ව්‍යාපෘති ප්‍රතිලාභීන් පුහුණුව ලද මුළු දින ගණන | 50,000 | 82,984 |
| පුහුණු වැඩසටහන් මඟින් කාන්තා ව්‍යාපෘති ප්‍රතිලාභීන් පුහුණුව ලද මුළු දින ගණන | 20,000 | 40,938 |

# ප්‍රගති වාර්තාව 2024

# ප්‍රජා යටිතල පහසුකම් අංශය


අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ 03

දුරකථනය : 011-2541369

ෆැක්ස් : 011-2328117/ 011-2322526

සැලසුම් අංශය

දුරකථනය : 011-2327993 (අධ්‍යක්ෂ ජනරාල්)

ෆැක්ස් : 011-2322718

විද්‍යුත් තැපැල් ලිපිනය : plan.smehci@gmail.com

## ප්‍රජා යටිතල පහසුකම් අංශය

ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවගේ ව්‍යාප්තිය මීට ශතවර්ෂ දෙකක පමණ කාලයක සිට එනම් බ්‍රිතාන්‍යයන් විසින් 1840 දී කඳුකරයේ, කෝපි වගාව ආරම්භ කිරීමත් සමග දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගනු ලැබූ ජන කොට්ඨාසයක් ලෙස ආරම්භ විය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 4.1% ක් පමණ එනම් මිලියන 1ට ආසන්න වන මෙම වැවිලි ප්‍රජාව කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, බදුල්ල, මොණරාගල, රත්නපුර හා කෑගල්ල වැනි දිස්ත්‍රික්කවල වතු ආශ්‍රිතව ව්‍යාප්තව ඇති අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විවිධ අමාත්‍යාංශයන් ඔස්සේ එම වැවිලි ප්‍රජාවගේ වාසස්ථාන, යටිතල පහසුකම්, ජීවනෝපාය හා සමාජ සංවර්ධනය යන අංශයන් උදෙසා එම වැවිලි ක්ෂේත්‍රයේ නියුතු ජනතාව සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරමින් පවතී. එහි විශේෂ දායකත්වයක් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් ඉටු කරන අතර, ඒ යටතේ පවතින හා ප්‍රජා යටිතල පහසුකම් අංශයේ කාර්යභාරය සඳහා කටයුතු කරන ප්‍රධාන ආයතන 03 කි.

- සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම
- වැවිලි මානව සංවර්ධන භාරය
- වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය

එම ආයතනවල කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම මෙම වතු යටිතල පහසුකම් සංවර්ධන අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් අතර වේ. ඉහත ආයතන මෙන්ම වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය යටතේ වන ප්‍රධාන අංශයන්හි ඒකාබද්ධ කාර්යයන් ඔස්සේ සමස්ත වැවිලි ප්‍රජාව මුහුණ දෙන සමාජ විෂමතාවන් ක්‍රමයෙන් අඩු කරමින් පහසුකම් භුක්ති විඳිනසෞභාග්‍යමත් වැවිලි ප්‍රජාවක් බිහි කිරීමේ අරමුණ පෙරදැරිව වතු පවුල් 261,429ක් මගින් නියෝජනය වනු ලබන 993,021ක් වූ ජනගහනයකගේ ජීවන තත්ත්වය නගාසිටුවමින් වාසස්ථාන පිළිබඳ ගැටලු, මූලික යටිතල පහසුකම් පිළිබඳ ගැටලු, අඩු අදායම් තත්ත්ව සෞඛ්‍ය හා පෝෂණ ගැටලු අවම කිරීම සඳහා සක්‍රීය ලෙස දායක වෙමින් ඔවුන්ගේ අධ්‍යාපන, සමාජ, ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම සිදුකරනු ලබයි. මෙම වතු නිවාස අංශය යටතේ මූලිකව කටයුතු කරන දිස්ත්‍රික්ක ලෙස කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, බදුල්ල, මොණරාගල, රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්ක හැඳින්විය හැකි වන අතර එම දිස්ත්‍රික්ක වැවිලි මානව සංවර්ධන භාරය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශිකයන් 7 ක් ලෙස ක්‍රියාත්මක වේ.

### ප්‍රජා යටිතල පහසුකම් අංශය - ප්‍රධාන කාර්යයන්

2024.11.25 දින අංක 2412/08 යටතේ පසුව නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් අතර පහත සඳහන් කාර්යයන් ප්‍රජා යටිතල පහසුකම් අංශයට සුවිශේෂී වේ.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් විෂයයන්ට සහ අනෙකුත් අමාත්‍යාංශයට අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, උපායමාර්ග , වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂයය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

- ❖ වැවිලි ක්ෂේත්‍රය/ මලයාලම් සඳහා නිවාස, ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය සහාය සහ යටිතල පහසුකම් සැපයීම.
- ❖ වැවිලි ප්‍රජාවට ස්ථිර නිවාස ඉදි කිරීම සඳහා ඉඩම් ලබාදීම.
- ❖ වතු ආශ්‍රිත ප්‍රදේශයන්හි දැරිය හැකි ආකාරයේ නිවාස යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම.
- ❖ වතු අංශයේ ප්‍රජාව ආර්ථික, සමාජයීය හා සංස්කෘතිමය වශයෙන් සවිබලගැන්වීම සඳහා මූලික පහසුකම්, ජීවනෝපාය උත්පාදන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුළු අනෙකුත් අවශ්‍යතා සැපයීමට අවශ්‍ය පියවර ගැනීම.
- ❖ ග්‍රාමීය වතු අංශයන්හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ❖ වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන ‘‘ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන’’ පිහිටුවීම.
- ❖ වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍යය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

## 2024 වර්ෂයේ ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

**පාලන අංශය**

- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශයේ පරිපාලන අංශය මගින් එම අංශය යටතේ පවත්නා සියලුම ආයතනයන්හි මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම සඳහා ක්‍රියා කිරීම.
- ❖ මානව සම්පත් නිසි ලෙස කළමනාකරණය කරමින් අනුමත සේවක සංඛ්‍යාව තුළ සියලුම අංශයන්හි රාජකාරී වගකීම් සැළකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය බෙදාහැරීම.
- ❖ මෙම අංශය යටතේ පවත්නා සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම් සහ ඒ යටතේ පවත්නා ආයතන සඳහා දින කාලයක සිට ගැටලුවක්ව පැවති ස්ථිර කාර්ය මණ්ඩලය නොමැති වීමේ ගැටලුව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විධිමත් පරිදි අනුමත කර ගැනීමෙන් අනතුරුව ඒ සඳහා බඳවා ගැනීම් පරිපාටි අනුමත කර ගැනීමට කටයුතු කර ඇත.
- ❖ නිලධාරින්ගෙන් සඵලදායි පහ කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම සඳහා සියලු නිලධාරින්ගේ දැනුම. ආකල්ප, කුලපතා වර්ධනය සහ නිලධාරීන් අභිප්‍රේරණය කිරීම සඳහා හඳුනාගත් විද්වතුන් මගින් විද්වත් හමුව නමින් දේශන මාලාවක් පැවැත්වීම.
- ❖ මෙම අංශය විවිධ විෂය නාමයන් යටතේ පැවති බැවින්, විවිධ අමාත්‍යාංශ නමින් පැවති වාහන 40 ක් ලියාපදිංචි බලපත්‍ර, 2024 වර්ෂයේදී එවකට පැවති ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නමින් පවරා ගැනීමට කටයුතු කරනු ලැබීය.

**සංවර්ධන අංශය**

- ❖ වැවිලි අංශයේ ජනතාවගේ සුභ සාධනය, ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි කිරීම උදෙසා වතු නිවාස අංශය යටතේ පවතින ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, හා ප්‍රාදේශීය සභා ඔස්සේ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම.
- ❖ මෙම ව්‍යාපෘති සම්බන්ධීකරණය පිළිබඳ සියළු වගකීම් දරමින් රජයේ ඒකාබද්ධ අරමුදලින් හා ඉන්දියානු රජයේ සහය යටතේ ලබා දෙන අරමුදල්ද යොදවමින් ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීමේ කාර්යභාරය සංවර්ධන අංශය මගින් සිදු කරනු ලබයි.

❖ **යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

- පේලි නිවාසයන්හි අබලන් වූ වහලයන් නැවත සෙවිලි කිරීම.
- සෞඛ්‍යාරක්ෂිත පානීය ජල සැපයුම් ක්‍රම ඇතිකිරීම සහ වැඩිදියුණු කිරීම.
- සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති.

❖ **වතු නිවාස වැඩසටහන යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

- නව ජීවන නිවාස වැඩසටහන යටතේ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන සමායෝජනය සහ අධීක්ෂණය කිරීම.
- නව ජීවන නිවාස වැඩසටහන සහ ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා ජලය, මාර්ග සහ විදුලි සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- නව ජීවන නිවාස වැඩසටහන් වලට අදාළ ණය වාරික අයකර ගැනීම.
- තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ ඇති, හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය සහ ප්‍රජා ශක්ති (E–kios) සංවර්ධන මධ්‍යස්ථාන යනාදියෙහි සමස්ථ අධීක්ෂණය.
- විදේශ ආධාර යටතේ හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීම, නියාමනය කිරීම හා ප්‍රගතිය අනුව ගෙවීම නිර්දේශ කිරීම.
- ඉදිකිරීම් හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ප්‍රගති වාර්තා හා ප්‍රසම්පාදන වාර්තා ඉදිරිපත් කිරීම.

❖ ඉහත කර්තව්‍යයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු අංශය මෙන්ම සැළසුම් අංශය ද සංවර්ධන අංශයට සහාය දක්වනු ලබයි.

**සැලසුම් අංශය**

❖ වැවිලි ප්‍රජාවේ උන්නතිය සඳහා වූ ප්‍රතිපත්ති හා වැඩසටහන් හඳුනාගැනීම හා වතු නිවාස අංශයේ ක්‍රියාකාරී සැළැස්ම සැකසීම.

❖ සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරයෙන් වෙන් කරවා ගැනීම.

❖ සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී සහාය ලබාදීම හා ප්‍රජා යටිතල පහසුකම් අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම සැකසීම.

❖ ප්‍රගති වාර්තා පිළියෙළ කිරීම හා සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

❖ ප්‍රජා යටිතල පහසුකම් අංශයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රාග්ධන ඇස්තමේන්තු සැකසීම.

❖ නව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම හා ව්‍යාපෘති යෝජනා සැකසීම.

❖ ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම.

- ❖ යෝජිත ව්‍යාපෘති ගෙන්වා ගැනීම, ඒ අතුරින් සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම, ශක්‍යතා ඇගයීම, ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම, ක්ෂේත්‍ර නිරීක්ෂණ, ප්‍රගති සමාලෝචනය, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය ඇතුලත් ප්‍රගති වාර්තා සැකසීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම .
- ❖ ග්‍රාමීය ප්‍රදේශ වල ජීවනෝපාය සහ මූලික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අදාළ ආයතන සම්බන්ධීකරණය හා පහසුකම් සැළසීම.
- ❖ වතු ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳ තොරතුරු යාවත්කාලීන කොට පවත්වා ගෙන යාම.
- ❖ වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සළසන නිලධාරීන් හා ප්‍රජා ශක්ති නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු හා දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම.
- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිම.
- ❖ වතු නිවාස අංශයේ සංවර්ධන වැඩසටහන් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
- ❖ වාර්ෂික සංවර්ධන සැළැස්ම සකස් කිරීම.
- ❖ තිරසාර සංවර්ධන ඉලක්ක පදනම් කරගත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.
- ❖ ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් සඳහා වතු නිවාස අංශය වෙනුවෙන් නියෝජනය කිරීම.

**ගිණුම් අංශය**

- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබාදීම, වැටුප් හා දීමනා ගෙවීම, සංවර්ධන ක්‍රියාවලියන්ට අදාළ ගෙවීම් කිරීම, නඩත්තු කටයුතු ආදී රාජ්‍ය අරමුදල් මගින් සිදු කරනු ගෙවීම් සම්බන්ධ සියළු කටයුතුවල වගකීම ගිණුම් අංශය මගින් දරනු ලබයි.
- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශයේ විෂය පථයට අයත් අංශ හා ආයතනවල මූල්‍ය කළමනාකරණය.
- ❖ ප්‍රසම්පාදන සැළැස්ම සකස් කිරීම හා කළමනාකරණය.
- ❖ වත්කම් කළමනාකරණය.
- ❖ මූල්‍ය කළමනාකරණය සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම.
- ❖ මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධ පුහුණු හා සංවර්ධන කටයුතු
- ❖ විගණනයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

**අභ්‍යන්තර විගණන අංශය**

- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශයේ මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳව ඇගයීම් සිදු කරමින් අඩුපාඩු වැලැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරීක්ෂාවන්හි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ ඇගයීමකට ලක් කිරීම.
- ❖ වාර්ෂික ප්‍රතිපාදන මත ඉටු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රගතිය නිශ්චය කිරීමට සහායවීමත්, ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අදාළ කරුණු අනාවරණය කිරීමත්, වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීමත්, විගණන විමසුම් මගින් පෙන්වා දුන් කරුණු නිවැරදි කර ගැනීමත්, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම.

- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම් කිරීම හා ප්‍රජා යටිතල පහසුකම් අංශය මගින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති මෙන්ම ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අනෙකුත් ක්‍රියාකාරකම් පිළිබඳ විගණන නිරීක්ෂණ මහාභාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමත් අභ්‍යන්තර විගණන අංශය විසින් මූලික වශයෙන් ඉටු කරනු ලබයි.
- ❖ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් 2024.03.26, 2024.07.03 සහ 2024.10.11 යන දිනයන්හි පවත්වා ඇත.
- ❖ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව 15 ක් වන අතර විශේෂ විමර්ශන කටයුතු සංඛ්‍යාව 4කි.

**ඉංජිනේරු අංශය**

- ❖ ගෘහ නිර්මාණ හා සැලසුම් සහ (Architectural & Design Drawings) සඳහා අනුමැතිය ලබා දීම.
- ❖ පිරිවිතරයන් හා ඇස්තමේන්තුවලට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ❖ විවිධ අරමුදල් ප්‍රභවයන් හරහා ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම හා උපදේශන සේවාවන් සැපයීම.
- ❖ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- ❖ තාක්ෂණික ඇගයීම් කමිටු හා තාක්ෂණික විගණනයන් වලට සහභාගී වීම.
- ❖ ඉදි කිරීම් ව්‍යාපෘති වලට නව ක්‍රමවේදයන් හඳුන්වාදීම.
- ❖ ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම.
- ❖ විදේශ ආධාර යටතේ ක්‍රියාත්මකවන ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීම හා ඇස්තමේන්තු සැකසීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්ක**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල(රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් (දේශීය ) | 3,406.57 |
| 02 | ප්‍රාග්ධන වියදම් (විදේශීය) | 5,961.32 |
| 03 | පුනරාවර්තන වියදම් | 694.45 |
| | **එකතුව** | **10,062.34** |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | වතු නිවාස වැඩසටහන (අඩක් ඉදිකරන ලද නිවාස සම්පූර්ණ කිරීම) (දේශීය අරමුදල්) | නිවාස ඒකක | 387 | 923.65 |
| 02 | වතු නිවාස වැඩසටහන (ආපදාවට ලක්වූ පවුල් සඳහා) (දේශීය අරමුදල්) | නිවාස ඒකක | 200 | 840.00 |
| | **වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය** | | | |
| | 3.1 වහළ සෙවිලි කිරීම | පේලි කාමර ඒකක | 375 | 62.00 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | 3.2 ළමා සංවර්ධන මධ්‍යස්ථාන නවීකරණය කිරීම. | මධ්‍යස්ථාන ගණන | 40 | 56.00 |
| | 3.3 පොදු සනීපාරක්ෂණ පහසුකම් ලබා දීම. | වැසිකිලි ඒකක | 180 | 30.00 |
| | 3.4 මාර්ග සංවර්ධනය කිරීම. | සංවර්ධනය කරන ලද කි.මී.සංඛ්‍යාව | 6.5 | 108.00 |
| | 3.5 ක්ෂේත්‍ර විවේකාගාරය වැඩි දියුණු කිරීම | ඒකක | 25 | 35.00 |
| | 3.6 ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම. | ව්‍යාපෘති සංඛ්‍යාව | 10 | 10.00 |
| | 3.7 ආගමික ස්ථාන වැඩි දියුණු කිරීම. | ව්‍යාපෘති සංඛ්‍යාව | 20 | 20.00 |
| | 3.8 ජීවනෝපාය සංවර්ධනය | ව්‍යාපෘති සංඛ්‍යාව | 245 | 49.00 |
| | 3.9 තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන් | ශිෂ්‍යයන් සංඛ්‍යාව | 300 | 20.00 |
| | 3.10 පාසල් පන්ති කාමර ප්‍රතිසංස්කරණය | පන්ති කාමර සංඛ්‍යාව | 50 | 25.00 |
| | 3.11 පාසල්වලට පානීය ජල පහසුකම් ලබාදීම | පාසල් සංඛ්‍යාව | 20 | 20.00 |
| | 3.12 පාසල්වලට සනීපාරක්ෂක පහසුකම් ලබාදීම. | පාසල් සංඛ්‍යාව | 20 | 10.00 |
| | 3.13 ආපදා සහන ලබාදීම | - | - | 10.00 |
| | 3.14 වතු නිවාස සංගණනයක් පැවැත්වීම | ඒකක | ව්‍යාපෘති -1 | 45.00 |
| | 3.15 ඉඩම් හිමිකම් ලබාදීම. | ඒකක | ඉඩම් හිමිකම් 1,000 | |
| | 3.16 ඉඩම් හා නිවාස ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම. | ව්‍යාපෘති සංඛ්‍යාව | ව්‍යාපෘති-1 | |
| 04 | ඉන්දියානු නිවාස 10,000 වැඩසටහන (ඉන්දියානු ප්‍රදාන) | නිවාස ඒකක | 1,300 ඉදි කිරීම.<br>4,700 මූලික කටයුතු ආරම්භ කිරීම. | 3,740.00 |
| 05 | ඉන්දියානු නිවාස 10,000 වැඩසටහන - යටිතල පහසුකම් ලබාදීම. (දේශීය අරමුදල්) | නිවාස ඒකක | 1,300 | 643.40 |
| 06 | සුහුරු පන්ති කාමර පිහිටුවීම සඳහා උපකරණ සැපයීම. (ඉන්දියානු ප්‍රදානය) | සුහුරු පන්ති කාමර සංඛ්‍යාව | 60 | 508.20 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | සුහුරු පන්ති කාමර පිහිටුවීම සඳහා ප්‍රතිසංස්කරණ කටයුතු (දේශීය අරමුදල්) | සුහුරු පන්ති කාමර සංඛ්‍යාව | 60 | 115.80 |
| 08 | රු. බිලියන 03 වැඩසටහන - (ඉන්දියානු ප්‍රදාන) | - | - | 546.23 |
| 09 | රු.බිලියන 03 ක වැඩසටහන (දේශීය අරමුදල්) | - | - | 82.26 |
| 10 | ඔප්පු සකස් කිරීම සඳහා පහසුකම් සැලසීම. | - | - | 80.50 |
| 11 | ආදර්ශ ගම්මානයක් (Model Village) පිහිටුවීම. | - | - | 12.50 |
| 12 | වැවිලි ප්‍රජාව සඳහා නිවාස සහ ඉඩම් ලබා දීමේ ප්‍රතිපත්තිය අධ්‍යයනය කර ස්ථාපිත කිරීම. | - | - | 10.00 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 7,060.61 | 859.00 | 12% |
| 02 | පුනරාවර්තන වියදම් | 537.87 | 490.94 | 91% |
| | **එකතුව** | **7,598.48** | **1,349.94** | **18%** |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | වෙන් කළ මුදල (රු.මි.) | වැය කළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **වතු නිවාස වැඩසටහන (නව ජීවන නිවාස ව්‍යාපෘතිය)** | | | |
| නිවාස ඉදි කිරීම.<br>නිවාස යෝජනා ක්‍රමය සඳහා යටිතල පහසුකම් සැපයීම. | 500.00 | 427.06 | නිවාස 377 ක් ඉදි කිරීම් සම්පූර්ණ කර ඇත. |
| **ඉන්දියානු නිවාස වැඩසටහන** | | | |
| නිවාස 4,000 ක් ඉදි කිරීම. - ඉන්දියානු ප්‍රදානය | 200.00 | 186.31 | නිවාස 110 ක් ඉදි කිරීම් සම්පූර්ණ කර ඇත. |
| නිවාස 4,000 ක් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය - දේශීය අරමුදල් | 25.00 | 16.75 | නිවාස 80 කට විදුලි පහසුකම් හා නිවාස 50 කට ජල පහසුකම් ලබා දී ඇත. |
| නිවාස 10,000 ක් ඉදි කිරීම - ඉන්දියානු ප්‍රදානය | 3,600.00 | 496.69 | අත්තිවාරම් මට්ටම- නිවාස ඒකක 406<br>බිත්ති මට්ටම-ඒකක 35<br>වහළ මට්ටම-ඒකක 18<br>සම්පූර්ණ කළ නිවාස 05 |
| ඉන්දියානු අරමුදල් සහිත නිවාස සඳහා යටිතල පහසුකම් සංවර්ධනය - දේශීය අරමුදල් | 300.00 | 65.40 | |
| සුහුරු පන්ති කාමර 60 ක් පිහිටුවීම - ඉන්දියානු ප්‍රදානය (නුවරඑළිය , මහනුවර | 300.00 | 0.00 | මෙම ව්‍යාපෘතිය තවමත් ආරම්භ කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| සහ බදුල්ල ) | | | අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම අමාත්‍ය මණ්ඩලය වෙත මෙම ව්‍යාපෘතියේ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇත. |
| සුහුරු පන්ති කාමර පිහිටුවීම - දේශීය අරමුදල් | 10.00 | 0.00 | |
| **යටිතල පහසුකම් සංවර්ධනය** | | | |
| වතුකරයේ පවුල් සඳහා නිවාස 2,000 කට නිරවුල් ඔප්පු අංක සහිත ඉඩම් අයිතිය තහවුරු කිරීම. | 2,022.26 | 258.51 | වතු ක්ෂේත්‍රයේ පවුල් සඳහා ඔප්පු 1,081 ක් සකස් කර 716 ක් භාර දී ඇති අතර, ඉතිරි ඔප්පු සකස් කරමින් පවතී. |
| ජල සැපයුම් ව්‍යාපෘති 15 ක් නිම කිරීම.සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ ව්‍යාපෘති 2 ක් නිම කිරීම. විදුලි සැපයුම් ව්‍යාපෘති 1 ක් නිම කිරීම. | | | ජල ව්‍යාපෘති 02 ක් අවසන් කර ඇති අතර, අනෙක් ඒවා ක්‍රියාත්මක වෙමින් පවතී. (ව්‍යාපෘති 03 ක් 95% ක් අවසන් කර ඇත, ව්‍යාපෘති 3 ක් 75% ක් අවසන් කර ඇත.) |
| සංස්කෘතික මධ්‍යස්ථාන 595 ක් ප්‍රතිසංස්කරණය කිරීම. | | | ආගමික ව්‍යාපෘති 115 ක් අවසන් කර ඇත. |
| වතුකරයේ ආපදාවට ලක්වූ ජනතාව සඳහා සෙවිලි තහඩු සැපයීම සහ සවි කිරීම. | | | සෙවිළි තහඩු 8,500 ක් ලබාදීම හා ලයින් කාමර 03 ක් සෙවිළි කිරීම.<br>ලයින් කාමර 03 ක වහල අලුත් වැඩියා කිරීම අවසන් කර ඇත. |
| වතුකරයේ පාසල් සඳහා පන්ති කාමර පහසුකම් සැපයීම. පාසල් සඳහා තාක්ෂණික ඉගැන්වීම් උපකරණ ලබා දීම. STEM ගුරු පුහුණුව පාසල් සංවර්ධන ව්‍යාපෘති | | | STEM ගුරු පුහුණුව අවසන් කර ඇත (ප්‍රතිලාභීන් 2,122 ක්)<br>පාසල් ව්‍යාපෘති 08 ක් අවසන් කර ඇත. |
| ක්‍රීඩා සංවර්ධනය<br>- ක්‍රීඩා පිටි<br>- ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබාදීම. | | | ක්‍රීඩාංගණ ව්‍යාපෘති 03 ක් අවසන් කර ඇත. |
| මාර්ග, පාලම් සංවර්ධනය | | | මාර්ග සහ පාලම් ව්‍යාපෘති 76 ක් අවසන් කර ඇත. |
| පොදු පහසුකම් | | | පොදු පහසුකම් ව්‍යාපෘති 08 ක් අවසන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (සනීපාරක්ෂක හා මාතෘ කට්ටල ලබා දීම.) | | | වැසිකිළි 07 ක් ඉදිකිරීම අවසන් කර ඇත. |
| ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය<br>- තරුණ සමුළුව<br>- ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති | | | තරුණ සමුළුව ව්‍යාපෘතිය අවසන් කර ඇත. |
| **යටිතල පහසුකම් සංවර්ධනය (රු 100 මිලියන)** | | | |
| වතු තරුණ තරුණියන්ට විරැකියාවෙන් මිදීම සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම.<br>- පාඨමාලා සඳහා ආහාර<br>- පාඨමාලා ද්‍රව්‍ය<br>- ජාතික වෘත්තීය නිපුණතාව (NVQ) සඳහා පුහුණුවන්නන් සඳහා ඇගයීම් | 21.00 | 13.92 | ප්‍රතිලාභීන් 208 ක් සඳහා |
| 2023 අතැති බිල්පත් | 2.58 | 3.69 | - |
| 2023 යටිතල පහසුකම් අඛණ්ඩ ව්‍යාපෘති | 2.18 | | |
| පානීය ජල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් නොමැති ලයින් නිවාස සහ වතුකරයේ පාසල් සඳහා පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා දීම. | 8.44 | 0.37 | ව්‍යාපෘති 01 ක් සම්පූර්ණ කර ඇත. |
| වතු ජනතාව සඳහා ආගමික හා සංස්කෘතික පහසුකම් සහතික කිරීම. (මධ්‍යස්ථාන 105) | 32.00 | 27.64 | ව්‍යාපෘති 97 ක් සම්පූර්ණ කර ඇත. |
| විශේෂ අවශ්‍යතා | | | |
| ආපදාවලින් විපතට පත් වතු ජනතාවට සහන සේවා සැපයීම. | 6.00 | 0.83 | ගාල්ල සහ කලුතර දිස්ත්‍රික්කවල වැඩසටහන් 02 ක් සම්පූර්ණ කර ඇත. (ප්‍රතිලාභීන් 139) |
| මාර්ගය | 5.00 | - | |
| ක්‍රීඩා ක්‍රියාකාරකම්, ක්‍රීඩා පිටි සහ පාසල් සංවර්ධනය | 15.50 | 2.77 | |
| හැඳුනුම්පත් උප්පැන්න සහතික නිකුත් කිරීම. | 0.30 | 0.17 | |
| ප්‍රජා සවිබල ගැන්වීම සහ ජීවනෝපාය සංවර්ධනය රැකියා විරහිත වතු ජනතාවට ස්වයං රැකියා සඳහා පහසුකම් සැලසීම. (පවුල් 25 ක් සඳහා එළුවන් සහ කුකුළන් ලබාදීම.) | 5.00 | 4.71 | ව්‍යාපෘති 01 ක් සම්පූර්ණ කර ඇත. |
| වැවිලි අංශයේ සියලුම ප්‍රතිලාභීන් සඳහා දත්ත සමීක්ෂණය | 2.00 | - | - |

## ❖ 2025 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

### ❖ වතු නිවාස වැඩසටහන යටතේ අඩක් නිම කළ නිවාස සම්පූර්ණ කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 387 ක් 2025 වර්ෂයේ සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර ඇත. ඊට අමතරව 2025 වර්ෂයේ දී මෙම වැඩසටහන යටතේ ආපදාවන්ට ලක් වූ පවුල් 200 ක් සඳහා නව නිවාස ලබා දීමට සැලසුම් කර ඇත.

### ❖ ඉන්දියානු නිවාස 10,000 වැඩසටහන (ඉන්දියානු ප්‍රදාන සහ දේශීය අරමුදල්) යටතේ නිවාස ඉදි කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ ඉදි කිරීමට අපේක්ෂිත නිවාස ඒකක 10,000 න් නිවාස ඒකක 1,300 සඳහා ඉඩම් නිදහස් කර ගෙන නිවාස අත්තිවාරම් මට්ටමේ සිට අදියර මට්ටමින් (වැඩ කරමින් පවතී.) (අත්තිවාරම් මට්ටම - 399, බිත්ති මට්ටම - 27, වහළ මට්ටම - 9). ඒ අනුව 2025 වර්ෂයේ දී මෙම නිවාස ඒකක 1,300 සම්පූර්ණ කිරීමත් තව නිවාස 4,700 ක වැඩ ආරම්භ කිරීමටත් නියමිතය.

### ❖ වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

වැවිලි මානව සංවර්ධන භාරය / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම හරහා අප වෙත ඉදිරිපත් කරන වතු ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය හා වෙනත් විශේෂ හඳුනාගන්නා ලද ව්‍යාපෘති යෝජනා ලැබී ඇති ප්‍රතිපාදන ද සැළකිල්ලට ගෙන 2025 වර්ෂයේ දී සිදු කිරීමට සැලසුම් කර ඇත.

### ❖ සුහුරු පන්ති කාමර පිහිටුවීම සඳහා උපකරණ සැපයීම.

සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීමට නුවරඑළිය, මහනුවර හා බදුල්ල දිස්ත්‍රික්කවල තෝරාගත් පාසල්වල ප්‍රතිසංස්කරණ කටයුතු ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන තුළින් සිදු කරන අතර, සුහුරු පන්ති කාමර පිහිටුවීම සඳහා උපකරණ සැපයීම ඉන්දියානු ප්‍රදානය හරහා සිදු කෙරේ. 2025 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙන් කර ඇති ප්‍රතිපාදන තුළ සිදු කිරීමට බලාපොරොත්තු වේ.

### ❖ රු.බිලියන 03 ක වැඩසටහන

මෙම ව්‍යාපෘතියට සමගාමීව පහත ව්‍යාපෘති 04, 2025 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට සහභාගී වන අවුරුදු 05 ට අඩු දරුවන්ගේ පෝෂණය වැඩි දියුණු කිරීම.
- වැවිලි ප්‍රජාවට වතු සෞඛ්‍ය සේවා පහසුකම් මධ්‍යස්ථාන (Cluster Hospitals) 10 ක් ලබාදීම.
- එක්ව හෙටක් ගොඩනැගීම: ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවන්හි ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.
- ගල්කිස්ස පාක්කියම් ජාතික විද්‍යාලය සඳහා ශ්‍රවණාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

### ❖ ඔප්පු සකස් කිරීම සඳහා පහසුකම් සැලසීම.

නව ගම්මාන සංවර්ධන අධිකාරිය විසින් ඔප්පු සකස් කිරීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් 2025 වර්ෂයේ දී ක්‍රියාකාරකම් රැසක් සිදු කිරීමට සැලසුම් කර ඇත.

### ❖ ආදර්ශ ගම්මානයක් (Model Village) පිහිටුවීම.

නව ගම්මාන සංවර්ධන අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය සිදු කිරීමේ අරමුණ වන්නේ, ජනතාවට උසස් ජීවන මට්ටමක්, සෞඛ්‍ය සේවා, අධ්‍යාපන පහසුකම් සහ පරිසර හිතකාමී යාන්ත්‍රණයක් ලබා දීමයි.

- **වැවිලි ප්‍රජාව සඳහා නිවාස සහ ඉඩම් ලබාදීමේ ප්‍රතිපත්තිය අධ්‍යයනය කර, ස්ථාපිත කිරීම .**

නව ගම්මාන සංවර්ධන අධිකාරිය මඟින් වතු කරයේ ජනතාව මුහුණ දෙන සුවිශේෂී අභියෝගවලට ගැළපෙන පරිදි සකස් කරන ලද විස්තීර්ණ නිවාස ප්‍රතිපත්තියක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

# වැවිලි මානව සංවර්ධන භාරය

**දැක්ම**

වතුකරයේ ජීවන තත්ත්වය අඛණ්ඩව ඉහළ නැංවීම සඳහා තිරසාර සංවර්ධන වැඩසටහන් සපයමින් ප්‍රමුඛ මානව සංවර්ධන විශිෂ්ට සංවිධානය වීම

**මෙහෙවර**

- ❖ වතුකරයට සහ ඒ අවට ප්‍රදේශවලට ප්‍රයෝජනවත් වන ඒකාබද්ධ සේවා සැපයීම.
- ❖ සමාජ ආර්ථික හා අධ්‍යාත්මික යහ පැවැත්ම දියුණු කිරීම.
- ❖ දැනුම සහ ආත්ම විශ්වාසය දියුණු කිරීම.
- ❖ වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂිත මානයන් දියුණු කිරීම.
- ❖ ප්‍රතිලාභීන්ගේ කුසලතා සහ හැකියාවන් දියුණු කිරීම.
- ❖ අංශයේ ඵලදායීතාව දියුණු කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්කය**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල(රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 1,149.00 |
| 02 | පුනරාවර්තන වියදම් | - |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | නිවාස ව්‍යාපෘති | නිවාස සංඛ්‍යාව | 397 | 765.00 |
| 02 | ජල ව්‍යාපෘති | ජල ව්‍යාපෘති සංඛ්‍යාව | 16 | 124.00 |
| 03 | ජල ව්‍යාපෘති (ඉන්දීය නිවාස) | ජල ව්‍යාපෘති සංඛ්‍යාව | 46 | 260.00 |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | 2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් - (නිවාස ව්‍යාපෘති) | 302.00 | 220.00 | 73% |
| 02 | පුනරාවර්තන වියදම් - (ජල ව්‍යාපෘති) | 104.00 | 26.00 | 25% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | වෙන්කළ මුදල(රු.මි.) | වැයකළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| නිවාස ව්‍යාපෘති | 302.00 | 220.00 | 80% |
| ජල ව්‍යාපෘති | 104.00 | 26.00 | 35% |

# සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම

**දැක්ම**

ශ්‍රී ලාංකිකයන්ගේ ආගමික, ආර්ථික, සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, සෞන්දර්යාත්මක වෘත්තීය සහ භෞතික සංවර්ධනය නඟා සිටුවීම සහ ප්‍රවර්ධනය කිරීම, විශේෂයෙන්ම සේවය නොලබන, සහ වරප්‍රසාද ලත් ග්‍රාමීය ප්‍රජාවට ස්වයං රැකියා අවස්ථා ලබාදීම.

**මෙහෙවර**

සියලුම ශ්‍රී ලාංකීය ප්‍රජාවන් අතර සාමය, සුහදතාවය, අවබෝධය සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ මෙම ක්‍රියාවලියේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් පුළුල් ලෙස යෙදීමෙන් සහ භාවිතා කිරීමෙන් ග්‍රාමීය ප්‍රජාවගේ විස්තීර්ණ, සම්පූර්ණ සහ සමස්ත සමාජ ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම.

**අරමුණු**

- ❖ ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාව අතර සාමය, හොඳහිත, අවබෝධය සහ සහයෝගීතාවය ප්‍රවර්ධන කිරීම.
- ❖ ජාතීන් අතර එකමුතුකම සහ සමාජ සංකලනය ප්‍රවර්ධනය කිරීම හා ධෛර්යමත් කිරීම.
- ❖ ශ්‍රී ලාංකිකයන්ගේ ආගමික, අධ්‍යාපනික, වෘත්තීය, සමාජ, දේශපාලන, ආර්ථික, සෞන්දර්යාත්මක හා භෞතික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- ❖ ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික, සංස්කෘතික, සමාජයීය හා සෞන්දර්යාත්මක ක්ෂේත්‍රවල දැනීම හා අවබෝධය නංවාලීම.
- ❖ ආර්ථික වශයෙන් හා සමාජයීය වශයෙන් අවාසියට ලක් වූ යම් තැනැත්තකුගේ වාසස්ථාන වැඩිදියුණු කිරීම. උචිත බැංකුවල හා මූල්‍ය ආයතනවල ආයෝජනය කිරීමට ශ්‍රී ලාංකිකයන් ධෛර්යමත් කිරීම සහ යටිතල පහසුකම් සැපයීම ද ඇතුළුව ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.
- ❖ පදනමේ පරමාර්ථ කිසිවකට සමාන යම් කටයුත්තක නිරතව සිටින යම් තැනැත්තෙකුට මූල්‍ය හෝ වෙනත් ආධාර සැපයීම.
- ❖ ශ්‍රී ලංකාව තුළ හා විදේශයන්හි ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික, සංස්කෘතික සහ සාමාජයීය ක්ෂේත්‍ර පිළිබඳව, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
- ❖ ශ්‍රී ලාංකිකයන්ගේ ක්‍රීඩා හා විනෝදාංශ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්කය**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල(රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 15.00 |
| 02 | පුනරාවර්තන වියදම් | 130.00 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | සිසුන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම. | සිසුන් සංඛ්‍යාව | 300 | 28.00 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | පාපන්දු, ක්‍රිකට්, වොලිබෝල් හා නෙට්බෝල් ක්‍රීඩා තරඟ සඳහා නෝර්වුඩ් ක්‍රීඩාංගණය කුලියට ලබා දීම. | පවත්වනු ලබන තරඟ සංඛ්‍යාව | 24 | 0.646 (ආදායම්) |
| 03 | හෙලිකොප්ටර් ගොඩබෑම සඳහා ක්‍රීඩාංගණය කුලියට දීම. | හෙලිකොප්ටර් ගොඩ බෑම සිදුකරන වාර ගණන | 48 | 0.290 (ආදායම්) |
| 04 | උත්සව සඳහා සංස්කෘතික මධ්‍යස්ථානයේ ඇති ශාලාව කුලියට දීම. | කුලියට දෙනු ලබන වාර ගණන | 60 | 0.992 |
| 05 | සිසුන් සඳහා භරත නාට්‍යම් සහ කර්ණාටක සංගීතය පුහුණුව ලබා දීම. | සිසුන් සංඛ්‍යාව | 260 | - |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | වැඩසටහන | **2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)** | **2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.)** | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 15.00 | 13.50 | 96% |
| 02 | පුනරාවර්තන වියදම් | 125.00 | 107.00 | 86% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන්කළ මුදල (රු.මි.) | වැයකළ මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | එළවන් බෙදාදීම | 3.50 | 4.70 | 100% |
| ක්‍රීඩා සංවර්ධන වැඩසටහන | වතුකරයේ පාපන්දු සමාජවල කුසලතා වර්ධනය කිරීම. | 1.19 | 0.37 | 100% |
| පුහුණු පාඨමාලා | විද්‍යා හා තාක්ෂණවේදය, ඉංග්‍රීසි හා ගණිතය යන විෂයන් පිළිබඳ වතුකරයේ ගුරුවරුන් පුහුණු කිරීමේ පාඨමාලාව | 24.00 | 9.20 | 100% |

# වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය

**දැක්ම**

වැවිලි ප්‍රජාව බලගැන්වීමේ ප්‍රමුඛයා වීම

**මෙහෙවර**

ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් වැවිලි ප්‍රජාවගේ සමාජ හා ආර්ථිකය ගොඩනැංවීම සඳහා සියලු පාර්ශ්වකරුවන් එක් කරන වේදිකාවක් වෙමින් අවශ්‍ය ප්‍රතිපත්ති හා සැළසුම් සකස්කොට ක්‍රියාත්මක කිරීම.

**අරමුණු**

- ❖ වැවිලි ප්‍රජාවගේ සමාජ පිළිගැනීම සහතික කිරීම.
- ❖ ආර්ථික වශයෙන් තිරසාර වැවිලි ප්‍රජාවක් නිර්මාණය කිරීම.
- ❖ ප්‍රජාවට වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා ආයතනයෙහි ධාරිතාව සහ කාර්යන් ශක්තිමත් කිරීම.

- **2025 වර්ෂයේ මූල්‍ය ඉලක්කය**

| අනු අංකය | වැඩසටහන | ඇස්තමේන්තු මුදල (රු.මි.) |
|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 81.00 |
| 02 | පුනරාවර්තන වියදම් | 10.00 |

- **2025 වර්ෂයේ භෞතික ඉලක්ක (ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘති)**

| අනු අංකය | වැඩසටහන | මිනුම් ඒකකය | ඉලක්කය | මුළු පිරිවැය (රු.මි.) |
|---|---|---|---|---|
| 01 | වතු නිවාසලාභින් සඳහා ඉඩම් ඔප්පු ලබා දීම. | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1,000 | 25.00 |
| 02 | මහජන සේවාවන් වතු ප්‍රදේශයන්ට ළඟා කරදීම සඳහා පහසුකම් සැපයීම. (උප්පැන්න සහතික/ හැඳුනුම්පත්/ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා දිවා ආහාර සැපයීම.) | ප්‍රතිලාභින් සංඛ්‍යාව | 1,000 | 5.00 |
| 03 | වතු පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම. | වතු පාසල් සංඛ්‍යාව | 10 | 10.00 |
| 04 | නිවාස හා ඉඩම් ප්‍රතිපත්තියක් සැකසීම. | ඉඩම් හා නිවාස අහිමි සියලුම වතු පවුල් | | 7.50 |
| 05 | වතු නිවාස පිළිබඳ දත්ත සමීක්ෂණය | ක්‍රියාකාරකම් සංඛ්‍යාව | සියලු වතු ප්‍රදේශ | 10.00 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | වතු ප්‍රදේශයන්හි පශු සම්පත් සංවර්ධනය | සත්ව ගොවි පළවල් සංඛ්‍යාව | 05 | 10.00 |
| 07 | වතු ප්‍රදේශයන්හි ආකෘතිමය වතු ගම්මානයක් පිහිටුවීම. | පවුල් සංඛ්‍යාව | 300 | 12.50 |
| 08 | මූල්‍ය සාක්ෂරතාවයක් පිළිබඳ දැනුවත් කිරීම. | පවුල් සංඛ්‍යාව | 1,000 | 1.00 |
| | **එකතුව** | | | **81.00** |

- **2024.12.31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | විස්තරය | **2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)** | **2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 2.00 | 1.99 | 100% |
| 02 | පුනරාවර්තන වියදම් | 13.00 | 7.38 | 57% |
| | | 5.00 | 5.00 | 100% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය**

| අනු අංකය | විස්තරය | **2024 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)** | **2024.12.31 දක්වා වියදම් කළ මුදල (රු.මි.)** | **මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| 01 | ප්‍රාග්ධන වියදම් | 1.50 | 1.49 | 99.3% |
| 02 | පුනරාවර්තන වියදම් | 22.60 | 20.49 | 90.66% |

- **2024.12.31 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය**

| අනු අංකය | ව්‍යාපෘතිය / වැඩසටහන | අරමුණ / උපායමාර්ග | වෙන්කළ මුදල (රු. මි.) | සත්‍ය වියදම (රු. මි.) | භෞතික ප්‍රගතිය | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 01 | වතු ප්‍රජාව සඳහා ඉඩම් හිමිකම ලබාදීම. | වතු ප්‍රජාව සඳහා ඉඩම් අයිතිය ලබාදීම තුළින් එම ප්‍රජාවගේ සමාජ පිළිගැනීම සහතික කිරීම. | 22.61 | 20.40 | ඔප්පු 1,083 කි. (44%) | වාර්ෂික ඉලක්කය ඔප්පු 2,445 |
| 02 | වතු ප්‍රජාව සඳහා නිවාස සහ ඉඩම් ප්‍රතිපත්තිය ක් සකස් කිරීම. | ඉඩම් හා නිවාස හිමිකම් නොමැති වතු පවුල් හඳුනාගනිමින් ඉඩම් හා නිවාස ලබාදීමේ දී සිදුවිය හැකි ද්විකරණය වැළැක්වීම. | 1.54 | 0.00 | ජංගම දුරකථන මෘදුකාංගයක් හඳුන්වා දී ඇත. දත්ත සමීක්ෂණය සම්බන්ධයෙන් පුහුණු කිරීම් ආරම්භ කර ඇත. (මේ දක්වා අත්පත් කරගත් ප්‍රගතිය 40% | |

- **2025 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්**

❖ **වැවිලි අංශය සඳහා නිවාස ප්‍රතිපත්තියක් සැකසීම**
නව ගම්මාන සංවර්ධන අධිකාරිය (NEVIDA) වතුකාර්ය මුහුණ දෙන සුවිශේෂී අභියෝගවලට ගැළපෙන පරිදි සකස් කරන ලද විස්තීර්ණ නිවාස ප්‍රතිපත්තියක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. 2025 සඳහා වන නිවාස ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ වතු කම්කරුවන්ට හා ඔවුන්ගේ පවුල්වලට සුරක්ෂිත, තිරසාර හා ගෞරණීය ජීවන තත්ත්වයක් උදා කරලීමයි. මෙම ප්‍රත්පත්තියේ ප්‍රධාන කොටස් ලෙස 2015 න් පසු සහ 2015 ට පෙර රජයේ සහ රාජ්‍ය නොවන සංවිධාන සහයෝගිතා හරහා ඉදිකරන ලද නිවාස විධිමත්කරණයද ඇතුළත් වේ.

❖ **වැවිලි අංශය සඳහා මාර්ගගත දත්ත පද්ධතියක් සකස් කිරීම**
වතුකරයේ සංවර්ධන කටයුතු ඵලදායී ලෙස සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ශක්තිමත් මාර්ගගත දත්ත පද්ධතියක් ඉතා වැදගත් වේ. තිරසාර, අදාළ සහ නිවැරදි දත්ත නොමැතිකම නිසා ඔවුන් මුහුණ දෙන සමාජ ආර්ථික අභියෝගවලට විසඳුම් සෙවීමේ ප්‍රයත්නයන්ට බාධාවක් වී ඇත.

❖ **වැවිලි අංශයේ දරිද්‍රතාවය පහළ නැංවීමේ වැඩසටහන**
2025 දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන ආර්ථික, සමාජීය සහ අධ්‍යාපනික මැදිහත්වීම් හරහා වතුකරයේ ප්‍රජාවන් සවිබල ගැන්වීම කෙරෙහි අවධානය යොමු කරයි.

## ඉන්දියානු ආධාර යටතේ ඉදි වන නිවාස ව්‍යාපෘතිය

මෙය අදියරයන් තුනක් යටතේ ක්‍රියාත්මක වන අතර පළමු අදියර (Stage 01) හා දෙවන අදියර (Stage 02) යටතේ නිවාස ඒකක 4,000 ක් 2016.01.08 දිනැති කැබිනට් අනුමැතිය මත ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමඟ 2016.04.01 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම යටතේ ඉන්දියානු නිවාස වැඩසටහනේ පළමු අදියර හා දෙවන අදියර ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලයේ සෘජු අධීක්ෂණය යටතේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් තෝරාගත් ආයතනයන් හතරක් මගින් සිදු කරනු ලබයි. මෙහි තෙවන අදියර (Stage 03) යටතේ නිවාස ඒකක 10,000 ක් ක්‍රියාත්මක කරනු ලබයි.

එක් නිවසක වටිනාකම රුපියල් මිලියනයක් ලෙසට ඇස්තමේන්තුගත කර ඇති මෙම ව්‍යාපෘතියෙහි අදියර I සහ අදියර II සඳහා, නිවසක් වෙනුවෙන් ඉන්දියානු රජය විසින් රු. 2,800,000/= ක්ද, අදාල වැවිලි සමාගම විසින් රු. 75,000/= ක් හා ප්‍රතිලාභියා විසින් රු. 20,000 ක ශ්‍රම දායකත්වයක් සපයනු ලබයි. මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පානීය ජල පහසුකම්, විදුලිය, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ප්‍රථම අදියරෙහි නිවාස සඳහා එක් නිවාස ඒකකයකට රු. 120,000/= ක් හා එහි දෙවන අදියර සඳහා එක් නිවසකට රු. 300,000/= ක් වන ලෙසට ශ්‍රී ලංකා රජය මගින් ප්‍රතිපාදන සපයනු ලැබේ.

**ඉන්දියානු ආධාර යටතේ ඉදි වන නිවාස ව්‍යාපෘතිය**

**(අ) I පළමු හා II දෙවන අදියර (Stage I & II) - නිවාස 4,000**

**(ආ) III - තෙවන අදියර (Stage III) - නිවාස 10,000**

III වන අදියර යටතේ ඉන්දීය රජය විසින් නව නිවාස 10,000 ක් වැවිලි ප්‍රජාව වෙත ලබාදීමට එකඟ වී ඇත. එයට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය 2018.08.16 දින ලැබී ඇති අතර, ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සමඟ 2018.08.12 දින ඊට අදාල එකඟතා ගිවිසුමකට එළඹෙන ලදි. ඒ අනුව, බදුල්ල, හැටන්, නුවරඑළිය, නුවර, කෑගල්ල, රත්නපුර සහ ගාල්ල යන වතු කලාප හතේම වතු ප්‍රජාව සඳහා පියවර තුනකින් යුක්තව නිවාස ඒකක 10,000 ක් වතු ප්‍රතිලාභීන්ගේ මූලිකත්වයෙන් හා වතු සේවක සමුපකාර සමිති හරහා ඉදිකිරීමට සැලසුම් කර ඇත.